BOI
SRI LANKA

වාර්ෂික වාර්තාව
2023



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය



පටුන

සභාපතිතුමාගේ පණිවුඩය 02

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය 03

අධ්‍යක්ෂ මණ්ඩලය 04

ආයෝජන මණ්ඩලයේ පැතිකඩ 06

දැක්ම, මෙහෙවර සහ වටිනාකම් 07

ආයෝජන මණ්ඩලයේ ගමන් මග 08

ජාතික ආර්ථිකයට ආයෝජන මණ්ඩලයේ දායකත්වය 09

2023 වසරේ කාර්යසාධනය 12

ගෝලීය ආයෝජන ප්‍රවණතාව 2023 - 2024 19

සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රවර්ධනය කිරීම 21

- ප්‍රවර්ධන කාර්යයන් 22
- ජාත්‍යන්තර සමුළු සඳහා සහභාගිත්වය 25
- ජාත්‍යන්තර ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කිරීම 26
- ජාත්‍යන්තර හවුල්කරුවන් සමග කටයුතු කිරීම 27
- ආයෝජකයින්ගේ අදහස් 28
- ආයෝජකයින් ඇගයීම 31
- සුවිශේෂී සිදුවීම් 33

මානව ප්‍රාග්ධනය 36

සමාජ වගකීම 38

ආයෝජන මණ්ඩලයේ දෙපාර්තමේන්තුවල කාර්යසාධනය 39

මූල්‍ය සමාලෝචනය - 2023 46

ආයතනික පාලන වාර්තාව 48

මූල්‍ය ප්‍රකාශන 53

විගණකාධිපති වාර්තාව - 2023 91

විගණකාධිපති වාර්තාව සඳහා ආයෝජන මණ්ඩලයේ පිළිතුරු 103

විගණන කමිටු වාර්තාව 110

ආයෝජන මණ්ඩලය හා සම්බන්ධ විමසීම් 111

සභාපතිතුමාගේ පණිවුඩය



2023 වසරේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, විශේෂයෙන්ම 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා ශ්‍රී ලංකා රජයට මඟ සැළසීමේ ප්‍රයත්නයන්හි නිරත විය. ශ්‍රී ලංකාවේ ආර්ථික සහ භූදේශපාලනික කැළඹීම් මධ්‍යයේ රට යථා තත්ත්වයට පත්කිරීම සඳහා පියවර ගනු ලැබූ බැවින්, පසුගිය වසර පුරා ආයෝජන මණ්ඩලය පහසුකම් වැඩිදියුණු කිරීම්, අභ්‍යන්තර වැඩිදියුණු කිරීම් සහ අනුමැතින් ලබාදීම කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබීය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නව තොරතුරු සන්නිවේදන තාක්ෂණ සමාගම් 100ක් ආකර්ෂණය කිරීමේ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සහ සාර්ථක ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් 50ක් අරමුණු කරගත් ප්‍රතිආයෝජන දිරිමත් කිරීම් වැනි නව ව්‍යාපෘති කීපයක් ආරම්භ කර තිබේ. පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය ඇතිව හඳුනාගත් ප්‍රමුඛ අංශ සඳහා කර්මාන්ත උපදේශන කවුන්සිල පිහිටුවන ලදී. මූලික ආයෝජක සේවාවන් ඩිජිටල්කරණය කිරීමේදී (Digitization) සහ ප්‍රවර්ධන මාධ්‍යයන් වැඩිදියුණු කරන අතරම ජාත්‍යන්තර හරිත ප්‍රමිතීන් ළඟාකර ගැනීම සඳහා දැනට පවතින ආයෝජන කලාප නවීකරණය කිරීමේ අභ්‍යන්තර ක්‍රියාවලිය සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත.

මීට අමතරව, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද නියෝජිතායතනය (USAID), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ආසියා සහ ශාන්තිකර කලාප සඳහා වන එක්සත් ජාතින්ගේ ආර්ථික සහ සමාජ කොමිසම (UNESCAP) වැනි ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ ඵලදායි සහයෝගීතාවන්ට එළඹීම මගින් රට තුළ ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ආරම්භ කර ඇත.

ශ්‍රී ලංකාව ආයෝජන සඳහා ප්‍රධාන ගමනාන්තයක් ලෙස සහ තිරසාර සංවර්ධනයට ක්‍රියාකාරීව දායක වන කර්මාන්ත දිරිමත් කරන රටක් බවට පත්කිරීම සඳහා අපගේ කැපවීම වසර පුරා නොවෙනස්ව පැවතිණ. එසේම, ආර්ථික වර්ධනය සිදුකිරීම, නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සහ ව්‍යාපාර හිතකර පරිසරයක් ඇතිකිරීම සහ ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන ශක්තිමක් කිරීම සඳහා ආයෝජන මණ්ඩලයට පැවරී ඇති වගකීම ඉටුකිරීම සඳහා අපි කැප වී සිටින්නෙමු.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අනාගතයට සූදානම් ආයතනයක් බවට පරිවර්තනය කිරීමේ දැක්ම ඇතිව අප අනාගතය දෙස බලන බැවින්, ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම, නව ආයෝජන නිෂ්පාදන සහ ආයෝජන සඳහා සුදුසු පසුබිමක් හඳුන්වා දෙමින් මෙරට සන්නාමය වැඩිදියුණු කිරීම මගින් අපගේ වටිනාකම් ශක්තිමත් කරනු ඇත.

යෝජිත "Invest Sri Lanka" වැඩසටහන හරහා ආයෝජකයින් සඳහා වූ ව්‍යාපාරික පරිසරය සරල කිරීම මගින් රටේ ආයෝජන වාතාවරණය පරිවර්තනය කිරීම සඳහා මූලාරම්භය සපයයි. ආයෝජනයට පෙර සිට සහ ඉන් පසුවට ද විවිධ ක්ෂේත්‍ර හා අංශවල ප්‍රවීනයන් මගින් ආයෝජන චක්‍රය පුරාම ආයෝජකයින්ට පහසුකම් සැළසීමත් ඔවුන් ආරක්ෂාකර ගැනීමත් සඳහා සහය ලබා දෙනු ඇත.

අවසාන වශයෙන්, 2023 වසර ආයෝජන මණ්ඩලයට පැවරී ඇති වගකීම ඉටුකිරීම වෙනුවෙන් උපායමාර්ගික සහයෝගීතාවන් දිරිමත් කිරීම, ආයෝජන සඳහා පහසුකම් සැළසීම, නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම, රැකියා උත්පාදනය සහ සමස්ත ආර්ථික වර්ධනය ඇති කිරීම සමගින් ශ්‍රී ලංකාවේ ආර්ථික පරිවර්තනයෙහි කැපී පෙනෙන දායකත්වයක් ආයෝජන මණ්ඩලය විසින් දරණ ලදී.

දිනේෂ් වීරක්කොඩි

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය



2023 වසරේ පැවති අභියෝග හමුවේ ආර්ථිකය ස්ථාවරව දිශාගත කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ කැපවීම සැබවින්ම ප්‍රශංසනීය කරුණකි. ආයෝජකයන් සඳහා සීමාවෙන් එහා ගිය සේවාවක් සැලසීම සඳහා අපගේ මානව සම්පතෙහි ශක්තිය, කණ්ඩායම් හැඟීම, කාර්ය මණ්ඩලයේ නොසැලෙන ප්‍රයත්නයන් සහ කැපවීම මූලිකව හේතු වූ බව මා පවසන්නේ ආඩම්බරයෙනි. මානව සම්පත සංවර්ධනය සඳහා වූ අපගේ අඛණ්ඩ කැපවීම සහ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය, අභියෝග ජයගැනීම සහ ජයග්‍රහණය ළඟාකර ගැනීම සඳහා මූලික පදනම විය.

2022 දී ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ (WTC) ස්ථාපනය කරන ලද ආයෝජක පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය (IFC) සහ ආයෝජක පහසුකම් සම්බන්ධීකරණ කමිටුව (IFCC) අඛණ්ඩව පවත්වා ගැනීම මගින් ආයෝජකයින් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීමේ සහ ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැළසීම වෙනුවෙන් අපගේ කැපවීම පෙන්නුම් කරන ලදී. මෙම ප්‍රවේශය මගින් මෙහෙයුම් ක්‍රමවත් වූවා මෙන්ම ආයෝජකයින් සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට දායක වෙමින් ආයතන අතර සම්බන්ධීකරණය ද වැඩිදියුණු විය. ව්‍යවසායයන් 35ක් සඳහා පිළිගැනීමක් ලබාදීම වෙනුවෙන් ග්‍රීන් චැනල පහසුකම ලබාදීම මගින් විශිෂ්ඨ ක්‍රියාකාරිත්වයෙන් සහ අනුකූලතාවයෙන් යුත් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් ඇගයීමට ඇති ආයෝජන මණ්ඩලයේ කැපවීම පිළිබිඹු විය. ආයෝජන මණ්ඩලය සහ ව්‍යවසායයන් අතර අඛණ්ඩ අන්තර් සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා වැඩිදියුණු කළ ප්‍රවේශයක් ආරම්භ කළ අතර මේ සඳහා ආයෝජන මණ්ඩලයේ සේවාවන් සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය කැපවී කටයුතු කරන ලදී.

දැනට ක්‍රියාත්මක ආයෝජන මණ්ඩල නොවන ව්‍යවසායයන් ආයෝජන මණ්ඩලය යටතට ගැනීම සඳහා නව නියාමනයන් පිළිබඳව දැනුවත් කිරීම මගින් 2023 වසරේ දී නව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර මෙමගින් නව කර්මාන්තයන් කෙරෙහි ආයෝජන මණ්ඩලයේ බලපෑම තවදුරටත් පුළුල් කරන ලදී. තවද පසුකාලීනව පනවන ලද නීති මගින් වෙනත් අර්ථකතනයන් ලැබුණ ද ආයෝජන මණ්ඩලය සමග ඇතිකර ගත් ගිවිසුමේ සඳහන් සහනයන්හි වලංගු බව හා අඛණ්ඩ බව පිළිබඳව උපදෙස් ලබාදෙමින්, ආයෝජන මණ්ඩලය විශිෂ්ටත්වය කරා ගෙන යාමේ කාර්යභාරය දිරිමත් කරමින් ආයෝජක විශ්වාසය ශක්තිමත් කරන ලදී.

අඛණ්ඩව ආයෝජනය කිරීම සහ ව්‍යාපෘති පුළුල් කිරීම සඳහා මෙන්ම මෙරට ව්‍යාපාරික පරිසරය යථාතත්ත්වයට පත් කිරීමට සහ වර්ධනය කිරීමට කැපී පෙනෙන ලෙස දායක වී ඇති ආයෝජක ප්‍රජාවගේ විශ්වාසය සහ කැපවීම පිළිබඳව ප්‍රශංසාව පිරිනමමි. ආයෝජන මණ්ඩලය විසින් සපයන සේවාවන්හි සාර්ථකත්වය සාක්ෂාත් කර ගැනීමේ දී, ආදාල රේඛීය ආයතන අතර සහයෝගීතාවයෙන් කටයුතු කරමින් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරන ලදී.

ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකාවේ වෙළඳපල ප්‍රවේශය පුළුල් කිරීම අරමුණු කරගෙන UNESCAP, USAID, සහ ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ ආයෝජන මණ්ඩල ධාරිතා වැඩිදියුණු කිරීමේ සහ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීමේ හැකියාවන් අධ්‍යයනය කිරීම සහ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා සඳහා සහයවීමට ද පියවර ගෙන ඇත.

අපගේ ඉලක්ක සපුරා ගැනීමේ දී, හිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මූලිකව කටයුතු කරන ආයතනයක් ලෙස බාධාවන් අභිබවා යමින් වෙනස්කම්වලට අනුගතවීමේ ආයෝජන මණ්ඩලයේ හැකියාව පෙන්නුම් කරන ලදී. රටේ ආර්ථික වර්ධනයට මග සළසමින් ආයෝජකයින් සඳහා සුවිශේෂී සේවාවන් සහ සහයක් සැළසීම සහතික කරමින් ඉදිරි වසරවලදී ද අපගේ සාර්ථකත්වය අඛණ්ඩව තවදුරටත් ශක්තිමත් කිරීමේ ස්ථාවර දැක්ම ඇතිව කටයුතු කරන්නෙමු.

රේණුකා එම්. වීරකෝන්

අධ්‍යක්ෂ මණ්ඩලය



දිනේෂ් වීරක්කොඩි මහතා - සභාපති
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ සහ කොමර්ෂල් බැංකුවේ හිටපු සභාපතිවරයෙකු සහ ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ මින් පෙර සිටි සභාපතිවරයා ද, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ සංගමයේ උප සභාපතිවරයා ලෙස ද කටයුතු කරන ලද දිනේෂ් වීරක්කොඩි මහතා වර්තමානයේ ලංකා සේවක ෆෙඩරේෂනයේ උප සභාපති ධූරය දරයි. ඔහු සමාගම් කීපයකම අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කරයි.

වර්තමානයේ භාණ්ඩාගාර කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ උපදේශක ලෙස ක්‍රියා කරන විරක්කොඩි මහතා කොළඹ වරාය නගර ආර්ථික කොමිසමේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරයි. ඊට අමතරව ඔහු විසින් මීට පෙර ශ්‍රී ලංකා සේවක භාරකාර අරමුදල් මණ්ඩලයේ, ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලයේ සහ ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ සභාපතිත්වය ඇතුළුව මූලික තනතුරු කීපයක් දරා ඇත. තවද, ඔහු ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයාගේ, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යවරයාගේ සහ සංචාරක සංවර්ධන අමාත්‍යාවරයාගේ උපදේශකවරයෙකු ලෙස ද සේවය කරයි.



ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) විධායක අධ්‍යක්ෂවරිය වන ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, කලාපීය වෙළඳ ඒකාබද්ධතාව සහ ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව හා අදාල ක්ෂේත්‍ර ආවරණය කරන පර්යේෂණ සහ ප්‍රකාශන සඳහා දායකව ඇත. ඇය ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක වෙළඳ සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධානයන්හි උපදේශකවරියක ලෙස ශ්‍රී ලංකා රජය (GOSL) සඳහා උපදේශන සැපයීමේ කාර්යයන්හි නිරතවීම මගින් පුළුල් ක්ෂේත්‍රයක පළපුරුද්දක් ලබා ඇත. එසේම, මීට පෙර නේෂන්ස් ට්‍රස්ට් බැංකුව සහ කාගිල්ස් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නිරතව සිටි අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ පත් කළ සාමාජිකාවක මෙන්ම කාගිල්ස් (සිලෝන්) පීඑල්සීහි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරියක වශයෙන් කටයුතු කරනු ලබයි. එක්සත් රාජධානියේ බෙල්ෆාස්ට් ක්වීන්ස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ ගෞරව උපාධියක් ලබා ඇති දුෂ්නි වීරකෝන් මහත්මිය, එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය ද දර්ශනවේදී උපාධියද ලබාගෙන ඇත.



මනිල් ජයසිංහ මහතා

වරලත් ගණකාධිකාරිවරයෙකු වන මනිල් ජයසිංහ මහතා ශ්‍රී ලංකාවේ, මාලදිවයිනේ සහ භූතානයේ වසර 41ට වැඩි කාලයක් නිෂ්පාදන, සිල්ලර අලෙවි, ආගන්තුක සත්කාර, තොග වෙළඳාම සහ දුරකථන සන්නිවේදනය ඇතුළුව මූලික අංශ හරහා විගණනය, උපදේශන පිළිබඳ පළපුරුද්දක් ලබා ඇත. ඔහු 2021 සිට 2023 දක්වා ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ Ernst & Young සමාගමේ දේශීය කළමනාකරණ හවුල්කරුවකු, ශ්‍රී ලංකාවේ Assurance Practice හි ප්‍රධානියා මෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධානියා ලෙස ද කටයුතු කරනු ලැබීය. ශ්‍රී ලංකා ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයා වූ ඒ මහතා ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ කවුන්සිල සාමාජිකයෙකු සහ CIMA ශ්‍රී ලංකා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු, IFAC ජාත්‍යන්තර විගණන අධ්‍යාපන ප්‍රමිති මණ්ඩලයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩල සාමාජිකයෙකු, ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු CMA ශ්‍රී ලංකා කවුන්සිල සාමාජිකයෙකු සහ ලයිස්තුගත සමාගම්හි විගණන කමිටු සඳහා උපදේශකවරයෙකු ලෙස සේවය කර තිබේ. ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිති කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන ජයසිංහ මහතා ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය හුවමාරු කොමිසමේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සාමාජිකයෙකුද වේ. තවද, ඔහු Diesel and Motor Engineering PLC, Ceylon Hospitals PLC, C W Mackie PLC iy Sahasiya Investments Ltd. හි ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස ද ක්‍රියාකරයි.



එරාජ් ද සිල්වා මහතා

ශ්‍රී ලංකාවේ මහාධිකරණ සහ අභියාචනා අධිකරණ කටයුතුවල ක්‍රියාකාරීව නිරතව සිටින ජනාධිපති නීතිඥ එරාජ් ද සිල්වා මහතා වාණිජ සහ සිවිල් නඩු, මූලික අයිතිවාසිකම් සහ ව්‍යවස්ථාපිත නීතිය සම්බන්ධ ක්ෂේත්‍රයන්හි කටයුතු කරයි. මෑත කාලයේ ඔහු ජාතික වැදගත්කමකින් යුතු සැළකිය යුතු නඩු කීපයක් සඳහා ම පෙනී සිට ඇත.

2009 වසරේ සිට ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නීති සඟරාවේ (Law Journal) කර්තෘ මණ්ඩලයේ සේවය කර ඇති ඒ මහතා වර්තමානයේ එහි ප්‍රධාන සම කර්තෘවරයා වේ. මානසික සෞඛ්‍යය සඳහා වන "සහනය" ජාතික කවුන්සිලයේ සභාපතිවරයා වන ඔහු මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලයේ භාරකරුවකු වශයෙන් ද කටයුතු කරයි.

ලන්ඩනයේ Gray's Innහි අධිනීතිඥවරයෙක් වන ඒ මහතා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙන් නීති පශ්චාත් උපාධිය (LL.M) ලබාගෙන ඇත.



චාන්දනී විජයවර්ධන මහත්මිය

භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හිමි චාන්දනී විජයවර්ධන මහත්මිය, නෙදර්ලන්තයේ සංවර්ධන අධ්‍යයන ආයතනයෙන් පශ්චාත් උපාධිය ලබා ඇත. 1994දී ක්‍රමසම්පාදන ක්ෂේත්‍රයේ සහකාර අධ්‍යක්ෂවරියක ලෙස රාජ්‍ය සේවයට එක් වූ ඇය විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල සේවය කර ඇත. වසර 21 කට වැඩි කාලයක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වැනි මහ භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු කිපයකම සේවය කර ඇති අතර රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය සම්බන්ධයෙන් මනා පළපුරුද්දක් ලබා ඇත. 2015 වසරේ දී, සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් ධූරයට පත්වූ ඇය, අපනයන වැඩිදියුණු කිරීම සඳහා වෙළඳපල ප්‍රවේශ්‍රය පුළුල් කිරීමේ අරමුණ ඇතිව 2015-2019 කාලය තුළ ආරම්භයන් ගණනාවක් සිදු කළ, ආයෝජන සහ වෙළඳාම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ආයතනයක සේවය කිරීමේ අවස්ථාව උදාකර ගනු ලැබීය. මෙම කාලසීමාව තුළදී ඇයට ප්‍රමුඛ පෙළේ රටවල් සමඟ විස්තීර්ණ නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා ආරම්භ කිරීමේ දී සහ රට වෙනුවෙන් ජාතික අපනයන උපාය මාර්ග සම්පාදනයේ දී වෙසෙසින් දායක වීමට හැකි විය. අනතුරුව 2019 වසරේ දී ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශයේ ලේකම්වරිය ලෙස කටයුතු කරනු ලැබූ අතර වර්තමානයේ ඉහළම මට්ටමේ උපායමාර්ගික සැලසුම් සකස් කිරීමට මෙන්ම ජාතික මට්ටමේ තීරණ ගැනීම සඳහා මඟ සළසන ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස කටයුතු කරයි. මීට අමතරව, චාන්දනී විජයවර්ධන මහත්මිය ජනාධිපති ලේකම් කාර්යාලයේ මූලිකවම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, ජාත්‍යන්තර වෙළඳ කටයුතු, ආයෝජන සහ වෙළඳාම සඳහා පහසුකම් සැළසීම සහ අදාල ආයතනික ප්‍රතිසංස්කරණ මෙන්ම ආහාර ප්‍රතිපත්ති සම්බන්ධ කරුණු ආවරණය කරන උපායමාර්ගික කටයුතු අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරිය ලෙස ද කටයුතු කරයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පැතිකඩ

1978 වර්ෂයේදී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI), ආයෝජකයින් සහ ඔවුන්ගේ ව්‍යාපාර සඳහා සේවය සැපයීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාකිරීමේ වගකීම පැවරී ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය වේ. ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැළසීම, කාර්මික සංවර්ධනය දිරිමත් කිරීම සහ සහය සේවාවන් සඳහා ප්‍රවේශය ක්‍රමවත් කිරීම එහි කාර්ය භාරයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා වගකිව යුතු ප්‍රමුඛ ආයතනයක් වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, තිරසාර ආර්ථික සංවර්ධනය සඳහා අධාර වන සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීමේ දී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. නිපුණ සහ සුවිශේෂී රැකියා අවස්ථාවන් ඇති කිරීම සඳහා පහසුකම් සැළසීම, අපනයන සංවර්ධනය කිරීම සහ සමස්ත ආයෝජන වටපිටාව වැඩිදියුණු කිරීම මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, රටේ ආර්ථික වර්ධනය සඳහා කැපී පෙනෙන අයුරින් දායක වේ.

අභිප්‍රාය

ජාතික ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විදේශ ආයෝජන දිරිමත් කිරීම සහ හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීම මගින් රටට සේවය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අභිප්‍රාය වේ. එමගින් අපනයන ආදායම් උත්පාදනය කරමින්, තිරසර විදේශ ආයෝජන ළඟාකර ගැනීමට සහ ශ්‍රී ලංකාව ආකර්ෂණීය ජාත්‍යන්තර ආයෝජන ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීම සඳහා ප්‍රයත්න දරයි.

අරමුණු

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූලික අරමුණු වන්නේ, ආර්ථික සංවර්ධනය ඇති කිරීම සහ දිරිමත් කිරීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම, විදේශ විනිමය ඉපයීමේ ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සහ අපනයන ආදායම ඉහළ නැංවීම, රට තුළ කර්මාන්ත සහ ව්‍යවසායයන් ස්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම සහ දිරිමත් කිරීම වේ.

කාර්යභාරය

රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වමින්, සෘජු විදේශ ආයෝජන මට්ටම ක්‍රමිකව ඉහළ නැංවීම මෙන්ම ජාතික වර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දායකත්වයක් ලබාදෙමින් ආර්ථිකයේ ප්‍රමුඛතම අංශ කරා **ආයෝජන ඉලක්ක කිරීම හා ආයෝජන ආකර්ෂණය කරගැනීම වේ.**

ශ්‍රී ලංකාවේ ඉහළ අගයක් එක්කළ / උසස් තාක්ෂණික නිෂ්පාදන, ඉහළ අගයක් එක්කළ ඇඟළුම්, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා, සංචාරක කර්මාන්තය, ආහාර පිරිසැකසුම් කිරීම, සැපයුම් සේවා, අධ්‍යාපන හා මහා පරිමාණ යටිතල පහසුකම් හෝ වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති සැලසුම් කිරීමේ අභිප්‍රායෙන් **ආයෝජකයන් සමඟ සම්බන්ධතා පවත්වන පළමු ආයතනය** වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. ආයෝජකයින්ට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තොරතුරු හා මාර්ගෝපදේශ ලබාදෙන අතර වෙනත් රේඛීය නියෝජිතායතනවල අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වන අවස්ථාවන්හිදී එම ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු ද සිදුකරයි.

ආයෝජන අයදුම්පත් ඇගයීම, ආයෝජන ව්‍යාපෘති අනුමත කිරීම හා සහන ලබාදීම සඳහා අදාල අංශවල මෙන්ම මෙම ව්‍යාපෘතිවල විදේශිකයන්ට වීසා නිකුත් කිරීම සඳහා ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පහසුකම් සළසයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය මෙන්ම නිමි භාණ්ඩ අපනයනය සඳහා ද ආනයන/අපනයන නිෂ්කාශන ලබා ගැනීම සහ පහසුකම් සැලසීම ඇතුළු **ව්‍යාපෘති ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම සහ සාර්ථකව මෙහෙයුම් කිරීම දක්වා වන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරා ආයෝජකයින්ට සහාය ලබාදේ.**

අවම කාලයක් තුළ ආයෝජකයින්ට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිශ්‍ර සැපයීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් අවශ්‍ය යටිතල පහසුකම් සහිතව **අපනයන සැකසුම් කලාප සංවර්ධනය කෙරේ.**

දැක්ම

"තිරසාර ආයෝජන සඳහා ආසියාවේ වඩාත් ම ආකර්ෂණීය ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත් කිරීම"

මෙහෙවර

"ශ්‍රී ලංකාවට ගුණාත්මක ආයෝජන ආකර්ෂණය කරගැනීමේ හා රඳවා ගැනීමේ විභවතාවය ඉටුකිරීම සඳහා, වැඩිදියුණු කළ අපනයන පදනමක් ලබාදීමට මූලික වෙමින් සහ වඩා හොඳ රැකියා අවස්ථා ඇති කිරීමටත් නව තාක්ෂණය හා නවෝත්පාදන තුළින් දැනුම හා නිපුණතා වැඩිදියුණු කිරීමටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ධනාත්මකව හා වේගවත් ලෙස කටයුතු කරනු ලැබේ"

වටිනාකම්

කාර්යසාධනය සහ ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂය:
ආයෝජන මණ්ඩලය තාත්ත්වික ආයෝජන සහ රැකියා අවස්ථා බිහිකිරීමේ ඉලක්ක සමගින් සිය අභිලාෂයන් සාක්ෂාත් කරගැනීමට ක්‍රියාකරනු ඇත.


රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සම්බන්ධතාවය ගොඩනැගීම:
රටෙහි ආර්ථික සෞභාග්‍යය සඳහා ඉවහල්වන ආයෝජන සඳහා පහසුකම් සැලසීම, සුරක්ෂිතතාවය සහ වර්ධනය කිරීමේ අභිමානවත් කාර්යය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉටුකරනු ලැබේ. අපගේ මෙහෙවර ඉටුකිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම ආයතන සමග සහයෝගීතාවයෙන් හා හවුල්කාරීත්වයෙන් කටයුතු කරන අතර ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට ද දායක වන්නෙමු.

වෘත්තිය දැනුම සහ අඛණ්ඩතාව:
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජකයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීමට කැපවන අතර අවශ්‍ය අවස්ථාවලදී වාණිජ හා නව්‍ය විසඳුම් ලබාදෙනු ලැබේ. අප විසින් අඛණ්ඩව, විශ්වසනීයත්වයෙන් මේ සඳහා හෘදයාංගමව කැප වී සිටින්නෙමු.

උසස් පාරිභෝගික සේවාව:
සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා තරඟ කිරීමේ දී ක්‍රියාකාරී මෙන්ම සුවිශේෂී මට්ටමෙන් කටයුතු කිරීම.


කාර්ය මණ්ඩලය:
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, විශිෂ්ටත්වය සඳහා සිය කාර්ය මණ්ඩලයේ දක්ෂතාවය, සහයෝගීතාවය, කැපවීම හා වගකීම අගය කරනු ඇත. කාර්ය මණ්ඩලයට සේවයේ නිරතවීම, අභිවෘද්ධිය සහ සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා වන සුවිශේෂී ස්ථානයක් බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පත්කිරීම කෙරෙහි අප නිරන්තර අවධානය යොමු කරන්නෙමු.

ආයෝජන මණ්ඩලයේ ගමන් මග




ජාතික ආර්ථිකයට අයෝජන මණ්ඩලයේ දායකත්වය

සෘජු විදේශ ආයෝජන (FDI) ගලනය (2014 - 2023)
ඇ.ඩො. මිලි.




- මුළු සෘජු විදේශ ආයෝජනයෙන් 55%ට වැඩි ප්‍රමාණයක් පසුගිය අවුරුදු 10 තුළ ලැබී ඇත.
- 1978 සිට රට තුළට ඇ.ඩො. බිලියන 21.9ට වැඩි සමුච්චිත සෘජු විදේශ ආයෝජන (FDI) ගලනයක් ලැබී ඇත.

ශ්‍රී ලංකාවේ ආයෝජන සිදුකරන ප්‍රධාන රටවල් 10 මගින් සෘජු විදේශ ආයෝජන (2014 - 2023) - ඇ.ඩො. මිලි.




2023 වසරේ සෘජු විදේශ ආයෝජන ගලනය

- රට තුළට ඇ.ඩො. බිලි. 0.7 වැඩි FDI ගලනයක්
- රට තුළට FDI වැඩිම ප්‍රමාණයක් චීනය විසින් ආයෝජනය කරන ලද අතර එය මුළු FDI ප්‍රමාණයෙන් 23%ක් විය.
- දෙවන ප්‍රධාන ආයෝජකයා ඉන්දියාව වූ අතර එය මුළු FDI ප්‍රමාණයෙන් 22%ක් විය.
- ප්‍රංශය, සිංගප්පූරුව, නෙදර්ලන්තය සහ මැලේසියාව FDI සඳහා 5% බැගින් දායකත්වය ලබාදේ.




- සෘජු විදේශ ආයෝජන ගලනයෙන් 38%ක් සේවා අංශයෙන් ලබා දුන් අතර සේවා සැපයුම්, සංචාරක සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය යන අංශ වලින් සමන්විත විය.
- නිෂ්පාදන අංශයේ සෘජු විදේශ ආයෝජන දායකත්වය 32% විය.
- සමස්ත සෘජු විදේශ ආයෝජන ගලනයෙන් 30% ක් වූ යටිතල පහසුකම් අංශය තෙවන විශාලතම අංශය විය.

ආංශික සෘජු විදේශ ආයෝජන ගලනය (2014-2023)




අපනයන කාර්යසාධනය (වෙළඳ භාණ්ඩ හා සේවාවන්) - 2014-2023

(ඇ.ඩො.බිලි.)




වෙළඳ භාණ්ඩ අපනයනය (ජාතික අපනයනයට සාපේක්ෂව ආයෝජන මණ්ඩල අපනයන) - 2014-2023

(ඇ.ඩො.බිලි.)




2023 වසරේ ආයෝජන මණ්ඩල අපනයන

- මුළු අපනයනය ඇ.ඩො. බිලි. 8.1
- වෙළඳභාණ්ඩ අපනයනය ඇ.ඩො. බිලි. 7.3




සමස්ත ජාතික වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 62%




ජාතික කාර්මික අපනයනයෙන් 76%

- ජාතික ඇඟලුම් අපනයනයෙන් 96%
- ජාතික රබර් අපනයනයෙන් 90%
- ජාතික සම් භාණ්ඩ, ගමන් භාණ්ඩ සහ පාවහන් අපනයනයෙන් 87%
- ජාතික යන්ත්‍ර සහ යාන්ත්‍රික උපකරණ අපනයනයෙන් 80%
- ජාතික මුද්‍රණ කර්මාන්ත නිෂ්පාදන අපනයනයෙන් 80%
- ජාතික ප්‍රවාහන උපකරණ අපනයනයෙන් 80%




ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල රැකියා උත්පාදනය

සෘජු රැකියා නියුක්තිය (000')




ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ ව්‍යාප්තිය සහ සේවා නියුක්තිය (2023)



* ව්‍යාපෘති පුළුල් කිරීම

2023 වසරේ ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි රැකියා නියුක්තිය

- සෘජු රැකියා සංඛ්‍යාව 465,000
- බිලියන 1.4 ට වැඩි සමුච්චිත වක්‍ර රැකියා ප්‍රමාණයක්



- ඇඟළුම් හා රෙදිපිළි අංශයේ රැකියා 274,000
- නිෂ්පාදන අංශයේ රැකියා 97,000
- තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ (IT/BPO) අංශයේ රැකියා 25,000
- සංචාරක අංශයේ රැකියා 15,000

ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් සංඛ්‍යාව

සේවා නියුක්තිය



2023 වසරේ කාර්යසාධනය

වසර පිළිබඳව සංක්ෂිප්තව

ලැබුණු නව ආයෝජන ව්‍යාපෘති යෝජනා

නව ව්‍යාපෘති යෝජනා (ඇස්ත. ආයෝජනය ඇ.ඩො. බිලි 0.3)	104
ව්‍යාපෘති පුළුල් කිරීම් සඳහා යෝජනා (ඇස්ත. ආයෝජනය ඇ.ඩො. බිලි 0.26)	40

අනුමැතිය ලබාදුන් ව්‍යාපෘතීන්

නව ව්‍යාපෘති (ඇස්ත. ආයෝජනය ඇ.ඩො. බිලි 1.83)	68
ව්‍යාපෘති පුළුල් කිරීම් (ඇස්ත. ආයෝජනය ඇ.ඩො. බිලි 0.23)	38

ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති

නව ව්‍යාපෘති (ඇස්ත. ආයෝජනය ඇ.ඩො. බිලි 0.48)	42
ව්‍යාපෘති පුළුල් කිරීම් (ඇස්ත. ආයෝජනය ඇ.ඩො. බිලි 0.24)	50

උපලබ්ධි වූ අයෝජන

උපලබ්ධි වූ FDI	ඇ.ඩො. මිලි. 737
උපලබ්ධි වූ දේශීය ආයෝජන	ඇ.ඩො. මිලි. 570

ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අපනයනයන්

වෙළඳ භාණ්ඩ අපනයනයන්	ඇ.ඩො. බිලි. 7.3
සේවා අපනයනය	ඇ.ඩො. මිලි. 815

ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි රැකියා නියුක්තිය

මුළු රැකියා නියුක්තිය	465,000*
ආයෝජන කලාපවල රැකියා නියුක්තිය	135,000

(* ආයෝජන කලාපවල රැකියා නියුක්තිය ඇතුළුව)




අනුමත ව්‍යාපෘති - 2023

106
ව්‍යාපෘති සංඛ්‍යාව
නව ව්‍යාපෘති 68 ක් සහ
ව්‍යාපෘති පුළුල් කිරීම් 38

ඇ.ඩො බිලි. 2,06
සමස්ත අනුමත ආයෝජනය


21,397
ඇස්තමේන්තුගත රැකියා අවස්ථාවන්

ආයෝජනය




මුළු ඇස්තමේන්තුගත ආයෝජනය : ඇ.ඩො. බිලි. 2.06
- නව ව්‍යාපෘති : ඇ.ඩො. බිලි. 1.83 (89%)
- ව්‍යාපෘති පුළුල් කිරීම් : ඇ.ඩො. බිලි. 0.23 (11%)


හිමිකාරිත්වය



අංශය



භූගෝලීය පිහිටීම




2023 වසරේ ආයෝජන කාර්යසාධනය

සෘජු විදේශ ආයෝජන ආංශික දායකත්වය

2023 වසරේදී ශ්‍රී ලංකාව ඇ.ඩො. මිලි. 737ක සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරනු ලැබීය. සමස්ත සෘජු විදේශ ආයෝජන ගලනයෙන් 32%ක කැපීපෙනෙන ප්‍රමාණයක් සඳහා දායක වූ නිෂ්පාදන අංශය ආයෝජකයින් වඩාත්ම ආකර්ෂණය කරගනු ලැබූ අංශය විය.


රටේ කාර්මික සංවර්ධනය වේගවත් කිරීමෙහිලා නිෂ්පාදන අංශයේ කාර්යභාරය සහ වැදගත්කම ඉහළ ආයෝජන ආකර්ෂණය තුළින් පැහැදිළි වේ. සංචාරක කර්මාන්තය සහ වාණිජ කේන්ද්‍රස්ථාන මෙහෙයුම් අංශ සඳහා 17% බැගින් ආයෝජන ආකර්ෂණය කරගත් අතර දුරකථන සන්නිවේදන අංශය සඳහා එය 15%ක් විය.

දේපළ සංවර්ධන අංශයට 6% ද, ඉන්ධන, ගෑස් සහ පෙට්‍රෝලියම් සඳහා 5% ද, වරාය බහාලුම් පර්යන්ත සඳහා 4% ද සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය සඳහා 2% ද වශයෙන් ආයෝජන සිදුවිය. රට තුළ තිරසර වර්ධනය ඇති කිරීමට, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ රැකියා අවස්ථාවන් උත්පාදනය කිරීමට මෙම අංශයන්හි දායකත්වය වැදගත් වේ.



2023 වසරේ සෘජු විදේශ ආයෝජන සඳහා දායක වූ රටවල්

ප්‍රධාන රටවල් මගින් සිදු වූ සෘජු විදේශ ආයෝජන ගලනය (ඇ.ඩො. මිලි.)



2023 වසර තුළ සෘජු විදේශ ආයෝජන සිදුකළ රටවල් අතරින් ප්‍රමුඛ රටවල් 10 එක්ව ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන සිදුකිරීමේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලැබීය. මෙම රටවල් සහ ආයෝජනය කෙරෙන රට අතර ශක්තිමත් ආර්ථික සබඳතාවන් සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් අවධාරණය කරමින්, සමස්ත සෘජු විදේශ ආයෝජනයෙන් 23% සඳහා දායක වෙමින් චීනය විශාලම ආයෝජකයා වූ අතර දෙවන ප්‍රධානතම ආයෝජකයා ලෙස ඉන්දියාව ආයෝජනයන්ගෙන් 22% සඳහා දායක විය.

ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා යුරෝපීය රටවල කැපීපෙනෙන උනන්දුවක් පෙන්නුම් කරමින්, රට තුළට සමස්ත සෘජු විදේශ ආයෝජන ගලනයෙන් 10%ක් සඳහා වගකිව යුතු ප්‍රංශය තෙවන විශාලම ආයෝජකයා විය. සංවර්ධිත රටවල් විසින් ශ්‍රී ලංකාවේ සැළකිය යුතු ආයෝජන සිදුකරන බව ප්‍රදර්ශනය කරමින්, නෙදර්ලන්තය 8% ද සිංගප්පූරුව 6% ද වශයෙන් ආයෝජන සඳහා දායක විය.


සැළකිය යුතු කලාපීය මැදිහත්වීමක් පෙන්නුම් කරමින් මැලේසියාව සහ සීෂෙල්ස් එකිනෙක 5%ක පමණ ආයෝජන සිදු කරනු ලැබීය. තවදුරටත් ආසියාවෙන් ශක්තිමත් ආයෝජන ගලනයන් අවධාරණය කරමින් හොංකොං රාජ්‍යය ආයෝජනයන්ගෙන් 4%ක් සඳහා දායක විය. ආයෝජන සිදුකරන රටවල විවිධත්වය පිළිබිඹු කරමින්, එක්සත් රාජධානිය සහ ලක්ෂම්බර්ග් පිළිවෙලින් 3%ක් හා 2%ක් වශයෙන් මෙරට ආයෝජන සිදුකරන ප්‍රමුඛ රටවල් 10 අතර විය.

2023 වසරේ දේශීය ආයෝජනයන්හි ආංශික දායකත්වය

2023 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඇ.ඩො. මිලි. 570ක දේශීය ආයෝජනයක් වාර්තා කරනු ලැබීය. සමස්ත ආයෝජනයෙන් 37%ක් වන නිෂ්පාදන අංශය මුළු දේශීය ආයෝජනයෙන් වැඩිම කොටස ආකර්ෂණය කර ඇත.

දේශීය ආයෝජනයන්ගෙන් 22%ක් වන දුරකථන සන්නිවේදන අංශය දෙවන විශාලම දායකත්වය ලබා දුන් අංශය විය. ආර්ථික වර්ධනය සඳහා සහය දීමේදී සිය වැදගත් කාර්යභාරය පිළිබිඹු කරමින් අනෙකුත් සේවා සහ යටිතල පහසුකම් අංශය ආයෝජන සඳහා 14%ක දායකත්වයක් ලබා දෙනු ලැබීය. නූතන ආර්ථිකය සඳහා සිය වැදගත්කම ඉස්මතු කරමින් තොරතුරු සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ අංශය ආයෝජනවලින් 9% ආකර්ෂණය කරගනු ලැබීය.

වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ දී එම අංශයෙහි වැදගත්කම පෙන්නුම් කරමින් වරාය බහාලුම් පර්යන්ත අංශය ආයෝජනයන්ගෙන් 8%ක් සඳහා දායක විය. දේපළ සංවර්ධන අංශය, සමස්ත දේශීය ආයෝජනයෙන් 7%ක් ආකර්ෂණය කරන ලද අතර රටේ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේලා ඇති අඛණ්ඩ උනන්දුව ප්‍රදර්ශනය කරමින් ආයෝජනයෙන් 3%ක් සංචාරක අංශය සඳහා ලැබී ඇත. ආයෝජනයෙන් 0.02%ක අවම කොටසක් ලැබී ඇත්තේ කෘෂිකාර්මික අංශයෙනි.




2023 වසරේ ආයෝජන මණ්ඩලයේ අපනයන කාර්යසාධනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සංයුතිය - 2023


2023 වසරේදී ඇ.ඩො. මිලි. 7,334ක් වූ වෙළඳ භාණ්ඩ අපනයනය සහ ඇ.ඩො. මිලි. 815ක් වූ සේවා අපනයනයෙන් සමන්විත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මුළු අපනයනය ඇ.ඩො. මිලි. 8,149ක අගයකට ළඟා විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වෙළඳ භාණ්ඩ අපනයනය ජාතික වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 62% සැළකිය යුතු අගයක් සඳහා දායක වූ අතර ජාතික කාර්මික අපනයනයෙන් 76% කැපී පෙනෙන අගයකින් යුක්ත වේ.

කාර්මික අපනයන, කෘෂිකාර්මික අපනයන, බණ්ඩ අපනයන සහ වර්ගීකරණය නොකරන ලද අපනයනයන් යන අංශවලින් වෙළඳ භාණ්ඩ අපනයනය සමන්විත වේ.

සමස්ත ආයෝජන මණ්ඩල අපනයනයන්ගෙන් 86%න් සමන්විත කාර්මික අපනයන, ආයෝජන මණ්ඩල අපනයන සංයුතියෙහි ප්‍රධාන අංශය වේ. අපනයන ආර්ථිකයක් තුළ සේවා අංශයෙහි වර්ධනයේ වැදගත්කම පිළිබිඹු කරමින් සේවා අපනයනය 10%ක අගයක් නියෝජනය කරන ලදී. කෘෂිකාර්මික අපනයන මුළු ආයෝජන මණ්ඩල අපනයනයෙන් 4%ක් සඳහා දායක වූ අතර බණ්ඩ අපනයනයන් සහ වර්ගීකරණය නොකරන ලද අපනයනයන් පිළිවෙලින් 0.1%ක් සහ 0.03%ක් විය. මෙම අගයන් මගින් ජාතික අපනයන ආර්ථිකයට ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ සැළකිය යුතු දායකත්වය පෙන්නුම් කරයි.




කාර්මික අපනයනයන් - 2023



2023 වසරේ දී ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් විසින් මුළු වටිනාකම ඇ.ඩො. මිලි. 7,032ක කාර්මික අපනයනයන් වාර්තා කරන ලදී. කාර්මික අපනයනයන්ගේ ප්‍රමුඛතාව පෙන්නුම් කරමින්, ආසන්න වශයෙන් ඇ.ඩො. මිලි. 4,676ක් රෙදිපිළි සහ ඇඟළුම් අංශයෙන් ලැබුණු අතර එය මුළු කාර්මික අපනයනයෙන් 66%ක් නියෝජනය කරන ලදී. රබර් අංශය, 12%ක් වන ඇ.ඩො. මිලි. 814 පමණ ප්‍රමාණයක් සඳහා දායක වූ අතර අනෙකුත් කාර්මික අපනයන මුළු අපනයනයෙන් 7%ක් විය. යන්ත්‍ර සහ යාන්ත්‍රික උපකරණ 7%ක්, එනම් ඇ.ඩො. මිලි. 477ක් සඳහා දායකත්වයක් විය.

මැණික්, දියමන්ති, සහ ආභරණ අංශය 3%ක දායකත්වයක් දැක්වූ අතර ආහාර පාන සහ දුම්කොළ අංශය සහ ප්‍රවාහන උපකරණ අංශය අපනයන සඳහා 2% බැගින් ද මූලික ලෝහ සහ ඒවායින් කළ භාණ්ඩ අංශය 1% ද දායක විය. රෙදිපිළි සහ ඇඟළුම් අංශයෙන් ලැබුණු ශක්තිමත් දායකත්වයත්, ඊට අනුගාමීව රබර්, යන්ත්‍ර සහ විශේෂිත කාර්මික අංශ මගින් ලැබුණු සැළකිය යුතු දායකත්වයත් නිසා මෙම අගයන් මගින් විශේෂයෙන් ආයෝජන මණ්ඩල අපනයනයන් විවිධාංගීකරණය වූ ස්වභාවය දක්වයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප




ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රමුඛ වෙළඳ භාණ්ඩ අපනයන ගමනාන්ත

2023 වසරේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනය ඇ.ඩො. මිලි. 7,334ක් ලෙස වර්තා විය. ඇ.ඩො. මිලි. 2,390ට ආසන්න අගයක් ගත් මෙම අපනයනයෙන් 33%ක් සඳහා දායක වූ එක්සත් ජනපදය විශාලම වෙළඳපොළ වූ අතර, එක්සත් රාජධානිය සමස්ත අපනයනයෙන් 10%ක් සඳහා ද ඉතාලිය 8%ක් ද ජර්මනිය 6%ක් ද ඉන්දියාව 5%ක් ද වශයෙන් වෙළඳ භාණ්ඩ අපනයන ගමනාන්ත නියෝජනය කරන ලදී.

යුරෝපීය සහ උතුරු ඇමරිකානු රටවල මැනවින් ව්‍යාප්ත වූ වෙළඳපොළක් ඇති බව ප්‍රදර්ශනය කරමින් ප්‍රංශය, නෙදර්ලන්තය, කැනඩාව, සහ බෙල්ජියම 3% බැගින් දායක විය. මුළු වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා 2%ක දායකත්වයක් ලබා දෙමින් ඔස්ට්‍රේලියාව ද වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රමුඛ සේවා අපනයන ගමනාන්ත

2023 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සේවා අංශයේ අපනයන මගින් ඇ.ඩො. මිලි. 815ක ආදායමක් වාර්තා කරන ලදී. මෙම අපනයනයන්හි ව්‍යාප්තිය මගින් විවිධාංගිරණය වූ ගෝලීය වෙළඳපොළ පුරා පැතිරුණු උපාය මාර්ග පිළිබිඹු වේ. විශේෂයෙන්ම සමස්ත සේවා අපනයනයෙන් 19%ක් ආකර්ෂණය කරමින් එක්සත් ජනපදය විශාලම ගමනාන්තය බවට පත්වූ අතර එක්සත් රාජධානිය සහ බංග්ලාදේශය 15% බැගින් සේවා අපනයනය සඳහා දායක විය. පාකිස්ථානය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සේවා අපනයනයට 7% බැගින් දායක විය. ස්වීඩනය සහ ඉන්දියාව 6% බැගින් ද ඔස්ට්‍රේලියාව, සයිප්‍රසය සහ සිංගප්පූරුව සේවා අපනයනයෙන් 2%ක් බැගින් ද දායක වූ අනෙකුත් වැදගත් ගමනාන්ත වේ. සේවා අපනයන සඳහා වෙළඳපොළ විවිධාංගීකරණය සහ පුළුල් කිරීම සඳහා වන ගෝලීය ප්‍රවිෂ්ටයේ සාර්ථක ප්‍රයත්නයන් ලෙස මෙම වෙළඳපල ව්‍යාප්තිය හඳුනාගත හැකිය.




ශ්‍රී ආයෝජන මණ්ඩලයේ ප්‍රමුඛ වෙළඳ භාණ්ඩ අපනයන ගමනාන්ත - 2023 (ඇ.ඩො. මිලි)
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රමුඛ සේවා අපනයන ගමනාන්ත - 2023 (ඇ.ඩො. මිලි)

සේවා නියුක්ති කාර්යසාධනය - 2023

2023 වසරේ දී පුද්ගලයින් 465,026 රැකියාවල නිරත වූ අතර ඇඟළුම් සහ රෙදිපිළි අංශය, ශ්‍රම බලකායෙන් 59% ක් නියෝජනය කරමින් රැකියා සඳහා වැඩිම දායකත්වයක් ලබාදේ.

මීළඟට, අනෙකුත් නිෂ්පාදන සහ අනෙකුත් සේවාවන් පිළිවෙලින් සමස්ත රැකියා ප්‍රමාණයෙන් 11% ද 6% ද වශයෙන් දායක වේ. තවද, කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින් තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය (IT / BPO) යන අංශ ශ්‍රම බලකායේ 6% ක් සඳහා රැකියා අවස්ථාවන් සලසයි. රබර් නිෂ්පාදන අංශය, ආහාර පාන හා දුම්කොළ අංශය රැකියා අවස්ථාවන් බිහි කිරීමේලා සිය සැළකිය යුතු කාර්යභාරයක් ඉටු කරමින් ශ්‍රම බලකායෙන් 4% ක් සඳහා දායක වේ.

ආර්ථික ක්‍රියාකාරකම් ඉටු කිරීමේ දී මෙන්ම රැකියා උත්පාදනයේ දී සංචාරක අංශය සහ දේපළ සංවර්ධන අංශයේ වැදගත්කම පෙන්නුම් කරමින් එම අංශ සමස්ත රැකියාවන්ගෙන් 3% බැගින් දායක වේ. එසේම දුරකථන සන්නිවේදනය, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ අංශය ද රැකියා සඳහා 2% ක දායකත්වයක් සපයයි. මීට අමතරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ආර්ථික සංවර්ධනය සහ රැකියා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කරන ලද පුළුල් ප්‍රවේශය පෙන්නුම් කරමින් රැකියා ප්‍රමාණයෙන් 1% ක් කෘෂිකාර්මික අංශය සහ අනෙකුත් යටිතල පහසුකම් අංශය මගින් බිහි වී ඇත.



* ගුවන් සේවා, නැව් අළුත්වැඩියා කිරීමේ සේවා, අධ්‍යාපන ආයතන ආදිය අනෙකුත් සේවාවන්ට ඇතුළත් ය.



ගෝලීය ආයෝජන ප්‍රවණතාව 2023-2024


ගෝලීය ආර්ථික තත්ත්වයන් සැළකීමේ දී 2023 වසරේ දී සෘජු විදේශ ආයෝජන ඇ.ඩො ට්‍රිලියන 1.3 ක් දක්වා 2%කින් අඩු විය. යුරෝපීය ආර්ථිකයන් කිහිපයක ඇති වූ කැපී පෙනෙන මූල්‍යමය විචලනයන් මේ සඳහා බලපාන ලදී. ඉහත බලපෑම හැරුණු විට ගෝලීය සෘජු විදේශ ආයෝජන ගලනය 2022 වසරට සාපේක්ෂව 10%ට වඩා අඩු විය. ආර්ථික වර්ධනය දුර්වල වීම, ආර්ථික වශයෙන් බෙදීම් සිදුවීම, වෙළඳ හා භූදේශපාලනික අර්බුදයන්, කාර්මික ප්‍රතිපත්ති සහ සැපයුම් දාම විවිධාංගීකරණය හේතුකොට ගෙන 2024 වර්ෂයේ ජාත්‍යන්තර ආයෝජන ඉදිරි දැක්ම අභියෝගාත්මක විය හැකිය. ආර්ථික වර්ධනය දුර්වල වීම, ආර්ථික වශයෙන් බෙදීම් සිදුවීම, වෙළඳ සහ භූදේශපාලනික අර්බුදයන්, කාර්මික ප්‍රතිපත්ති සහ සැපයුම් දාම විවිධාංගීකරණය හේතු කොටගෙන ඉහත අභියෝග හැරුණු විට 2023 වසරේදී බහුජාතික ව්‍යාපාර ඉහළ ලාභ මට්ටම් පවත්වා ගත් අතර මූල්‍යකරණ තත්ත්වයන් දියුණු වීම සහ නව විදේශ ආයෝජන ව්‍යාපෘති (Green Field Projects) ආරම්භ වීම නිසා එළඹෙන වසරේ දී සාමාන්‍ය වර්ධනයක් අපේක්ෂා කළ හැකිවේ.

2023 වසරේදී, විශේෂයෙන්ම ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍යයනයන් සහ ආර්ථිකයන් අතර ව්‍යාපාර ඒකාබද්ධ වීම් සහ අත්පත් කර ගැනීම් දුර්වල මට්ටමක පැවතිණ. ව්‍යාපාර ඒකාබද්ධවීම් සහ අත්පත් කරගැනීම් සංවර්ධිත රටවල සෘජු විදේශ ආයෝජන සඳහා තීරණාත්මක වන අතර එය 46%ක පහත වැටීමක් පෙන්නුම් කරනු ලැබිය. මේ අතර යටිතල පහසුකම් ආයෝජනය සඳහා අත්‍යවශ්‍ය වන ව්‍යාපෘති මූල්‍යයනය 23%කින් පහත වැටිණ. දැඩි මූල්‍යකරණ කොන්දේසි, ආයෝජන අවිනිශ්චිතතාවන්, මූල්‍ය වෙළඳපල අස්ථාවර බව සහ වැඩි වූ නියාමන කාර්යයන් වැනි සාධක මෙම පහත වැටීම්වලට හේතු විය.

කෙසේ වුවද, නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘති (greenfield investment projects) සංඛ්‍යාව 2%ක වැඩිවීමක් පෙන්නුම් කරන ලද අතර මූලිකවම සංවර්ධනය වන රටවල කේන්ද්‍රගත වූ නිෂ්පාදන අංශය 15%ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. සංවර්ධිත රටවල නව ව්‍යාපෘති දැනුම් දීම් 6%කින් අඩු විය.

සංවර්ධිත, සංවර්ධනය වෙමින් පවතින සහ ඌන සංවර්ධිත යන ආදායම් කාණ්ඩ 3 තුළ සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙත සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො.බිලි. 867 දක්වා 7%කින් පහත වැටුණ අතර සංවර්ධිත රටවල් වෙත 9%ක වර්ධනයක් ද, ඌන සංවර්ධිත රටවල් කරා 17%ක කැපී පෙනෙන වර්ධනයක් ද සිදු විය. තවද, 2023 වසරේ දී රටවල් කලාප හරහා ගෝලීය සෘජු විදේශ ආයෝජනවල මිශ්‍ර ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී. ව්‍යාපෘති මූල්‍යනයේ ගෝලීය අඩුවීම කලාපයට බලපෑමක් ඇති කළ නමුත් නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘති දැනුම්දීම් වැඩිවීමක් සමඟ ආසියාව ශක්තිමත්ව පැවතිණ. එසේවුවද, ලොව දෙවන විශාලම සෘජු විදේශ ආයෝජනලාභී රට වන චීනය සඳහා වන ගලනයන්හි වාර්තාගත අඩුවීමක් ඇතුළුව සංවර්ධනය වන ආසියානු රටවල් කරා සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො. බිලියන 621 දක්වා 8%කින් අඩු විය. මොරිටේනියාවේ මූලික හරිත හයිඩ්‍රජන් ව්‍යාපෘතියක් ඇතුලුව නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘති දැනුම්දීම් සැළකිය යුතු සංඛ්‍යාවක් සමඟින්, අප්‍රිකාවේ සෘජු විදේශ ආයෝජන ගලනය 3%කින් පහත වැටුණි. සංවර්ධිත කලාපවල ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍යන ගනුදෙනු 25%කින් අඩු වූ අතර ලතින් ඇමරිකානු සහ කැරිබියන් රටවල් සඳහා ව්‍යාපෘති දැනුම්දීම් සුළු ප්‍රමාණයක් සිදු විය.


විදේශීය සමාගම් හා දේශීය සමාගම් අතර ආයෝජන (Cross-border M&As)
(වටිනාකම)




ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍යයන
(සංඛ්‍යාව)




නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘති (reenfield projects)
(සංඛ්‍යාව)



ආදායම් කාණ්ඩ



රටවල් කාණ්ඩ හා කලාප වශයෙන් ආයෝජන ගලනයන්
(ඇ.ඩො. බිලියන සහ වෙනස්වීමේ ප්‍රතිශතය)



මූලාශ්‍රය: UNCTAD,FDI/MME දත්ත පද්ධතිය (www.unctad.org/fdistatistics

යටිතල පහසුකම් සහ ඩිජිටල් ආර්ථික අංශවල ආයෝජන අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළද, නිෂ්පාදන සහ අත්‍යවශ්‍ය බණිජ අංශයේ ආයෝජනයන්හි ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. උදාහරණයක් ලෙස, සැපයුම් දාම ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් වාහන, ඉලෙක්ට්‍රොනික සහ යාන්ත්‍රික කර්මාන්තයන්හි කැපී පෙනෙන වර්ධනයක් සිදුවිය. ඒ අතරතුර අත්‍යවශ්‍ය ඛනිජ කැණීමේ සහ සකස් කිරීමේ කර්මාන්තයන්හි ආයෝජන ව්‍යාපෘති, සංඛ්‍යාව සහ වටිනාකම යන දෙයාකාරයෙන්ම ආසන්න වශයෙන් දෙගුණයක් විය.

2023 වසරේදී සංවර්ධිත රටවල තිරසර සංවර්ධන ඉලක්කයන්ට (SDG) අදාළ අංශයන්හි ආයෝජන අඩු විය. ප්‍රනර්ජනනීය බලශක්තිය, විදුලි බලය සහ ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව සමාගම් ස්ථාපනය කිරීමේ ආයෝජන ව්‍යාපෘතිවල වර්ධනයක් සිදු වුවද වටිනාකම අනුව විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා බලපාන ලද ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍යනයන්හි පහත වැටීම හේතුවෙන් SDG ව්‍යාපෘතිවල ආයෝජන අඩු විය.

විශේෂයෙන් ම තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා අංශයේ මූලිකව රටවල් අතර ඇති වූ ව්‍යාපාර ඒකාබද්ධ වීම් සහ අත්පත් කරගැනීම් (M&A) ආයෝජනයන්හි කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණි. නිස්සාරණ සහ වාහන කර්මාන්තය හැර අනෙකුත් සියළුම අංශවල ව්‍යාපාර ඍජු ඒකාබද්ධ වීම් සහ අත්පත් කරගැනීම් (M&A) සංඛ්‍යාව පහත වැටිණ.

විශේෂයෙන්ම 86% නියෝජනය කරන සංවර්ධනය වෙමින් පවතින රටවල ආයෝජන සහන යෝජනා ක්‍රම හඳුන්වා දීම සහ පරිපාලන ක්‍රියාවලි ක්‍රමවත් කිරීම හෝ සරල කිරීම මගින් ආයෝජන ප්‍රවර්ධනය සහ පහසුකම් සැළසීම වෙනුවෙන් අවශ්‍ය කරන මූලාරම්භයන් වැනි වඩා හිතකර ක්‍රියාමාර්ග හේතුවෙන් 2023 වසරේදී, ප්‍රධාන වශයෙන් ආයෝජන ප්‍රතිපත්ති ආයෝජකයින් සඳහා වඩාත් වාසිදායක විය.


2023 වසරේදී, විශේෂ ආර්ථික කලාප සඳහා අදාළ වන ආයෝජන දිරිදීමනා හා අංශාභිමුඛ දිරිදීමනා සේවා අංශය, පුනර්ජනනීය බලශක්ති, පරිසර හිතකාමී තාක්ෂණයන් සහ උසස් තාක්ෂණික නිෂ්පාදන සඳහා දායක වන නිෂ්පාදන කර්මාන්තයන්හි ආයෝජන ප්‍රවර්ධන කෙරෙහි වැඩි වශයෙන් යොමු වූ අතර ඒවා සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් යන දෙඅංශයේම ආයෝජකයින් සඳහා වඩාත් හිතකර ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් සමන්විත විය. ආයෝජන දිරිදීමනා හඳුන්වාදීම හෝ පුළුල් කිරීම්, එම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් තුනෙන් එකක්ම නියෝජනය කරන ලදී.

සංවර්ධිත රටවල ප්‍රතිපත්ති ආයෝජකයින් සඳහා වඩාත් හිතකර වූ බැවින් එහි වැදගත්කම අඩු වීමට පටන් ගත් අතර සමස්ත හිතකර ක්‍රියාමාර්ගවලින් 43% පමණක් නියෝජනය කරනු ලැබීය. රට තුළට ඇතුල්වීම මෙන්ම සැළකීම සහ මෙහෙයුම් සම්බන්ධයෙන් සීමාකිරීමේ ක්‍රියාමාර්ග අනුගත කරගත් සංවර්ධිත රටවල සීමා කිරීමේ ක්‍රියා මාර්ගවල වැඩිවීමක් සිදු විය.


විශේෂයෙන්ම දිළිඳුම රටවල් සඳහා වන අවදානම අඩු කරමින් නියාමන අයිතීන් සමඟ ආයෝජන සඳහා පහසුකම් සැළසීම තුළනය කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව සිදු වුවද එහි ප්‍රගතිය මන්දගාමී ස්වරූපයක් ගන්නා ලදී.

2023 වසරේ දී, නව ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් (IIAs) 29ක් අවසන් වූ අතර ඉන් අඩකට අඩු ප්‍රමාණයක් සාම්ප්‍රදායික ද්විපාර්ශ්වික ආයෝජන සහයෝගිතා ගිවිසුම්වලින් සමන්විත විය. නව ගිවිසුම්වලින් බොහොමයක්ම ආයෝජන පහසුකම් සහිත පුළුල් ආර්ථික ගිවිසුම් වේ. ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් නිති ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රයත්නයන් සිදු කරමින් පවතින අතර මෙමගින් නව ගිවිසුම් සඳහා ආයෝජන පහසුකම් සැළසීම සහ තිරසර සංවර්ධනය ඇතුළුව නියාමනය කිරීමේ අයිතිය ආරක්ෂා කිරීමේ අංග සමගින් පුළුල් පරාසයක ගැටළු ආවරණය කෙරේ.

ආයෝජකයින් සඳහා වඩා හිතකර රටවල් කාණ්ඩ



ආකාරය අනුව වඩා හිතකර ක්‍රියාමාර්ග



සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රවර්ධනය කිරීම

ප්‍රවර්ධන කාර්යයන්

4	වෙබිනාර් වැඩසටහන් (Webinar)
15	පහසුකම් සැළසීමේ වැඩසටහන්
81	මාර්ගගත රැස්වීම් 16 සහ භෞතික රැස්වීම් 65
57	රට තුළට දූත කණ්ඩායම්
09	රටින් පිටතට දූත කණ්ඩායම්
24	වැඩසටහන් සහ ව්‍යාපාරික සංසද
398	IFC සම්බන්ධයෙන් කටයුතු කිරීම්



මාධ්‍යය භාවිතය

25,000+ followers

3,000+ followers

1500+ followers

2024 ජනවාරි 01 දිනට සමාජ මාධ්‍ය භාවිතා කළ අයගේ එකතුව - 29,500

FOLLOW

New followers in 2023 - 11,480

මාධ්‍ය නිවේදන	252
සමාජ මාධ්‍ය සඳහා නිමකළ වැඩසටහන්	22
ANCL සමාගම සමඟ නිකුත් කරන ලද 45 වන සංවත්සර අතිරේකය	01

අප පළකරන තොරතුරු

- ගිවිසුම් අත්සන් කිරීම්
- අපනයනයන් සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අංශික කාර්යසාධනය
- ආයෝජන කලාප සහ කර්මාන්තශාලා සංචාරයන් සහ අදාල ක්‍රියාකාරකම්
- ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් සහභාගි වන වැඩසටහන්, සමුළු සහ ක්‍රියාකාරකම්
- ආයෝජන මණ්ඩල අනුමත කර්මාන්ත ශාලා විවෘත කිරීමේ උත්සව
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත සංවර්ධන ව්‍යාපෘති
- තානාපතිවරුන් ඇතුළු ප්‍රසිද්ධ පුද්ගලයින් විසින් ආයෝජන මණ්ඩලය වෙත සිදු කරන සංචාරයන්
- පාර්ශවකරුවන් සමග පවත්වන වැදගත් රැස්වීම්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛ නියෝජිතායනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පරිශීලක නාමය @Investin_SL

විශේෂ හඳුන්වාදීම්

එක් දිනකදී tweets දෙකක් පළකිරීම.
ආයෝජන මණ්ඩල වෙබ් අඩවියේ පහළින් Twitter timeline ඇතුළත් කිරීම.
#InvestinSL නමින් නව hashtag එකක්
වීඩියෝවලින් සමන්විත tweeting

ප්‍රවර්ධන කාර්යයන්

2023 වසර තුළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විවිධ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදුකළ අතර ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම්, ආයෝජකයින් සඳහා පහසුකම් සැළසීමේ වැඩසටහන්, පාර්ශවකරුවන් සමඟ සබඳතා වැඩිදියුණු කර ගැනීම, ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ ඒ සඳහා සහභාගී වීම සහ සිය ආර්ථික රාජතන්ත්‍රිකභාවය ශක්තිමක් කර ගනු ලැබීය. ශ්‍රී ලංකාව ආයෝජන ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කරමින්, විභව්‍ය ආයෝජන අවස්ථා, ආයෝජන වාතාවරණය සහ ඉලක්කගත ප්‍රමුඛ අංශවල යාවත්කාලීන කිරීම් හුවාදක්වමින් ශ්‍රී ලංකාවේ අනන්‍ය ලක්ෂණ පෙන්නුම් කරන රටේ එකම ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය ලෙස සිය මූලික කාර්යය මගින් ආයෝජන මණ්ඩලය ජයග්‍රහණ ළඟාකර ගෙන ඇත.

ද්විපාර්ශ්වික සහ කලාපීය සමුළු

තායිලන්ත - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

තායිලන්ත - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම: ශ්‍රී ලංකාවේ තායිලන්ත තානාපති කාර්යාලය, ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව, තායිලන්ත රජයේ වෙළඳ අමාත්‍යාංශය සමඟ එක්ව, 2023 නොවැම්බර් 27 - 29 දක්වා තායිලන්තයේ බැංකොක්හි දී පැවති ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ 8වන සාකච්ඡා වටය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සහ තායිලන්තයේ වෙළඳ සහ ආයෝජන අවස්ථා පිළිබඳ සමුළුවක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) විසින් අනාගත සැලසුම්, මෑත කාලීන ආයෝජන ප්‍රමුඛතාවන් සහ දීර්ඝ කාලීන උපාය මාර්ගික සැලසුම් පිළිබඳව විශේෂයෙන් දක්වමින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය, රට යථා තත්ත්වයට ගෙන ඒම සහ ආනාගත සැලසුම් පිළිබඳව විස්තර කරන ලදී.

ජාතික වැඩසටහන්

උසස් තත්ත්වයේ ආයෝජන ආකර්ෂණය කිරීමේ අවස්ථාවන් ඇති කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවන් ඇතිකර ගැනීම මෙන්ම ශ්‍රී ලංකාව ඉතා සුදුසු ආයෝජන ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා, 2023 පළමු සහ තුන්වන කාර්තුවලදී ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන පාර්ශවකරුවන් විසින් විවිධ ආකාරයේ වැඩසටහන් මාලාවක් සංවිධානය කරනු ලැබීය. මෙම සෑම වැඩසටහනක්ම මෙරට ප්‍රධාන අංශ සහ ශ්‍රී ලංකාවේ වර්ධන විභව්‍යතාවයක් ඇති අංශ පිළිබඳ සාකච්ඡා, සංවාද සහ හවුල්කාරිත්වය ගොඩනැගීම සහ පහසුකම් සැළසීම සඳහා උපායමාර්ගික වේදිකාවක් විය.

FCCISL - රුසියාව - ශ්‍රී ලංකා ආර්ථික සංසදය (2023 ජනවාරි 24)

මෙම සංසදය, ශ්‍රී ලංකාව සහ රුසියාව අතර ආර්ථික සම්බන්ධතාව පිළිබඳ වැදගත් සංධිස්ථානයක් වේ. රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගීතාවය ඇතිව වාණිජ මණ්ඩල සහ ශ්‍රී ලංකා කර්මාන්ත සම්මේලනය විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන්වලදී, රුසියානු දූත කණ්ඩායමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ ජනරාල්වරිය සමඟ සාර්ථක ලෙස සාකච්ඡාවන්හි නිරතවීමේ අවස්ථාව උදාවිය. ඒ අනුව, මෙම වැඩසටහන් මගින් රටවල් දෙකෙහිම ව්‍යාපාරිකයන් ද්විපාර්ශ්වික වෙළඳාම, ආයෝජන සහ සහයෝගීතාවන් සඳහා වැදගත් පසුබිමක් සපයන ලදී.

ශ්‍රී ලංකා හරිත බලශක්ති සමුළුව (2023 මාර්තු 27)

පුනර්ජනනීය බලශක්තිය සහ තිරසාරත්වය සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම මැනවින් පෙන්නුම් කරමින්, 2023 මාර්තු 27 දින පැවති හරිත බලශක්ති සමුළුවේදී හරිත බලශක්තිය නිපදවීම සහ ඒ සඳහා ආයෝජනය කිරීම සම්බන්ධයෙන් කර්මාන්ත නායකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ නවෝත්පාදකයින් එකට එක්ව කටයුතු කරනු ලැබීය. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ, ශක්තිමත්, විනිවිදභාවයෙන් යුතු, ආයෝජක හිතකර ප්‍රතිපත්ති තන්ත්‍රයක් හරහා ශ්‍රී ලංකාව හරිත බලශක්තිය කරා සංක්‍රමණය වීම වේගවත් කරන අතරම ඉක්මන්, ප්‍රත්‍යස්ත ව්‍යාපාර හිතකර ප්‍රතිපත්ති සහ නියාමන වාතාවරණයක් ඇති කිරීම සඳහා තීරණාත්මක ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හඳුන්වාදෙනු ලැබීය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ, විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) ශ්‍රී ලංකා මහ බැංකුවේ, ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජිතයින් සමගින් මෙම අවස්ථාවට සහභාගි විය.

AHK ශ්‍රී ලංකා සහ ජර්මානු දූත මණ්ඩලය (2023 අප්‍රේල් 24)

AHK ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානී ඇන්ටෝනියා වොන් ෂොන්බර්ග් මහත්මිය සහ ආයතනික කටයුතු/ අපනයන ප්‍රවර්ධන ප්‍රධානී මලින්ත ගජනායක මහතාගේ ප්‍රධානත්වයෙන් කොන්ටිනෙන්ටල්, හෆිලා, ලින්ඩෙ (සිලෝන් ඔක්සිජන්), එස්කිමෝ පැෂන්, ක්‍රම්ස්කි, ඒ ඇන්ඩ් ආර් පැෂන්, ලංකා ලෙදර් පැෂන් සහ බෝගල මිනිරන් සමාගම්වල නියෝජිතයින් ඇතුළුව ජර්මානු ආයෝජකයින් කීපදෙනෙකු සමගින් 2023 අප්‍රේල් 24 වන දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා හමුවිය. මෙහි මූලික අරමුණ වූයේ ආයෝජන මණ්ඩලයේ මාර්ග සිතියම සහ නව ජර්මානු සෘජු විදේශ ආයෝජන අවස්ථා පිළිබඳව මෙන්ම වත්මන් ආයෝජකයින් සඳහා ව්‍යාපෘති පුළුල් කිරීම පිළිබඳ අවබෝධයක් ලබාගැනීම වේ.

ශ්‍රී ලංකා මෘදුකාංග සහ සේවා සමාගම් සංගමයේ (SLASSCOM) ජාතික නිපුණතා සංවර්ධන සම්මාන උළෙල (2023 ජූනි 16)

ශ්‍රී ලංකා මෘදුකාංග සහ සේවා සමාගම් සංගමයේ (SLASSCOM) ජාතික නිපුණතා සංවර්ධන සම්මාන උළෙලේදී, ශ්‍රී ලංකාවේ පාසල්, විශ්වවිද්‍යාල සහ සමාගම්වල පුද්ගලයින් සහ කණ්ඩායම් විසින් පෙන්නුම් කරන දක්ෂතා සහ ජයග්‍රහණයන් සඳහා සම්මාන පිරිනමනු ලැබීය. මෙම සම්මාන උළෙලේදී හොඳම සේවාදායක නවෝත්පාදනය (Best Client Delivery Innovation), හොඳම ව්‍යාපාර ආරම්භය (Best Start-up), හොඳම නව වෙළඳපල සේවාදායක නවෝත්පාදනය (Best Client Delivery Innovation) සහ වසරේ හොඳම උසස් තාක්ෂණික කාන්තා ව්‍යවසායිකාව (Woman Technopreneur of the Year) ඇතුළුව විවිධ කාණ්ඩ ආවරණය කරමින් සම්මාන පිරිනමනු ලැබිය. ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ කර්මාන්තය, ගෝලීය සේවාලාභීන් සඳහා සේවය සළසන වැදගත් අපනයන අංශයක්වේ. මෙහිදී නවෝත්පාදන ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන අතර මෙම සම්මාන උළෙල මගින් කර්මාන්තයේ නියළි පුද්ගලයින් සහ සමාගම්වල අදහස්, ක්‍රියාවලි සහ නිෂ්පාදන අබණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා දිරිමත් කෙරේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සහ අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව මෙම උත්සවය සංවිධානය කිරීමේ ජාතික හවුල්කාරී ආයතනයක් ලෙස කටයුතු කරන ලදී.

ප්‍රංශ ව්‍යාපාරික දූත මෙහෙවර (2023 නොවැම්බර් 3)

ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති කාර්යාලයේ ආර්ථික උපදේශක, ජීන් ඇලෙක්සැන්ඩ්‍රා EGEA ගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපාරික දූත කණ්ඩායමක් 2023 නොවැම්බර් 3 වන දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පැමිණ අධ්‍යක්ෂ ජනරාල්වරිය සහ විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) හමු වූහ. මෙහිදී, බහුවිධ අංශ: බලශක්තිය, ගුවන් ගමන්, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, උසස් තාක්ෂණය සහ සූක්ෂම නිෂ්පාදන පදනම් කර්මාන්තවල ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බලන ලදී.

SLASSCOMBPM සමුළුව (2023 දෙසැම්බර් 6)

මෙම සමුළුවේ දී, ප්‍රමුඛ කර්මාන්තකරුවන්, විශේෂඥයින් සහ පාර්ශවකරුවන් සඳහා කර්මාන්තයේ ඉදිරි දිශානතිය පිළිබඳ සාකච්ඡා කිරීමට වැදගත් වේදිකාවක් සළසමින්, ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරන (IT/BPM) අංශයේ වේගවත් වර්ධනය මෙන්ම වැදගත්කම ඉස්මතුකර දක්වනු ලැබීය. සාර්ථක සහ තිරසාර තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර බාහිරකරන (IT/BPM) කර්මාන්තය සඳහා මෙන්ම, ගෝලීය BPM අංශය සැළකූ විට ශ්‍රී ලංකාවේ කාර්යභාරය පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) සහ අනෙකුත් කාර්මාන්ත විශේෂඥයින්ගේ සහභාගිත්වයෙන් පැවති සාකච්ඡාවක් (panel discussion) ද මෙයට ඇතුළත් විය.

ජාත්‍යන්තර වැඩසටහන්

COP - 28 ලෝක දේශගුණික සමුළුව (2023 නොවැම්බර් 30) (World Climate Summit)



උෂ්ණත්වය ඉහළ යාම සීමාකිරීම සහ 2050 වසර වන විට පරිසරයට හානිකර ද්‍රව්‍ය මුදාහැරීම ශූන්‍ය කිරීමේ ක්‍රම පිළිබඳව එකඟ වෙමින් පරිසර විපර්යාස අර්බුදයට විසඳුම් සෙවීම සඳහා, 2023 වසරේ දී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දී එක්සත් ජාතීන්ගේ පරිසර විපර්යාස සමුළුව (COP28) පවත්වන ලදී. මෙහිදී ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් අදාල පර්යේෂණ සහ තාක්ෂණ අභිවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ජාත්‍යන්තර පරිසර විපර්යාස විශ්වවිද්‍යාලය සඳහා වන සිය අභිප්‍රාය එළිදැක්වීය. 2022 වසරේ දී ඊජිප්තුවේ පැවති COP27 හිදී මුලින්ම මේ සම්බන්ධයෙන් කරනු ලැබූ යෝජනාව සඳහා මේ වනවිටත් රජය විසින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ අක්කර 600ක ප්‍රදේශයක් නම් කර තිබේ. ඩුබායිහි පැවති COP28 හි දී සිදුකළ මෙම ප්‍රකාශය විවිධ ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ පැසසුමට ලක්විය. ශ්‍රී ලංකාවට හරිත ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීමේ අවස්ථා සොයාබැලීමේ අරමුණින් ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාරිසරික) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) මෙම වැඩසටහන සඳහා සහභාගි විය.

විදේශ දූත මෙහෙයන්



ඉලක්ක රටවල්වලින් වඩාත් ලාභදායි ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා, ව්‍යාපාරික වාතාවරණය සහ කරඟකාරී වාසි පෙන්නුම් කිරීම සඳහා ඉඩ සළසමින් ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් විසින් ආයෝජකයින් සමඟ ඍජුවම සම්බන්ධ වෙමින් විදේශීය දූත මෙහෙයන් ගණනාවක් සිදුකර ඇත. මෙම ආයෝජකයින් සඳහා වෙන් වෙන්ව මැදිහත් වීම නිසා විභව්‍ය ආයෝජකයින් අතර විශ්වාසය ඇති වූ අතර උනන්දුව වැඩි විය.

සෞදි - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසම (2023 මැයි 21-23) **(Saudi-SriLanka Joint Committee)**

2023 වසරේ 2023 දී අත්සන් කරන ලද මූලික ගිවිසුම යටතේ ස්ථාපිත සෞදි - ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමේ පළමු සැසිවාරය 2023 මැයි 21 සිට 23 දක්වා සෞදි අරාබියේ රියාද් නුවරදී පැවැත්විණි. විදේශ කටයුතු අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, තාක්ෂණ අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල සහ කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත ශ්‍රී ලංකීය දූත කණ්ඩායමක් මේ සඳහා සහභාගි විය. මෙම සංචාරයේ දී, දෙරටේ විදේශ කටයුතු අමාත්‍යාංශ අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලද අතර දෙරටට ම අන්‍යොන්‍ය වශයෙන් වැදගත් වන කරුණු පිළිබඳව සොයා බලා සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් සැපයීම එහි අරමුණ විය.

දකුණු ආසියාව සහ අග්නිදිග ආසියානු ව්‍යාපාරික නායක සමුළුව (2023 ජූනි 27-29)

දකුණු ආසියාව සහ අග්නිදිග ආසියානු ව්‍යාපාරික නායක සමුළුව "Share the Opportunities of the Era, Create Prosperity of the Region" යන තේමාව යටතේ 2023 ජූනි 27 සිට 29 දක්වා පැවැත්විණ. මෙම සමුළුවේදී Belt and Road Initiative සහ නව බටහිර ගොඩබිම-මුහුදු කොරිඩෝව ඉදිකිරීම වැනි මූලික කාර්යයන් කෙරෙහි අවධානය යොමුකරමින් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ආර්ථික සහ වෙළඳ සහයෝගීතාවන් සඳහා ඇති විභව්‍යතාවය සොයා බලනු ලැබීය. චීනය සහ දකුණු හා අග්නිදිග ආසියානු රටවල් අතර සහයෝගිතාවය, ආර්ථික සහ වෙළඳ හුවමාරුවන් ප්‍රකර්ශනය සඳහා සවිමත් පදනමක් ඇති කර තිබේ.

චීනයේ පැවති ආයෝජන, වෙළඳ සහ සංචාරක සංසදය (2023 ඔක්තෝබර් 16)

අනාගත ව්‍යාපාරික අවස්ථාවන් දිරිමත් කිරීම, මෙරට හරිත සහ ඩිජිටල් ආර්ථික ව්‍යාපාර සම්බන්ධයෙන් රටේ කැපී පෙනෙන දියුණුව පිළිබඳව ඉස්මතු කරමින් ශ්‍රී ලංකාව උපායමාර්ගික මධ්‍යස්ථානයක් ලෙස දැකීමට චීන ආයෝජකයින් උනන්දු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා සහ විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) 2023 ඔක්තෝබර් 16 දින චීනයේ පැවති මෙම ප්‍රමුඛ ආයෝජන, වෙළඳ සහ සංචාරක සංසදය සඳහා සහභාගි විය. දැනටමත් ශ්‍රී ලංකාවේ ආයෝජන සිදුකර ඇති සහ මෙරට ආයෝජන අවස්ථා පිළිබඳ විමසිලිමත් චීන සමාගම් මෙම සංසදය සඳහා සහභාගි විය.

ජාත්‍යන්තර සමුළු සඳහා සහභාගිත්වය

එක්සත් ජාතින්ගේ ආසියා ශාන්තිකර නවෝත්පාදන සංසදය: චීනයේ ෂියාමෙන්



තිරසර සංවර්ධනය සඳහා ඩිජිටල් ආර්ථික අංශයේ සෘජු විදේශ ආයෝජන වැඩි කිරීමට ආයෝජන සහ වෙළඳාම සඳහා චීන ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය පැවති කාලය තුළ, 2023 සැප්තැම්බර් 9 වන දින චීනයේ ෂියාමෙන්හි පිහිටි ෂියාමෙන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ දී එක්සත් ජාතින්ගේ ආසියා ශාන්තිකර නවෝත්පාදන සංසදය පවත්වනු ලැබීය.

ආසියා සහ ශාන්තිකර කලාප සඳහා වන එක්සත් ජාතින්ගේ ආර්ථික සහ සමාජ කොමිසම (ESCAP) සහ තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ ප්‍රගතිය වේගවත් කිරීම සඳහා විද්‍යාව, තාක්ෂණය, සහ නවෝත්පාදන ප්‍රතිපත්ති භාවිතා කිරීම සඳහා ආසියා ශාන්තිකර රටවල ධාරිතාවන් ඉහළ නැංවීම සඳහා වන ආසියා ශාන්තිකර නවෝත්පාදන සංසදයේ දෙවන පියවර වන ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන ලෝක සංවිධානය විසින් මෙම සංසදය සමසංවිධානය කරන ලද අතර මෙම සංවිධාන දෙකම චීන රජය විසින් අධාර සපයන ESCAP ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිලාභීන් විය.

ඩිජිටල් ව්‍යාපාර මගින් සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රවර්ධනය කිරීම පිළිබඳ 3 වන සැසිවාරය සඳහා අයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය සහභාගි වූ අතර ඉන් අනතුරුව නියෝජිතයින් සමඟ සාකච්ඡා/ ප්‍රශ්න සහ පිළිතුරු සැසිවාරය පැවැත්විණ. මෙම සැසි වාරයේදී ඩිජිටල් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා FDI යොදාගත හැක්කේ කෙසේද, මෙම ක්ෂේත්‍රයේ FDI ආකර්ෂණය කරගැනීම සඳහා ශ්‍රී ලංකාව භාවිතා කරන උපායමාර්ග, ශ්‍රී ලංකාවේ ඩිජිටල් FDI ආකර්ෂණය කිරීමේ ආයෝජන අවස්ථා සහ මේ සම්බන්ධයෙන් මුහුණදෙන අභියෝග ජයගන්නේ කෙසේද යන්න කෙරෙහි අවධානය යොමුකරන ලදී.

වෙළඳාම, ආයෝජන, ව්‍යාපාර සහ නවෝත්පාදන ව්‍යාපාර පිළිබඳ කමිටුව - **UNESCAP**



වෙළඳාම, ආයෝජන, ව්‍යාපාර සහ නවෝත්පාදන ව්‍යාපාර පිළිබඳ කමිටුවේ ආරම්භක සැසිය 2023 පෙබරවාරි 22-24 දිනයන්හි දී බැංකොක්හි එක්සත් ජාතින්ගේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. මෙම කාල සීමාව තුළ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා පහසුකම් සැළසීම අරමුණු කර ගෙන විවිධ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා ESCAP සහ ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන ලෝක සංවිධානය (WAIPA) සමඟ සහයෝගීතාවය ඇතිකර ගනු ලැබීය. කලාපීය ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනවල ඒකරාශී වීමත්, තිරසර සංවර්ධනය සහ ඩිජිටල් ආර්ථික ආයෝජනය සඳහා ආයෝජන ප්‍රවර්ධනය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැඩමුළු දෙකක් සහ ආසියා ශාන්තිකර ඩිජිටල් ආර්ථිකයේ FDI ප්‍රවර්ධනය කිරීම පිළිබඳ FDI ප්‍රතිපත්ති මාර්ගෝපදේශ එළිදැක්වීම ඇතුළු ක්‍රියාවන් ගණනාවක් මෙම වැඩසටහන් සඳහා ඇතුළත් විය.

ඉන් අනතුරුව වෙළඳ, ආයෝජන, සහ ව්‍යාපාර නවෝත්පාදන අන්තර්-රාජ්‍ය කමිටු සැසිවාරයේ දී තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සඳහා ආයෝජන ස්ථානගත කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. තිරසර සංවර්ධනය සඳහා සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සළසමින් සහ දේශගුණික විපර්සාස සඳහා පිළියම් යෙදීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ ඩිජිටල් ආර්ථිකය තුළ සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කරමින් ආසියා ශාන්තිකර කලාපයේ ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන අතර සංවාද දිරිමත් කිරීම, UNESCAP සහ WAIPA අතර සහයෝගීතාවයේ අරමුණවේ. මෙම ජාත්‍යන්තර එකතුවේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ (පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන) විසින් ආයෝජන ස්ථානගත කිරීමේ බලපෑම තිරසර සංවර්ධනය සඳහා සෘජු විදේශ ආයෝජන සහ තිරසර සංවර්ධනය සඳහා 2023 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී.

ජාත්‍යන්තර ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කිරීම



SLTFTA

ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA)

2018 වසරේ සිට වසර හතරක කාලයක් නතරව තිබූ ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) පිළිබඳ සාකච්ඡා 2023 ජනවාරි මස නැවත ආරම්භ වූ අතර 2023 දෙසැම්බර් මාසයේ දී නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා නිමවීමත් සමඟ 2024 පෙබරවාරි 3 වන දින රටවල් අතර අත්සන් කරන ලද මෙම ගිවිසුම සම්බන්ධයෙන් 2023 වසරේදී සාකච්ඡා වට හතක් පැවැත්විණි. භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA), රේගු සහ ආර්ථික සහයෝගීතාවය, බුද්ධිමය දේපළ, ප්‍රභවස්ථාන රීති සහ සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක ක්‍රියාමාර්ග ඇතුළුව වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ සියලු කරුණු ආවරණය කරමින්, ශ්‍රී ලංකාව විසින් අත්සන් කරන ලද දෙවන විස්තීරණ නිදහස් වෙළඳ ගිවිසුම වේ.

අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ජාතික වෙළඳ සාකච්ඡා සම්මුති කමිටුවේ සමාජිකයෙකු වශයෙන් ක්‍රියාකරන අතර ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කමිටුවේ සභාපතිවරයා ද වේ. මීට අමතරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙළඳ හා සේවා සහ ප්‍රභවස්ථාන රීති පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම ද නියෝජනය කරයි.



SL - India ETCA

ශ්‍රී ලංකා ඉන්දියා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම/ශ්‍රී ලංකා ඉන්දියා ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම

2018 දී කොළඹ පැවති 11 වන වටයේ සිට නැවත සාකච්ඡා ආරම්භ කරමින්, ශ්‍රී ලංකා ඉන්දියා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුමේ (SL - India ETCA) 12 වන සාකච්ඡා වටය 2023 ඔක්තෝබර් මාසයේදී කොළඹ දී පැවැත්විණි. සේවා වෙළඳාම සහ ප්‍රභවස්ථාන රීති පිළිබඳ සාකච්ඡා සම්බන්ධයෙන් නිල නියෝජනය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතුය.

ඊට සමගාමීව අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත කණ්ඩායමක් සමඟ 2023 දෙසැම්බර් මාසයේදී දෙරට අතර ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම පිළිබඳ මූලික සාකච්ඡා නැවත ආරම්භ කරන ලදී.



TIFA

එක්සත් රාජධානිය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳාම සහ ආයෝජන මූලික ගිවිසුමේ (TIFA) 14 වන කවුන්සිල රැස්වීම

එක්සත් රාජධානිය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳාම සහ ආයෝජන මූලික ගිවිසුමේ (TIFA) 14 වන කවුන්සිල රැස්වීම 2023 සැප්තැම්බර් මාසයේදී කොළඹ දී පැවැත්විණ. වෙළඳාම, ආයෝජනය, රේගුව, කම්කරු, බුද්ධිමය දේපළ, කෘෂිකර්මාන්තය සහ අනෙකුත් අදාල අංශවල විශේෂඥ දැනුමැති නිලධාරීන්ගෙන් සමන්විත දෙරටෙහි දූත කණ්ඩායම් තාක්ෂණික මට්ටමේ සාකච්ඡා සඳහා සහභාගි විය. මෙම සාකච්ඡාවලදී ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආයෝජන සම්බන්ධ පුළුල් පරාසයක මාතෘකා පිළිබඳව දෙපාර්ශවය විසින් නැවත සළකා බලනු ලැබීය. රටේ ආයෝජන වාතාවරණය කෙරෙහි බලපාන ප්‍රතිපත්ති, මෑතකාලීන කම්කරු ප්‍රතිසංස්කරණ. බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම හා බලාත්මක කිරීම, රේගුව සහ වෙළඳාම සඳහා පහසුකම් සැළසීම මෙන්ම ඇඟළුම්, මැණික්, ස්වර්ණාභරණ සහ කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳාම සහ ඒවායේ වෙළඳපල ප්‍රවේශය සඳහා තාක්ෂණික බාධාවන් පිළිබඳ සාකච්ඡා මීට ඇතුළත් වේ.

මෙරට ආර්ථික වර්ධනය සඳහා අධාරවීමේ දී සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීමේ දී ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ දැඩි දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය කාර්යයන් සේ හඳුනා ගනු ලැබූ දෙපාර්ශවයම මෙකී ක්‍රියාවලින්හි වැදගත්කම අවධාරණය කරනු ලැබීය. මෙම වැඩසටහන නියෝජනය කළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය සහ විධායක අධ්‍යක්ෂ (පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන) ද්විපාර්ශ්වික සාකච්ඡා සඳහා ද සහභාගි වූහ.

ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ කටයුතු කිරීම

USAID සමඟ සහයෝගීතාවය

සමෘද්ධිමත්භාවය දිරිමත් කිරීම, සමස්ත ආර්ථික සංවර්ධනය උසස් කිරීම, සෘජු විදේශ ආයෝජන සඳහා සහයදීම, සහ විවිධ උපායමාර්ග හරහා ආර්ථික උත්පාත හා අවපාත හමුවේ රටේ සම්පත් යෙදවීම ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනය (USAID), PARTNER ව්‍යාපෘතිය සමඟ සහයෝගීතාවය ගොඩනඟා ගනු ලැබීය. මෙය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම Deloitte Consultancy LLC විසින් අධීක්ෂණය කරනු ලැබේ. මෙම කාර්යයේ සංරචකයක් ලෙස, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා තාක්ෂණ සහය සැපයීමට සහ ආයෝජන ප්‍රවර්ධනය, ආයෝජන සඳහා පහසුකම් සැළසීමට සහ ආයෝජන හා අදාල පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන ලබාදීමට USAID කැපවී සිටී.


UNDP සමඟ කටයුතු කිරීම

ආයෝජන සඳහා කඩිනමින් පහසුකම් සැළසීමේ අවශ්‍යතාවය සහ ව්‍යාපාර සඳහා පහසුකම් සැළසීම වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) සහය අපේක්ෂා කර ඇත. වඩා ඉක්මන් සේවා සැපයුමක් සඳහා නියාමන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම මගින් ආයෝජක මෙහෙයුම් ක්‍රමවත් කිරීම මෙහි අරමුණයි. ආයෝජන මණ්ඩලයේ ක්‍රියාකාරකම් වේගවත් කිරීම සඳහා අනුමත කිරීමේ ලිපි නිකුත් කිරීම ඇතුළුව ආයෝජන මණ්ඩලයේ අනුමත කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ අනෙකුත් ප්‍රයත්නයන් සමගින්, BOI සහ UNDP සහයෝගිතාවය ඇතිව ආයෝජකයින් සහ නීති වෘත්තිකයින් සඳහා පහසුකම් සැළසීම පිණිස මූලික ගිවිසුමක් සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. මීට අමතරව, ජාත්‍යන්තර ආයෝජන ක්‍රියාකාරකම් සහ විකල්ප ආරවුල් නිරාකරණය කිරීමේ (ADR) යාන්ත්‍රණ ඇතුළුව ආරවුල් නිරවුල් කිරීමේ යාන්ත්‍රණ පිළිබඳව ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධන කාර්යයන් ආරම්භ කර ඇත.

UNESCAP සමඟ සහයෝගීතාවය

ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ආයතනික හැකියාවන් ඉහළ නැංවීම අරමුණු කර ගෙන ශ්‍රී ලංකාවට සහය වීමට UNESCAP කැපවී සිටී. මෙම සහයෝගීතාවයේ කොටසක් ලෙස UNESCAP විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා ඩිජිටල් සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ ආරම්භයන් ඇතුළත් උපායමාර්ගයක් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික සහය ලබාදේ. ඩිජිටල් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීමේ උපායමාර්ග සහ ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම සඳහා තාක්ෂණික සහය ලබාදීම මීට අයත්වේ. මීට අමතරව, මෙම ක්ෂේත්‍රයේ ආයෝජන මණ්ඩලයේ හැකියාවන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කිරීමේ නිපුණතා ගොඩනැගීමේ සැසි සඳහා UNESCAP පහසුකම් සළසයි.

ආයෝජකයින්ගේ අදහස්




Mr. Roland Karl Scheube

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ,
ආර්කේඑස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්

ජර්මනියේ සිට ශ්‍රී ලංකාවේ මෙහෙයුම් සිදුකළ ක්‍රම්ස්කි ලංකා හි ක්‍රම්ස්කි මහතා, රිදී ආභරණ නිෂ්පාදන කම්හලක් මෙරට පිහිටුවීමට මා දිරිමත් කළේය. 1998 දී මෙරටට පැමිණි මම සති දෙකක් ඇතුළත කටුනායක අපනයන සැකසුම් කලාපය තුළ පිහිටි මේ සඳහා සුදුසු ඉඩමක් කඩිනමින් හඳුනා ගත්තෙමි. ඉඩම හඳුනා ගැනීමේ සිට කර්මාන්ත ශාලාව ආරම්භ කිරීම දක්වා සති හයක් ඇතුළත සිදු වූ සමස්ත ක්‍රියාවලියම ඉතා කාර්යක්ෂම විය. ක්‍රියා පටිපාටි සරල වූ අතර, නිෂ්පාදන ක්‍රියාවලිය ස්ථාපිත කිරීම සහ විධිමත් කිරීම පිළිබඳ මගේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේදී ඊට සම්බන්ධ වූ සියළු දෙනාගෙන් මට ලැබුණු සහයෝගය ප්‍රශංසනීය විය.

ආදරණීයයන්ගේ අළු කාවද්දා රිදී ආභරණ නිර්මාණය කිරීමේ විශේෂත්වයකින් යුත් අපගේ කර්මාන්ත ශාලාව, ගෝලීය වශයෙන් තරඟකාරී මිල ගණන් පිරිනමනු ලැබීය. දේශීය ශ්‍රම බලකාය උසස් මට්ටමේ ඉගෙනීමේ සහ පුහුණු කිරීමේ හැකියාවක් පෙන්නුම් කළේය. රටේ සාර්ථකත්වයට අඛණ්ඩ දායක වෙමින් මෙහි රැඳී සිටීමින් අප වැනි සමාගම්වලට දායක වීමටත් සලකා බලන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින අතර නිරන්තර විදේශයන්හි අවස්ථා සොයන සුදුසුකම් ලත් ශ්‍රී ලංකීය පුද්ගලයින්ට මගේ ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකාව ගවේෂණය කිරීම සඳහා අපූරු රටක් බව මාගේ අදහසයි.



Mr. Pierre Pringiers

සභාපති
ඕෂන් වොයේජර් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්

මා විසින් ආරම්භ කරන ලද සාර්ථක ටයර් නිෂ්පාදන ව්‍යාපෘති දෙකක් සමඟින්, BOI හරහා ශ්‍රී ලංකාවේ සාර්ථක ව්‍යවසායකයෙකු සහ ආයෝජකයෙකු ලෙස 1980 දශකය මුලදී මගේ ගමන ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ ඇති විදේශ ආයෝජකයින්ගේ අභිරුචිය සහ අවශ්‍යතා ප්‍රමුඛතාව ලබාදෙමින්, අනෙකුත් සියළු ආයතන සමඟ කටයුතු කිරීම සඳහා පහසුකම් සළසන ආයතනයක් වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින්, ව්‍යාපාර සාර්ථක කරගැනීම සහ අභිවර්ධනය සඳහා සළසන අඛණ්ඩ සහය හේතුවෙන් මෙම ව්‍යාපෘති මගින් ශ්‍රී ලංකාවට ලෝක සිතියමේ කාර්මික ටයර් නිෂ්පාදනයේ ප්‍රමුඛ ස්ථානයක් හිමි වී ඇත. අද දින මා සතු ව්‍යාපෘති කීපයක් කෙරෙහිම මිචලින් සහ යොකෝහාමා වැනි විශාල බහුජාතික සමාගම්වල උනන්දුව සහ අවධානය යොමුවී ඇති අතර එමගින් ශ්‍රී ලංකාවට මෙන්ම රාජ්‍ය නියෝජිතායතනයක් ලෙස BOI මගින් ලබාදුන් කාර්යක්ෂම, නම්‍යශීලී සේවාව කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය පෙන්නුම් කර ඇත.

වසර 45කට පෙර එහි ආරම්භයේ සිටම, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විදේශීය ආයෝජකයින්ට සහ ව්‍යවසායකයින්ට සහයෝගයක් ලබාදෙමින් විශ්වාසනීය අයුරින් අපගේ අපේක්ෂාවන් ඉටු කර ඇති අතර, මුල් ගිවිසුම් මගින් සහ ආනුශංගික පුළුල් කිරීම් අනුව එකඟ වූ කොන්දේසිවලට අනුකූල වෙමින් එම මාවතේම ඉදිරියට ගමන් කරයි.

ටයර් ව්‍යාපාරයෙන් ඉවත්ව වූ දා සිට අපනයනය සහ ශ්‍රී ලංකාවේ නාවුක සංචාරක කර්මාන්තය දියුණු කිරීම සහ ජාත්‍යන්තර වෙළඳපල සඳහා වෙරළබඩ මගී බෝට්ටු සහ බහු දින මගී යාත්‍රා නිෂ්පාදනය කරන සමාගමක් වන Sea Leisure Yachting Group හි හවුල්කාර සමාගමක් වන ඕෂන් වොයේජ් ඉන්ටර්නැෂනල් හි නව සමාගමක් ලෙස අප පවුලේ ඊළඟ පරම්පරාවේ ව්‍යාපාරයක් ඔස්සේ නව අංශයක ආයෝජනය කිරීම ආරම්භ කිරීම සඳහා මා දැනටමත් මේ සඳහා සුදුසු ස්ථානය ලෙස ශ්‍රී ලංකාවත්, ඉක්මනින් කාර්යයන් සිදුකරන නියෝජිතායතනය ලෙස ආයෝජන මණ්ඩලයත් තෝරාගෙන ඇත.



Mr. Sandro Veronesi
ප්‍රාරම්භක සහ සභාපති
ඔනිවර්ස් - ඉතාලිය


ඔනිවර්ස් යනු 1896 දී පිහිටු වන ලද බහු සන්නාම ඉතාලි සමාගමකි. මේ වනවිට මෙම මෙම සමූහ ව්‍යාපාරයට Calzedonia" Intimissimi" Intimissimi Uomo" Tezenis" Tezenis Kids" Falconeri" Atelier Emé" සහ Antonio Marras යන මෝස්තර සන්නාමවලට හිමි ජාත්‍යන්තර නියෝජනයක් හිමිව ඇත. මෙම සමූහ ව්‍යාපාරය Signorvino, Tenimenti Leone, La Giuva, සහ Podere Guardia Grande සන්නාමයන් හරහා ආහාර සහ වයින් නිෂ්පාදන කර්මාන්තයේ ක්‍රියාශීලීව නියළී සිටින අතර මෑතකාලීන අත්පත්කර ගැනීම සමඟ Grand SoleilYachts, Pardo Yachts සහ VanDutch Yachts වන සන්නාම සමග නාවුක කර්මාන්තයේ නියළේ. අපගේ පළමු සන්නාමය ප්‍රධාන වශයෙන් බ්‍රෙසියර සහ කාන්තා උඩුකය ඇඟළුම් සහ යට ඇඳුම්, මේස්, අළෙවිය සඳහා ජනප්‍රිය විය. 1990 මැද භාගයේදී අපගේ දෙවන සන්නාමය වන "Intimissimi" හඳුන්වා දීමත් සමඟ අපගේ අලෙවිය වර්ධනය වීම ආරම්භ වූ අතර ප්‍රමිතිය, මිල, වඩාත් හොඳින් පාලනය කිරීම, නිෂ්පාදන නියමිත වේලාවට සැපයීම සහ වැඩ තත්ත්වයන් සෘජුවම කළමනාකරණය කිරීම සහ සේවකයින්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා අපටම අයත් නිෂ්පාදන පහසුකමක අවශ්‍යතාවය දැනුණි.

1998 දී අපටම අයත් නිෂ්පාදනයක් ආරම්භ කිරීම සඳහා සුදුසු ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව හඳුනා ගනු ලැබූ අතර 1999 දී අප සමූහ ව්‍යාපාරයේ ඔමේගා ලයින් ආරම්භ කරනු ලැබීය. මේ වන විට අප විසින් නෛතික ආයතන 4ක ආයෝජනය කර ඇත. එනම් කර්මාන්තශාලා 7 ක් සමඟින් ඔමේගා ලයින්, සිරියෝ, ඇල්පා ඇපරල්ස් සහ බෙන්ජි ලිමිටඩ් නව සමාගම්ය. වර්තමානයේ අප ආයතන සතු සේවක සංඛ්‍යාව 15,500 ක් වන අතර අප කර්මාන්ත ශාලාවල නිෂ්පාදනය කරන ඇඟළුම්වලින් 60% කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ නිපදවයි.

ශ්‍රී ලංකාවේ අපගේ මෙහෙයුම් අපගේ සමස්ත වර්ධනය පිටුපස ඇති අප ඉදිරියට ගෙනයන බලය වේ. වසර ගණනාවක් තුළ අප සමූහ ව්‍යාපාරයට අළෙවි සැල් 5,600 කට වැඩි ප්‍රමාණයක් විවෘත කිරීමේ හැකියාව ලැබී ඇති අතර එකී සහය ඉතා තීරණාත්මක සාධකයක් වේ.

අප විසින් මේ වනවිට ඇ.ඩො. මිලියන 350 ක් ආයෝජනය කර ඇති අතර තවමත් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරමින් සිටී. ශ්‍රී ලංකීය සේවකයින් ඉතාලි ජාතික තාක්ෂණ කාර්ය මණ්ඩලයේ සහය ඇතිව ඉක්මණින් ඉගෙන ගන්නා අතර ශ්‍රී ලංකාවේ සමාගම්වල වර්ධනය සඳහා ඔවුන්ගේ උපරිම සහය ලබාදේ.

අවාසනාවට මෙරටට වසර 2-3 ක අසීරු කාලයක් ගෙවීමට සිදු වූ නමුත් ආයෝජන වාතාවරණය යම් පමණක නැගී ඒමක් ආරම්භ වී ඇති අතර, ඉදිරියේදී ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකාව ආයෝජකයින් බොහෝ දෙනෙක් ආකර්ෂණය කරන ආයෝජන ගමනාන්තයක් වනු ඇතැයි මාගේ අපේක්ෂාවයි.



Mr. Joachim Vets
ප්‍රධාන විධායක නිලධාරි
ලයිඩීස් ඩයමන්ඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ්

ලයිඩීස් ඩයමන්ඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ්හි ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවුඩය ලබාදීමට හැකිවීම ගෞරවයකි. වසර 30 ක පමණ කාලයක සිට ආයෝජන මණ්ඩලයේ අනුමැතිව ලද ආයතනයක් වන අප සමාගම, මෙම සුන්දර දිවයින තුළ දියමන්ති කැපීම සහ ඔපදැමීමේ කර්මාන්තයේ නියළී සිටී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ලබාදුන් නොමඳ සහය අපගේ සාර්ථකත්වය සඳහා බෙහෙවින් ඉවහල් විය. පසුගිය කෝවිඩ් 19 වසංගතය පැවති අභියෝගාත්මක කාලය තුළ බාධාවකින් තොරව අබණ්ඩව අපගේ මෙහෙයුම් සිදුකිරීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් හඳුන්වා දුන් ක්‍රියාවලි සහ ලබාදුන් සහයෝගය මගින් මෙය විශේෂයෙන්ම පැහැදිලි විය.

බෙල්ජියම් ජාතිකයින්ට හිමි, ඔවුන් විසින් මෙහෙයුම් කරන ලද අප සමාගම, නිරන්තරයෙන් උසස්ම තත්ත්වය සහ විශිෂ්ඨත්වය පවත්වා ගැනීම සඳහා ඉහළම ප්‍රමිතීන් පවත්වා ගෙන ඇත. අප දේශීය ආර්ථිකයට පමණක් නොව ව්‍යාපාරික ක්‍රියාවලි සහ ප්‍රජා සහභාගිත්වය තුළින් බෙල්ජියම සහ මෙරට අතර සංස්කෘතික හුවමාරුව සඳහා ද දායක වී ඇත.

හිතකර ව්‍යාපාරික පරිසරයක් දිරිමත් කිරීමේ ආයෝජන මණ්ඩලයේ කැපවීම නිසා අපට අපගේ මෙහෙයුම් ශක්තිමත්ව ඉදිරියට ගෙනයාමට සහ පුළුල් කිරීමට හැකිව තිබේ. තවදුරටත් ආර්ථික සංවර්ධනයට මෙන්ම මෙරට දියමන්ති කර්මාන්තයේ සංවර්ධනයට දායක වෙමින්, ඉදිරියේදීත් මෙම සහයෝගීතාවය ශක්තිමත්ව ඉදිරියට ගෙනයාම අපගේ අපේක්ෂාව වේ. ඔබගේ අබණ්ඩ සහයෝගිතාවයට කෘතඥ වෙමු.



Mr. Mark Moffati
ප්‍රධාන විධායක නිලධාරි
IFS

ගෝලීය වශයෙන් IFS ලද සාර්ථකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකාව ඉතා වැදගත් විය. අබණ්ඩව වසර හයක්ම ද්වි සංඛ්‍යාත්මක වර්ධනයක් සහ ඇ.ඩො. බිලියන 10 ක් ඉක්මවන වෙළඳපළ අගයක් වාර්තා කරමින්, අප ලොව වේගයෙන්ම වර්ධනය වන ව්‍යවසායයන්ගෙන් එකක් වන්නෙමු. අප ලෝකය බල ගැන්වීම සඳහා සේවා සපයන සමාගම් සඳහා කෘතිම බුද්ධියෙන් බල ගැන්වෙන ERP, EAM සහ FSM ව්‍යවසාය යෙදවුම් තාක්ෂණ විසඳුම් ලබාදීම මගින් ව්‍යාපාරික මෙහෙයුම් සුමටව සහ කාර්යක්ෂම සිදුකර ගෙන යාමට උපකාරීවේ. ශ්‍රී ලංකීය ජනතාවගේ විශිෂ්ඨ දක්ෂතා, වැඩකිරීමේ විනය සහ සංස්කෘතිය අපගේ විසඳුම් වැඩිදියුණු කිරීමේදී සහ සමාගමේ වර්ධනය සඳහා මූලික කාර්ය භාරයක් ඉටුකර ඇත.

සේවකයින් 26 දෙනෙකු සමඟින් 1997 දී මෙරට ආරම්භ කරන ලද අප ව්‍යාපාරය දැන් බලාගාරයක් බවට වර්ධනය වී ඇත. අප දැන් 2,600 කට අධික සේවක සංඛ්‍යාවක් සහිත මෙරට විශාලම ගමනාන්ත තාක්ෂණ (destination technology) සේව්‍යයා වන්නෙමු. කැපී පෙනෙන මෘදුකාංග ඉංජිනේරු දක්ෂතා සහ මෙරට පවතින ප්‍රත්‍යාස්ථිතිය පෙන්නුම් කරමින්, ලොව පුරා පැතිරුණු නිෂ්පාදන සහය සහ ගෝලීය පර්යේෂණ සහ සංවර්ධන මෙහෙයුම්වලින් සැළකිය යුතු ප්‍රමාණයක් කොළඹ සිට ක්‍රියාත්මක වේ. මෙලෙස වසර ගණනාවකට පෙර සිටම, IFS ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි ඉන්ප්‍රෙසිව් මෘදුකාංග සහ ඉංජිනේරු පුහුණුව මෙන්ම උපාධිධාරීන්ගේ භාෂා හැකියාවන්හි විශාල විභවතාවක් දකිනු ලැබීය. ශ්‍රී ලංකීය මෘදුකාංග ඉංජිනේරුවන්ගේ තත්ත්වය සහ දායකත්වය ලොව පුරා පිළිගැනීමට ලක්වීම පුදුමයක් නොවේ. 2030 වසර වන විට අප විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇ.ඩො. බිලියනයකට වැඩි ප්‍රමාණයකින් දායකවීමට හැකිවනු ඇත.


අබණ්ඩව ශ්‍රී ලංකාවේ අපගේ ආයෝජනය කිරීමට කැපවී සිටින අතර මීළඟ වාරයේ තවත් සේවක සංඛ්‍යාව 1000 කින් වැඩි කිරීමට සැලසුම්කර කරනු ලැබේ. ශ්‍රී ලංකාව සහ මෙරට ජනතාව සෑමවිටම අප සමාගමේ අත්‍යාවශ්‍ය පාර්ශවයක් වනු ඇත.











ආයෝජකයින් ඇගයීම

හේලීස් ෆැබ්රික් පීඑල්සී (Hayleys Fabric PLC)



මෑතකදී තායිලන්තයේ පැවති ESG World Summit and Growth, Resilience, Innovation and Talent (GRIT) සම්මාන උළෙලේදී "Best SDG Impact Award" සම්මානයෙන් පිදුම් ලැබීම හේලීස් සමූහ ව්‍යාපාරයේ ප්‍රධාන රෙදිපිළි නිෂ්පාදන සමාගම වන හේලීස් ෆැබ්රික් පීඑල්සී හි තිරසර සංවර්ධන ගමන් මගෙහි තවත් එක් ප්‍රධාන සංධිස්ථානයක් විය.

කලාපයේ ප්‍රමුඛ තිරසර සංවර්ධන උපදේශක ආයතනයක් වන කෝප්ස්ටේජ් සහ පර්යේෂණ පදනම විසින් සංවිධානය කරන ලද මෙම සම්මාන උළෙලේ අරමුණ වන්නේ පාරිසරික, සමාජීය සහ රාජ්‍ය (ESG) ක්‍රියාවලි හරහා තිරසර ලෝකයක් වෙත දැවැන්ත පියවර තබන නැගී එන සමාගම් පිළිගැනීමට ලක්කරමින් ව්‍යවසායකත්වය සහ හරිත ආරම්භයන් දිරිමත් කිරීමයි.

ටිකිරි ටෝයිස්

වසරේ හරිත සම්මානය (Green Brand of the Year)



අන් කවරදාටත් වඩා පාරිසරික ගැටළු සම්බන්ධයෙන් සැළකිළිමත් වන වර්තමානයේ, මෙම මිහිතලය පිළිබඳව කණගාටුවීමට සහ ඒ සම්බන්ධයෙන් වඩාත් කාරුණිකව සිතාබැලීමට පෙළඹවමින්, වායු දූෂණය, සාගරයන්හි ඇති ප්ලාස්ටික්, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම සහ ආහාර නාස්තිය ප්‍රධාන තර්ජනයන් අතර වේ. පාරිසරික ආරක්ෂණය ගැන සළකා මිලියන ගණන් මිනිසුන් මිල අධික වුවත් පරිසර හිතකාමී නිෂ්පාදන මිළදී ගැනීම ආරම්භකර ඇත. හුදෙක්ම ආදායම ඉපයීම පමණක් නොව පරිසරයට හැකි පමණ අවම බලපෑමක් ඇති කරන ව්‍යාපාරික ක්‍රියාවලියන් හරහා වාණිජ අරමුණු තුලනය කිරීමට ටිකිරි ටෝයිස් සමාගම විසින් සිය මෙහෙවර සහ ක්‍රියාවලි වෙනස්කර ඇත්තේ කෙසේද යන්න සඳහා පිළිගැනීමක් ලබාදීම මෙම සම්මානයේ අරමුණ වේ.

වසරේ අපනයන සන්නාමය (Export brand of the Year)



ටිකිරි ටෝයිස් සමාගමේ ගෝලීය වෙළඳපල ප්‍රවේශය සහ උපායමාර්ගික වෙළඳපල ඉලක්ක කිරීම අගයමින් වසරේ හොඳම අපනයන සන්නාමය යන සම්මානය පිරිනමනු ලැබීය. මෙම සමාගම ඉලක්කගත වෙළඳපලෙහි සිය සන්නාමය ප්‍රචලිත කිරීමේ ක්‍රියාමාර්ග මගින් කර්මාන්තයේ අනන්‍ය සළකුණක් බවට පත්වෙමින් ලෝකයේ විවිධ කලාපයන්ට අනුගතවීමේ සහ හඹායාමේ හැකියාව පෙන්නුම් කරයි. සෑම ඉලක්කගත වෙළඳපලක් මගින්ම මෙම සමාගමේ ජාත්‍යන්තර වෙළඳපලට පිවිසීමේ හැකියාව පෙන්නුම් කරමින්, විවිධ අංශ තුළ ශක්තිමත්ව සහ සාර්ථක ලෙස අඛණ්ඩව ඉදිරියට යාමේ විභව්‍යතාව කැපී පෙනේ.

මාස් හෝල්ඩින්ග්ස්

මාස්: ඕෂන් ස්ට්‍රේනර් (Ocean Strainer)

මාස් හෝල්ඩින්ස් ආයතනයට අයත් මාස් ඕෂන් ස්ට්‍රේනර් සමාගම “Water Category of Fast Company's 2022 World Changing Ideas Awards” සම්මාන උළෙලේ අවසන් වටයට නම් කරන ලදී. හරිත තාක්ෂණය, නව අදහස් මතින් ආයතනය ඉදිරියට ගෙනයාමේ ආරම්භයන්, නගර සහ ගොඩනැගිලි සඳහා නව සැලසුම් සහ ධනාත්මක සමාජීය නවෝත්පාදනයන් සඳහා සහය වන අනෙකුත් නිර්මාණාත්මක කාර්යයන්, සමාජ විෂමතාව, පාරිසරික විපර්යාස, සහ මහජන සෞඛ්‍යය ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සම්මාන පිරි නමමින් Water Category of Fast Company's 2022 World Changing Ideas Awards සම්මාන උළෙලේ ජයග්‍රාහකයින් ප්‍රකාශයට පත්කරනු ලැබීය. ඕෂන් ස්ට්‍රේනර් සමාගම විසින් නියමු ව්‍යාපෘතියක් ලෙස දෙහිවල ඇළ මාර්ගයේ කැළිකසල එකතු කිරීමේ බාධකයක් ඉදිකරන ලද අතර 2020 අගෝස්තු මස එහි ආරම්භයේ පටන් එම සමාගම විසින් ස්වේච්ඡාවෙන් ඒ සඳහා හවුල්කාරී වූ ආයතන හරහා රට පුරා අනෙකුත් ස්ථාන අටක් සඳහා ද මෙම කාර්යය පුළුල් කරනු ලැබීය.



නොයොන් ලංකා: තිරසාරබව (Sustainability)

දකුණු ආසියාවේ විශාලම ඇඳුම් නිෂ්පාදකයා වන මාස් (MAS) හෝල්ඩින්ස් සමාගමේ අනු සමාගමක් ලෙස ක්‍රීඩා ඇඳුම් මෙන්ම කාන්තා යට ඇඳුම්, රාත්‍රී ඇඳුම් සහ කාන්තා සෞඛ්‍යට අවශ්‍ය භාණ්ඩ නිපදවීමට අවශ්‍ය උසස් තත්ත්වයේ රෙදි දක්වා විශාල පරාසයක ගෙතූ රෙදි නිපදවීම සඳහා නොයෝන් ලංකා සමාගම 2004 වසරේ දී මෙරට ස්ථාපනය කරනු ලැබීය. මෙම සමාගම වටිනා සුසිනිදු සේද සහ විවිධාකාර ඇඳුම් සඳහා ප්‍රත්‍යස්ත රෙදි සිට ලේස් රෙදි දක්වා වන විවිධ වර්ගවල රෙදි නිපදවනු ලැබේ. මෙම සමාගමේ රෙදි වර්ණ ගැන්වීමේ නව්‍ය තාක්ෂණය නිසා ලේස් ඇඳුම් සම්පූර්ණයෙන්ම ස්වභාවික වර්ණකාරක මගින් නිපදවනු ලබයි.

නොයෝන් ලංකා ස්වභාවික වර්ණ ගැන්වීමේ විසඳුම සමාගමේ හරිත සංකල්පය හෝ තිරසාර මාර්ග සිතියම සඳහා නවතම වැඩිදියුණු කිරීමවන අතර ජෛව හායනයට ලක්වන සහ ප්‍රතිචක්‍රීකරණය කරන ලද පාරිසරික ද්‍රව්‍ය සහ ප්‍රතිචක්‍රීකරණය කරන ලද පොලිඑතිලීන් ටෙරිතැලේට් (PET) බෝතල් මෙම පරිසර හිතකාමී ද්‍රව්‍යයන්ට අයත්වේ.

කෘතිම වර්ණකාරක සමඟ සැසඳීමේදී නොයොන් ලංකා භාවිතා කරන ස්වභාවික ද්‍රව්‍ය නිසා ජලය සහ විදුලිය ආසන්න වශයෙන් පිළිවෙලින් 30% ක් සහ 15%ක් ඉතිරිවන අතර පිටවන රසායන ද්‍රව්‍ය ප්‍රමාණයේ සැළකිය යුතු අඩුවක්ද විෂ රසායන ද්‍රව්‍ය කිසිවක් පරිසරයට එක් නොවන බවද සහතික කරයි.



සුවිශේෂී සිදුවීම්



ව්‍යාපාර කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල්කරණය (Digitization)

ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ට, ආයෝජකයින්ට සහ අභ්‍යන්තර ක්‍රියාවලි සඳහා ලබාදෙන සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ආයතනයේ ඩිජිටල්කරණ සැලැස්ම යටතේ ආයෝජන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය 2023 වසරේදී නව පරිගණක යෙදවුම් කීපයක් දියත් කරනු ලැබිය.

ව්‍යවසායයන්ට සිය තීරුබදු නිදහස් භාණ්ඩ සඳහා අනුමැතීන් සහ ආනයන/ අපනයන ගනුදෙනු කාර්යක්ෂම අයුරින් සිදුකිරීම සඳහා මාර්ගගත තලයක් හඳුන්වාදීම එක් මූලික කාර්යක් වේ. මෙම වෙබ් යෙදවුම ක්‍රියාත්මක කිරීමෙන් පසුව ව්‍යවසායයන්ට මෙම අනුමැතීන් ලබාගැනීම සඳහා ආයෝජන මණ්ඩලයට පැමිණීමට අවශ්‍ය නොවන බැවින් ඔවුන්ගේ කාලය මෙන්ම මුදල් ද ඉතිරි වේ.

තවද, ව්‍යවසායයන් අනුමත සීමාවන් තුළ සිය ගනුදෙනු සිදුකරන්නේ දැයි ඇගයීම පිණිස ඒවායේ ආනයන සහ අපනයන අනුපාත සැසඳීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් ස්වයංක්‍රිය පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලැබිය. ව්‍යවසායයන් අවශ්‍ය කරන පරිදි ක්‍රියාත්මක නොවන්නේ නම්, කිසිම මානව මැදිහත්වීමකින් තොරව පද්ධතිය මගින් සිය සේවාවන් ස්වයංක්‍රියව අත්හිටවනු ලැබේ.

සිය ඩිජිටල් පරිවර්තන උපායමාර්ගයේ වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරමින් සහ රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා පූර්වාදර්ශයක් ලබාදෙමින් 2023 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා මාර්ගගත වෙබ් පෝටලයක් දියත් කරනු ලැබිය. මෙමගින් රැකියා අපේක්ෂිතයන්ට සෘජුවම ආයෝජන මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා ලියාපදිංචි වීමට සහ ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි පවතින පුරප්පාඩු සඳහා අයදුම් කිරීමට අවස්ථාව සැළසේ. කාර්යක්ෂමව අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කරන අතර බඳවා ගැනීමේ ක්‍රියාවලිය පුරාම අයදුම්කරුවන් සහ ආයෝජන මණ්ඩලය අතර මාර්ගගත සන්නිවේදනයක් සඳහා පහසුකම් සළසයි. මෙම ආරම්භය මගින් කාර්යක්ෂමතාවය සහ පරිශීලක දැනුම වැඩිදියුණු කරමින්, මීට පෙර අතින් සිදුකළ මානව සම්පත් ක්‍රියාවලි කීපයක් ද සාර්ථක ලෙස ඩිජිටල් පරිවර්තනයට ලක් කරනු ලැබීය.

මීට අමතරව, අතින් සිදුකළ තවත් එක් මෙහෙයුමක් ක්‍රමවත් කරමින් සේවකයින් සඳහා ණය ලබාදීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සඳහා ස්වයංක්‍රිය මාර්ගගත පද්ධතියක් හඳුන්වා දෙනු ලැබිය. මෙකී වැඩිදියුණු කිරීම් මගින් ආයෝජන මණ්ඩලය විසින් ආයෝජන කලාප, ප්‍රධාන කාර්යාලයේ ඇති මධ්‍යම දත්ත මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ කිරීම සඳහා නව තාක්ෂණයන් ක්‍රියාත්මක කරනු ලැබිය. මෙය හඳුන්වා දීමත් සමඟ ඩිජිටල් පරිවර්තනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සඳහා ආයතනයේ කැපවීම සඳහා තවදුරටත් අධාර වෙමින් ජාලයේ වේගය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු වූ අතර අන්තර්ජාල සම්බන්ධතා ආශ්‍රිත පිරිවැය අඩුවිය.

ග්‍රීන් චැනල් පහසුකම (Green Channel)

කාර්යක්ෂමතාවය සහ තිරසාරත්වය කරා යන ගමනේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 2023 වසරේදී තෝරාගත් අපනයන අරමුණු කරගත් ව්‍යවසායකයින් කණ්ඩායමක් සඳහා ග්‍රීන් චැනල් පහසුකම හඳුන්වා දෙනු ලැබීය.

ආයෝජන ආකර්ෂණය කිරීමේ මූලික ආයතනය වශයෙන්, ආයෝජන මණ්ඩලයේ ග්‍රීන් චැනල් පහසුකම මගින් සේවාවන් කඩිනම් කිරීමට සහ අපනයන අරමුණු කරගත් ව්‍යවසායකයින් සඳහා භෞතිකව භාණ්ඩ පරීක්ෂා කිරීම් සිදු නොකර (භාණ්ඩවලින් 10% ක් පමණක් භෞතිකව පරීක්ෂා කරනු ලැබේ) ආනයන භාණ්ඩ නිෂ්කාශනය කිරීමට මෙන්ම අපනයන භාණ්ඩ අපනයනය සඳහා යොමු කිරීම සඳහා පහසුකම් පිරිනමනු ලැබේ.

ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති, වසර පහක අවම මෙහෙයුම් කාලසීමාවක් සම්පූර්ණ කරන ලද ව්‍යවසායයන්ගෙන් අයදුම්පත් 116ක් ලැබුණි.

ඒ අනුව, ශ්‍රී ලංකා රේගුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, හරිත වැනල පහසුකම මගින් ප්‍රතිලාභ ලබාදීම සඳහා විවිධ අංශවල ව්‍යවසායයන් 35ක් තෝරා ගෙන තිබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජකයින් සඳහා අබණ්ඩව පහසුකම් සැළසීමට කටයුතු කරන බැවින්, ග්‍රීන් චැනල් පහසුකම මගින් ව්‍යවසායයන්ට බාධාවකින් තොරව සිය මෙහෙයුම් සිදුකිරීමට සහ පාරිසරික වගකීම සඳහා මඟ පෙන්වනු ලැබේ. කාර්යක්ෂමතාවය සහ තිරසාරත්වය එකට එක්වූ මෙකී කාර්යය මගින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර හිතකර පරිසරයක් ඇතිකිරීම සඳහා වන ආයෝජන මණ්ඩලයේ කැපවීම තහවුරු කරයි.





ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාපවල පහසුකම් වැඩිදියුණු කිරීම

ආයෝජන මණ්ඩලයීය සමාගම් සඳහා වඩාත් හොඳ සේවාවක් සැපයීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව සිදුකරමින් 2023 වසර තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අපජල පවිත්‍රාගාර වැඩිදියුණු කිරීම, ජල පවිත්‍රාගාර සහ ජල සැපයුම් පද්ධති වැඩිදියුණු කිරීම, ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම සහ නව මාර්ග ඉදිකිරීම, CCTV ආරක්ෂක කැමරා ස්ථාපනය කිරීම සහ ඉඩම් වටා වැටවල් ඉදිකිරීම, පරිපාලන සංකීර්ණය නවීකරණය කිරීම, වීදි ලාම්පු ඉදිකිරීම වැනි විවිධ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සැළකිය යුතු ප්‍රාග්ධනයක් වැයකරනු ලැබීය. 2023 වසරේ දී මෙම වැඩසටහන සඳහා වෙන්කරන ලද මුදල රු. බිලි. 2.3ක් වූ අතර 2024 සඳහා තවත් රු. බිලි. 2.8ක් වෙන්කර ඇත.

තවද, එරාවුර් සහ හම්බන්තොට නව අපනයන සැකසුම් කලාප දෙකක් වැඩිදියුණු කිරීමේ කාර්යයන් 2023 වසර පුරා අඛණ්ඩව සිදු විය. මෙම වැඩිදියුණු කිරීම්වලින් අනතුරුව, එරාවුර් අපනයන සැකසුම් කලාපය රෙදිපිළි නිෂ්පාදනය සඳහා වන විශේෂ කලාපයක් ලෙසත් හම්බන්තොට ඖෂධ නිෂ්පාදනය සඳහා වන විශේෂ කලාපයක් ලෙසත් විවෘත වනු ඇත.

බිංගිරිය අපනයන සැකසුම් කලාපය

බිංගිරිය අපනයන සැකසුම් කලාපය සඳහා ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම 2023 වසර සඳහා සැලසුම් කල කාර්යය විය. මාර්ගයේ මුළු දිග කි.මී. 6.05ක් වන අතර එය තුන්තොට සිට වතුවත්ත (කි.මී. 4.85) සහ වතුවත්ත සිට හෙට්ටියකොටුව (කි.මී. 1.2) ලෙස කොටස් දෙකකට බෙදා ඇත. රේඛීය අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමක් (MoU) මගින් ඉදිකිරීම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියට පවරනු ලැබීය.

කි.මී. 4.85 කොටස තුළ බෝක්කු හයක් අඩ වශයෙන් ඉදිකර ඇති අතර ප්‍රවේශ මාර්ගය පළල් කිරීම සඳහා පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යයන් සිදු කෙරෙමින් පවතී. අපනයන සැකසුම් කලාපයේ මුක්ත කලාපය (buffer zone) හරහා දිවෙන කි.මී. 1.2ක කොටසක තාර දැමීමේ කටයුතු නිමකර ඇත. ඉතිරි කි.මී. 0.2ක කොටසේ ඉදිකිරීම් සිදු කෙරෙමින් පවතී. වසරේ සමස්ත ප්‍රගතිය 24%ක් වේ.

වගවත්ත කාර්මික කලාපය

ප්‍රවේශ මාර්ගය සහ උප විදුලි බලය බෙදාහැරීමේ උප මධ්‍යස්ථානයේ ඉදිකිරීම් නිම කිරීමට සැළසුම් කර තිබුණි. රේඛීය අමාත්‍යාංශය සහ අදාල පාර්ශවකාර ආයතන අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් (MoUs) මගින් පිළිවෙලින් ඉදිකිරීම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියට (RDA) සහ ලංකා විදුලිබල මණ්ඩලයට (CEB) පවරනු ලැබීය.

මාර්ග සංවර්ධන අධිකාරියට විසින් ප්‍රවේශ මාර්ගයේ වැදගත්ම කොටස ඉදිකිරීම නිමකර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිබලය බෙදාහැරීමේ උප මධ්‍යස්ථානයේ පාලන ආරක්ෂක පැනල සහ සන්නිවේදන උපකරණ ස්ථාපනය කර ඇත. සමස්ත වාර්ෂික ප්‍රගතිය 70%ක් වේ.

ආරබොක්ක සහ මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාප

දැනට පවතින ජල සහ විදුලි බල සැපයුම 2023 වසර අවසානය වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණු අතර මෙම කාර්යයන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකරන ලදී. 2023 වසර අවසානය වනවිට සමස්ත ප්‍රගතිය 10%ක් විය.

එරාවුර් රෙදිපිළි නිෂ්පාදන කලාපය

ප්‍රවේශ මාර්ගය (කි.මී. 6) ඉදිකිරීමේ කාර්යයන් සහ ජල සහ විදුලිබල සැපයීමේ මූලික කාර්යයන් 2023 අවසානය වන විට නිම කිරීමය සැලසුම්කර තිබුණි. මෙම කාර්යයන් කර්මාන්ත අමාත්‍යාංශය විසින් සිදුකරන ලදී. 2023 වසර අවසානය වනවිට සමස්ත ප්‍රගතිය 15%ක් විය.

නව අපනයන සැකසුම් කලාප ස්ථාපනය කිරීම

මේ සඳහා උතුරු, නැගෙනහිර, බස්නාහිර, වයඹ සහ දකුණු පළාත්වල ඉඩම් හඳුනාගෙන තිබේ. කන්කසන්තුරේ, පරන්තන්, මාන්කුලම්, කප්පල්තුරේ, බිංගිරිය, ඉරණවිල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල එම හඳුනාගත් ස්ථාන පිහිටා තිබේ.

මානව ප්‍රාග්ධනය

අප කාර්ය මණ්ඩලය

මහජන සේවය සඳහා දැඩි අවබෝධයකින් කටයුතු කරන අප කාර්ය මණ්ඩලය, ආයතනය සහ මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනය කරා රැගෙන යන ගමනේදී ඉතා වැදගත් වේ. මෙම ජාතික වගකීම ඉටුකිරීම සඳහා අප කාර්ය මණ්ඩලයට අවශ්‍ය වෘත්තීය සහ පෞද්ගලික සහය නිරන්තරයෙන් සපයනු ලැබේ.

රාජ්‍ය අංශයේ වඩාත් පිළිගත් ආයතනයන්ගෙන් එකක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 1978 වසරේ එහි ආරම්භයේ සිටම විවිධ වූ පසුබිම් සහිත පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා සළසා දී ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තරය හමුවේ රට ඉදිරියට ගෙනයාමේ දී ආයෝජන මණ්ඩලයට ශක්තියක් වන විවිධාකාර දැක්මක් සහිත දක්ෂ කණ්ඩායමකින් සමන්විත වේ. කළමනාකරණ පද්ධති සහ ක්‍රියාවලි මගින් අපගේ විවිධ වූ දක්ෂතා සංචිතයට ලබාදී ඇති සම අවස්ථාවන් සමඟ ආරක්ෂිත වැඩ පරිසරයක් සාක්ෂාත් කරයි.

කාර්යමණ්ඩලය කළමනාකරණය කිරීමේ ආයෝජන මණ්ඩල ප්‍රවේශය

හැකියාවන් වැඩිදියුණු කර ගැනීමට අවස්ථාවන් සපයන අතර දක්ෂ පුද්ගලයින් ආකර්ෂණය කිරීම සහ රඳවා ගැනීම සහ හැකියාවන් දිරිමත්කරන අපගේ ශක්තිමත් ජනතාවාදී ප්‍රවේශයක් මගින් ශ්‍රම බලකාය උද්යෝගිමත්ව සහ සතුටින් තැබීමට හැකිවේ. ඒ අතරම ආයතනය සඳහා අගය ලබාදීම මගින් අපගේ ජාතික වගකීම ඉටුකළ බව තහවුරු කෙරේ. අපගේ මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් බඳවා ගැනීමේ සිට තෝරාගැනීම, මානව සම්පත් සංවර්ධනය. වන්දි ගෙවීම සහ සේවක සුභසාධන ප්‍රතිලාභ සහ විනය දක්වා විහිදේ. අයෝජන මණ්ඩලයේ සිය සේවා කාලය පුරාම ඔවුන්ට මනා සහයක් ලැබෙන බව සහ රැකබලා ගන්නා බව තහවුරු කරගැනීම සඳහා මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇති අතර මධ්‍යගතව අධීක්ෂණය කෙරේ. මෙම කාර්යයන් ඉටුකිරීමේදී සමානාත්මතාව, අපක්ෂපාතිත්වය සහ අචාරධර්ම අනුගමනය කරන බව අපි අවධාරණය කරන්නෙමු.

රාජ්‍ය සේවය ආයෝජන මණ්ඩලයේ සාමාජිකයින් සියල්ලගේම දැක්ම සහ ඉදිරියට ගෙනයන බලය වන අතර අපගේ මානව සම්පත් ක්‍රියාකාරකම් රජයේ නීති, නියෝග සහ ප්‍රතිපත්ති තීරණයන්ට අනුකූලවන බව තහවුරු කෙරේ. සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැළසීම සඳහා වන ප්‍රමුඛ ආයතනය වශයෙන් අප ජාතියට ඉටුකළයුතු වගකීම පැහැර නොහරින අතර මෙම ජාතික වගකීම ඉටුකිරීම සඳහා අප කාර්ය මණ්ඩලය මෙහෙයවීම සඳහා සෑම පියවරක්ම ගනු ලැබේ. රාජ්‍ය ආයතනයක් සමබන්ධයෙන් වන විශ්වාසනීයත්වය සහ අනුකූලතාවය ආරක්ෂා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්ති මගින් සියලු මානව සම්පත් කාර්යයන් මෙහෙයවන බව සඳහන් කළ යුතුය.


අවශ්‍ය හැකියාවන් සහිත පිරිස නියමිත ස්ථානයට නිසි වේලාවට විනිවිදභාවයෙන් යුත් ක්‍රමවේදයක් හරහා බඳවා ගැනීමේ සහ තෝරාගැනීමේ කාර්යයන් සිදුවන බව තහවුරුකර ඇති අතර මානව සම්පත් සංවර්ධනය මගින් අප කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය තහවුරු කෙරේ. අප කාර්ය මණ්ඩලයේ කැපවීම හා විශිෂ්ටත්වය සඳහා එක හා සමානව පාරිශ්‍රමික ගෙවීමේ, ප්‍රතිලාභ ලබාදීමේ සහ සේවක සුභසාධන කාර්යයන් සැළසෙන බව සාක්ෂාත් කරමින් පැමිණිම සහ වෙලාව ඩිජිටල් ආකාරයට කළමනාකරණය කෙරේ.

අප සේවකයින්ට සහයවීම සඳහා මෙම සියළු ක්‍රමවේදයන් ක්‍රියාත්මක වීමත් සමග ඔවුන් කාර්යාලයේදී මෙන්ම ඕනෑම ස්ථානයකදී වගකීමෙන් යුතුව කටයුතු කරන බව අපේක්ෂා කෙරේ. විනය කළමනාකරණ ක්‍රියාමාර්ග මගින් සේවකයින්ගේ විෂමාචාර සඳහා ඉක්මනින් ක්‍රියාමාර්ග ගැනීමත් ආයතනයේ කාර්යයන් සඳහා ඇතිවිය හැකි බාධක වැළැක්වීමත් තහවුරු කෙරේ.

අප කාර්යමණ්ඩලයේ සංයුතිය

ආයෝජන මණ්ඩල කණ්ඩායම, කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත 397 දෙනෙකුගෙන් සහ දිවයින පුරා අනෙකුත් ස්ථානයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය 733 දෙනෙකුගෙන් සමන්විත වේ. අපගේ සේවක පිරිස සේවක කාණ්ඩ තුනකට අයත් වේ. අප කණ්ඩායමෙන් 47%ක් ප්‍රධාන කාර්යාලය සහ අපනයන සැකසුම් කලාප හා උද්‍යානවල සිටින විධායක කාණ්ඩයට ඇතුළත් වේ. ඉතිරි 53% කළමනාකරණ සහකාර නිලධාරීන්ගෙන් සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයෙන් සැදුම්ලත් විධායක නොවන ශ්‍රේණියට ඇතුළත් වේ. සමස්ත කාර්ය මණ්ඩලයෙන් 21%ක් කළමනාකරණ සහකාර නිලධාරීන් වන අතර 32%ක් ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය වේ.

ආයෝජන මණ්ඩලයේ අප එක් එක් පුද්ගලයාගේ විවිධත්වය සහ අනන්‍යතාව පිළිගන්නා අතර එය අප සතු සුවිශාල ශක්තිය බව විශ්වාස කරන්නෙමු. ආයතනය තුළ සිය රැකියාවේ ප්‍රගතිය අත්කර ගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයමටම එක හා සමාන අවස්ථාවන් සළසනු ලැබේ. සියලු සේවක කාර්ය මණ්ඩලයන්හි ස්ත්‍රී හා පුරුෂ නියෝජනය දැකිය හැකිය.



අප කණ්ඩායම විවිධ අධ්‍යාපනික හා වෘත්තිය පසුබිම් සහිත සේවකයින්ගෙන් සමන්විත වේ. සේවකයින් 1112 දෙනාගෙන් 516 ක් විධායක කාණ්ඩය නියෝජනය කරන අතර 280 දෙනෙක් උපාධිධාරින් ද ඉන් 167 දෙනෙක් පශ්චාත් උපාධිධාරීන් ද 33 දෙනෙක් වෘත්තීය ආයතනයන්හි සාමාජිකත්වයද දරනු ලැබේ. මෙයට අමතරව සේවකයින් 23 දෙනෙකුට පශ්චාද් උපාධි මෙන්ම වෘත්තීය ආයතනයන්හි සාමාජිකත්වය හිමිව ඇත. ව්‍යාපාර පරිපාලනය, විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, රාජ්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, සමාජ විද්‍යාව, නීතිය සහ රේගු පරිපාලනය වැනි විවිධ අධ්‍යාපන ක්ෂේත්‍රයන් නියෝජනය කරන බැවින් අප සේවකයින්ගේ විවිධ වූ අධ්‍යාපනික පසුබිම් මගින් අයෝජන මණ්ඩලය අඛණ්ඩව සුවිශාල ප්‍රතිලාභ ලබයි.

ඉගෙනීම සහ වෘත්තීව සංවර්ධනය සඳහා හිතකර පරිසරයක් ඇතිකරමින්, ආයතනයේ සාර්ථකත්වයට, විශේෂයෙන්ම අප නිරතව සිටින කර්මාන්තයේ දැඩි තරගකාරිත්වය හමුවේ අප කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අතිශයින් වැදගත් බව අපි විශ්වාස කරන්නෙමු. එබැවින් ආයෝජන මණ්ඩලය විසින් එහි සේවකයින්ට සිය වෘත්තීය සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සහය වීමේ ආයතනික වගකීම පිළිබිඹු කරන අධ්‍යාපනය සඳහා විස්තීර්ණ දායකත්ව ප්‍රතිපත්ති, උසස්වීම් ප්‍රතිපත්ති හඳුන්වාදී ඇත.

පුහුණුව සහ සංවර්ධනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සිය සේවකයින්ට ඔවුන්ගේ වෘත්තීය සහ පුද්ගල සංවර්ධනය සඳහා සහය ලබාදේ. අප විසින් විධායක, විධායක නොවන ශ්‍රේණිවල සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් සඳහා ආයතනය තුළ පුහුණු වැඩසටහන් 16ක් සහ බාහිර පුහුණු වැඩසටහන් 45කට වැඩි ගණනක් පවත්වා ඇත. ආයතනය තුළ පුහුණු වැඩසටහන් සහ බාහිර පුහුණු වැඩසටහන් මගින් විධායක ශ්‍රේණියේ නිලධාරීන් 570ක් පමණ ද විධායක නොවන සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් 160ක් පමණ සඳහා ද පුහුණු අවස්ථා සළසා තිබේ.



සමාජ වගකීම

දිවා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම (crèche)



අපනයන සැකසුම් කලාපයන්හි දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ පෙර පාසල් පිහිටුවීම මගින් කලාපය තුළ ආරක්ෂිත ස්ථානයක තම දරුවන් තබා ගනිමින් සිය රැකියාවන්හි නිරතවීමට කැමති සේවකයින් සඳහා ප්‍රායෝගික විසඳුමක් ලබාදේ. මෙය රැකියා හැරයාම අඩුවීමට ඉවහල් වන අතර අළුතින් සේවයට බඳවාගත් සේවකයින් අතර ආයෝජන කලාප පිළිබඳ සතුටුදායක හැඟීමක් ඇති කෙරේ.

2023 වසර අවසානය වන විට කටුනායක අපනයන සැකසුම් කලාපයේ පිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ කුඩා දරුවන් 45 දෙනෙකුට රැකවරණය ලබා දී ඇත. බියගම සහ මාවතගම අපනයන සැකසුම් කලාපවල පිළිවෙලින් කුඩා දරුවන් 25 දෙනෙකු සහ 37 දෙනෙකු සඳහා පහසුකම් සළසා තිබේ.

සේවක පහසුතා මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම



2023 වසරේදී කටුනායක, බියගම, කොග්ගල, වතුපිටිවල අපනයන සැකසුම් කලාපවල සහ මහනුවර කාර්මික උද්‍යානයේ සේවක පහසුතා මධ්‍යස්ථාන පහක් ක්‍රියාත්මකව පැවතිණ. වෘත්තීය සංගම් නිලධාරීන්ට නිදහස්ව සහ පෞද්ගලිකව අදාල කලාපීය ව්‍යවසායන්හි සේවය කරන සිය සමාජිකයින් මුණ ගැසීම සඳහා මෙම සේවක පහසුතා මධ්‍යස්ථාන මූලිකව ස්ථාපනය කර ඇත. 2023 දී මෙම මධයස්ථානවලින් කටුනායක අපනයන සැකසුම් කලාපයේ පිහිටි සේවක පහසුතා මධ්‍යස්ථානය පමණක් වෘත්තීය සංගම් විසින් භාවිතයට ගන්නා ලද අතර එහිදී ඔවුන් සිය වෘත්තීය සංගම් ශාඛා සාමාජිකයින් සමඟ රැස්වීම් නවයක් පවත්වනු ලැබීය.

දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අදාල රාජ්‍ය ආයතනවල සහය ඇතිව කාර්මික සබඳතා අංශය හරහා කර්මාන්ත ශාලා සේවකයින් සහ කළමනාකරණ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ පවත්වයි. මෙම වැඩසටහන් මගින් සමාජ සංවාද, සෞඛ්‍යය හා ආරක්ෂාව, විනීත ක්‍රියා පිළිවෙත්, සේවා ස්ථානයේ සහයෝගීතාවය සහ සේවා ස්ථානයේ සූදානම ඇතුළු විෂය ක්ෂේත්‍ර කීපයක් ආවරණය කරයි. 2023 වසරේදී අපනයන සැකසුම් කලාපවල සහ ඉන් පිටත ව්‍යවසායයන්හි කර්මාන්ත ශාලා සේවකයින් සහ කළමනාකරණ නිලධාරීන් සඳහා ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්හි දැනුවත් කිරීමේ වැඩසටහන් 392ක් පවත්වනු ලැබීය.

පාසල් ශිෂ්‍යයින් සඳහා රැකියා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන



රජයේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් පාසල් සිසුන් සඳහා න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම සමඟින් වෘත්තීය අධ්‍යාපන අවස්ථා ලබාදේ. මෙම ප්‍රතිසංස්කරණයන්ට සමගාමීව 2023 වසරේ දී බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ආයෝජන මණ්ඩලයේ සහ ජෙට්වින් හෝටල් සමූහයේ සහයෝගීතාවය ඇතිව පාසල් සිසුන් සඳහා රැකියා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබීය.

ආයෝජන මණ්ඩලයේ දෙපාර්තමේන්තුවල කාර්යසාධනය

ආයෝජන ප්‍රවර්ධන

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව නව ආයෝජකයින් සමඟ පළමුව සම්බන්ධ වන අංශයයි. ආයෝජන ප්‍රවර්ධන අංශයේ මූලික කාර්යය වන්නේ ශ්‍රී ලංකාව පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපය දිරිමත් කිරීම සහ ලාභදායී ආයෝජන ගමනාන්තයක් ලෙස මෙරට සන්නාමය ගොඩනැගීමයි. නව විදේශීය සහ දේශීය ආයෝජන ආකර්ෂණය කිරීම, වර්ධනය කිරීම සහ රඳවා ගැනීම සඳහා එකිනෙක සම්බන්ධ ක්‍රියාවලි ගනණාවක් එයට ඇතුළත්ය.

මෙරට සන්නාමකරණය සඳහා වගකිව යුතු මෙම දෙපාර්තමේන්තුව, ආයෝජක සිතියම හරහා විභව ආයෝජකයින්ට පවත්නා ආයෝජන අවස්ථා පිළිබඳව මාර්ගෝපදේශ ලබාදේ. මෙරම තිරසාර සහ ආර්ථික වර්ධනයට අධාර වීම සඳහා ජාතික ප්‍රමුඛතාවන්ට ගැලපෙන විශේෂ අංශ, වෙළඳපල, ව්‍යාපෘති, සහ ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමුකර උසස් තත්වයේ ආයෝජන ආකර්ශනය කිරීම සඳහා ක්‍රමානුකූලව සිදුකරන ආයෝජක ප්‍රවේශයක් මෙයට ඇතුළත් වේ.

පාර්ශවකරුවන් කළමනාකරණය මෙහි තවත් එක් කාර්යයකි. ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැළසීම සඳහා දූත කණ්ඩායම්, අමාත්‍යාංශ, රේඛීය නියෝජිතායතන සහ නියාමන ආයතන සමඟ සම්බන්ධතාවන් පුළුල් කිරීම සම්බන්ධයෙන් ද කටයුතු කරයි.

පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ සහ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව අදාල ඍජු විදේශ ආයෝජන ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සහ උපදෙස් ලබාදීම, ආයෝජන හා අදාල ප්‍රතිපත්ති සංශෝධනය කිරීමේ දී මූලික වශයෙන් කටයුතු කිරීම සඳහා කැපවී සිටී. ආයෝජන හා අදාල කරුණු පිළිබඳව පර්යේෂණ සිදුකිරීම සහ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සඳහා උපදෙස් ලබාදීම සම්බන්ධයෙන් ද මෙම අංශය වගකිව යුතුවේ.

මෙම රාමුව යටතේ ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ සහ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව ආයෝජන පරිසරය ඇගයීම සහ විවිධ ප්‍රතිපත්ති, නීති සහ ක්‍රියාවලි සඳහා වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීමේ වගකීම සඳහා ද උරදේ. මෙකී ප්‍රයත්නයන් මගින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම සඳහා රජයට සහයවීම මගින් අත්‍යාවශ්‍ය විදේශීය සහ දේශීය ආයෝජන ආකර්ෂණය කිරීම අරමුණු කෙරේ.

ආයෝජන අවස්ථාවන් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපාරික පර්යේෂණ සිදුකිරීම, ආයෝජන සඳහා ප්‍රමුඛ අංශ හඳුනා ගැනීම සඳහා රටට විශේෂ හා අංශ-විශේෂ පර්යේෂණ සිදුකිරීම, තොරතුරු පත්‍රිකා (බ්‍රෝචර්) සකස් කිරීම, තරගකාරී සහ තුළනාත්මක වාසි පදනම් කරගෙන ආයෝජන ප්‍රවර්ධන උපායමාර්ග සැලසුම් කිරීම, ආයෝජන හා අදාල දත්ත රැස්කිරීම, විශ්ලේෂණය කිරීම, සහ බෙදාහැරීම, ආයෝජන සඳහා අති බාධක හඳුනා ගැනීම හා ඒ සඳහා පිළියම් ක්‍රියාමාර්ග යෝජනා කිරීම සහ ආයෝජන සහ වෙළඳ සාකච්ජා සඳහා දායක වීම ද මෙම දෙපාර්තමේන්තුවේ වගකීම් වේ. පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන අංශය, ආයතනයේ අරමුණු අභිවර්ධනය කිරීම සඳහා ආධාර වන අංශ අතර සහයෝගී ප්‍රයත්නයන්ට පහසුකම් සළසමින් මෙකී කාර්යයන්හි නියළේ.

ආයෝජන ඇගයීම්

ආයෝජන සඳහා පහසුකම් සැළසීම සහ අවම කාල රාමුවක් තුළ අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම පිළිබඳ කාර්යය ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුවට පැවරී තිබේ. අයදුම්පත් භාරගැනීමේ පටන් ව්‍යාපෘතිය ආරම්භක අදියරේ සිට ශ්‍රී ලංකාවේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලසීමාව පුරාම බාධා රහිත පහසුකම් සැළසීමේ ක්‍රියාවලිය එහි කාර්ය භාරයට අයත්ය.

එහි ආරම්භයේ පටන්ම මෙම ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුව, ආයෝජන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ එහි කාර්ය මණ්ඩලයේ දැනුම සහ පළපුරුද්ද පදනම්ව කාර්මික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා යෙදවුම් ප්‍රමුඛ කිරීමේදී අත්‍යාවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඍජු අධීක්ෂණය සහ නායකත්වය යටතේ ක්‍රියාත්මක වෙමින්, මෙම අංශය උපායමාර්ගික මගපෙන්වීම සාක්ෂාත් කරන අතර එහි කාර්යයන් අධීක්ෂණය කරයි.

ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් වන්නේ, ආයෝජන යෝජනා ඇගයීම, ව්‍යාපෘති යෝජනා සඳහා නිර්දේශ ලබාදීම, ව්‍යාපෘතිවලට රේගු තීරුබදු සහ අනෙකුත් බදු සහන ප්‍රදානය කිරීම සඳහා පහසුකම් සැළසීම, ව්‍යාපාරයන්හි විෂය පථය වෙනස්වීම සඳහා අනුමැතිය ලබාදීම, පිහිටා ඇති ස්ථානය, නිෂ්පාදනය, ක්‍රියාවලි ආදිය පුළුල් කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදීම, මෙහෙයුම් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම හා ඒ සඳහා මැදිහත් වීම, ඍජු විදේශ ආයෝජන පුරෝකථනය සකස් කිරීම, ව්‍යාපෘතිවල සේවය කරන විදේශිකයින් සඳහා වීසා නිර්දේශ කිරීම, විවිධ ආයෝජන සංසඳ සඳහා සහභාගි වීම, ප්‍රතිපත්ති

සම්පාදනය කිරීමේ කමිටු සඳහා සහභාගි වීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම, සියළු රේඛීය ආයතන සහ රේඛීය අමාත්‍යාංශ සමඟ සන්නිවේදනය සහ සම්බන්ධීකරණය සිදුකිරීම, විවිධ රාජය ආයතන විසින් සිදුකරන විමසිම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ව්‍යාපෘති විස්තර යාවත්කාලීන කිරීම වේ.

ඇගයුම් කමිටුව

දැනට ව්‍යාපාරයන්හි නිරත සහ විභව්‍ය ආයෝජකයින් සඳහා සාමූහිකව සහ කාර්යක්ෂමව ආයෝජන පිළිබඳ තීරණ ගැනීම සඳහා අදාල අංශවල නියෝජිතයින්ගෙන් සමන්විත ඇගයුම් කමිටුව ස්ථාපනය කර ඇත. මෙම ව්‍යුහය මගින් අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අරමුණු කෙරේ. අනෙකුත් ස්ථිර කමිටු සාමාජිකයින් සමගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය මෙම කමිටුවේ සභාපති වන ඇත. ඇගයුම් කමිටුව සතියකට වරක් හෝ අවශ්‍ය පරිදි කැඳවනු ලැබේ.

අනුමත කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වූ සියළු අංශ ප්‍රධානීන් අනවශ්‍ය ප්‍රමාදයන් අවම කිරීම සඳහා තීරණ ගැනීම සඳහා ද සහභාගි වේ. කමිටුව විසින් අනුමැතිය ලබාදිය යුත්තේ ඇගයුම් කමිටුව ද, සභාපතිවරයා ද, අධ්‍යක්ෂ මණ්ඩලය හෝ අදාල රේඛීය අමාත්‍යාංශය විසින් ද යන අනුමැතිය අවශ්‍ය කරන මට්ටම තීරණය කරයි. වඩා කාර්යක්ෂම සහ ක්‍රියාත්මක කිරීමට පහසු ක්‍රියාවලියක් ඇති කරමින්, තීරණ ගැනීමේදී එකිනෙකාගේ විශේෂඥතාවය සහ දැනුම හුවමාරු කරගැනීම මගින් විශාල බලපෑමක් ඇති කරයි.

ආයෝජක පහසුකරන සම්බන්ධීකරණ කමිටුව (IFCC)

2022 වසරේදී ස්ථාපනය කරන ලද ආයෝජන මණ්ඩලයේ ආයෝජක පහසුකරන සම්බන්ධීකරණ කමිටුව ගරු ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අදාල මූලික රේඛීය ආයතනවල නියෝජිතයින් සමඟ මාසිකව රැස්වීම් පවත්වයි. අන්තර් ආයතනික සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම මගින් ආයෝජන අනුමත කිරීම සඳහා ගතවන කාලය අඩු කිරීම සහ වත්මන් ආයෝජකයින් සහ විභව්‍ය ආයෝජකයින් මුහුණපාන අවහිරතා විසඳීම මෙම රැස්වීම්වල මූලික ඉලක්කය වේ. IFCC ආයෝජකයින්ට නිතරම විවිධ ආයතනයන්ට නොගොස් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට හැකි වනපරිදි, අදාල ආයතන කමිටුව කැඳවීම සහ ඉක්මනින් තීරණ ගැනීමේ පොදු වේදිකාවක් ලෙස කටයුතු කරයි. ආයෝජන ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම සහ වැඩිදියුණු කිරීම මගින්, හිතකර ආයෝජන පරිසරයක් ඇති කිරීම සහ තිරසර ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීමේ දී IFCC ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

ආයෝජක සේවා

ආයෝජක සේවා දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ආනයන හා අපනයන ක්ෂේත්‍රයන්හි ලියාපදිංචි වූ ආයෝජකයන් සඳහා පසු සත්කාරක සේවා පහසුකම් සපයනු ලැබේ. භාණ්ඩ සත්‍යාපන මධ්‍යස්ථාන 09 ක් සහ ඉහත සේවා සැපයීම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ, කොළඹ, කටුනායක, බියගම, කොග්ගල අපනයන සැකසුම් කලාපවල හා මහනුවර කාර්මික උද්‍යානයේ ආයෝජන සේවා මධ්‍යස්ථාන පහක් ඇත.

ආනයන/අපනයන ලේඛන සකස් කිරීම, ආනයන/අපනයන භාණ්ඩ සත්‍යාපනය කිරීම, යුරෝපීය හවුලට අයත් රටවල්වලට අපනයනය කරන රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සඳහා සම්භවය පිළිබඳ සහතිකය නිකුත් කිරීම, බන්ධිත ගුදම්වලින් භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබාදීම, උපකොන්ත්‍රාත්තු, පැවරුම්, දේශීය වෙළඳාම හා අමුද්‍රව්‍ය හා යන්ත්‍ර සඳහා ණය ලබා ගැනීමට අනුමැතිය ලබාදීම, භාණ්ඩ ප්‍රතිඅපනයනය හා ප්‍රතිආනයනය සඳහා අනුමැතිය දීම, ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායන් මුහුණදෙන ගැටළු සම්බන්ධයෙන් රජයේ සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු, වක්‍ර අපනයනයන් සඳහා GRN අනුමත කිරීමේ ක්‍රියාවලිය, තොරතුරු තාක්ෂණ/ආයෝජන බාහිරකරණ ව්‍යාපෘති සඳහා වෙබ් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම, මෙරට සේවය කරන විදේශිකයින්ට වීසා නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙත නිර්දේශ ලබාදීම (අපනයන සැකසුම් කලාපවල ව්‍යවසායන් සඳහා පමණක්) මෙම අංශය විසින් සපයන අනෙකුත් සේවාවන් වේ.

ව්‍යාපෘති අධීක්ෂණ

ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ ආයෝජන මණ්ඩල ගිවිසුමේ දක්වා ඇති කොන්දේසි සපුරාලමින් වාණිජ මෙහෙයුම් ආරම්භකර ඇති ව්‍යාපෘතිවල කාර්යසාධනය පරීක්ෂාකර බැලීම වේ. වාණිජ මෙහෙයුම් සිදුකෙරෙන ආයෝජන මණ්ඩල අනුමත ව්‍යාපෘතිවල ව්‍යාපෘති චක්‍රය මගින් ආවරණය වන අංශයේ සාමාන්‍ය හා ස්ථාවර ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් වේ.

ආයෝජන මණ්ඩල නීතියේ 16 හා 17 වන වගන්ති යටතේ අනුමත සමාගම් පිළිබඳව, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ද්විවාර්ෂික කාර්යසාධන ප්‍රකාශන හා එකී ව්‍යාපෘති සම්බන්ධයෙන් වන රැකියා නියුක්තිය පිලිබඳ සංඛ්‍යා ලේඛන වැනි කාලීන තොරතුරු එකතුවක් මගින් පරීක්ෂා කෙරේ.

බදු සහන සඳහා සුදුසුකම් ලත් සමාගම් සඳහා බදු සහතික නිකුත් කිරීම, ව්‍යාපෘති චක්‍රය අවසන් කර ඇති හා ආයෝජන මණ්ඩලයේ කොන්දේසිවලට අනුකූලව කටයුතු නොකරන ව්‍යාපෘතිවල ගිවිසුම් නිසියාකාරයෙන් අවසන් කිරීම, අදාල අංශ මගින් තීරණ ගැනීමට අවශ්‍ය වන කාර්යසාධන වාර්තා ලබාදීම සඳහා ආයෝජන මණ්ඩල නීතියේ 16 හා 17 වන වගන්ති යටතේ ව්‍යාපෘති පරීක්ෂා කිරීම හා අවසන් කරනු ලැබූ ව්‍යාපෘති සඳහා එම ව්‍යාපෘතිවලට ලබාදී තිබූ FCBU පහසුකම් ඉවත් කර ගැනීම සඳහා වාණිජ බැංකුවලට එකී ගිවිසුම් අවසන්ව ඇති ව්‍යාපෘති පිළිබඳව කාර්තුමය වශයෙන් වාර්තා කිරීම දෙපාර්තමේන්තුව මගින් කටයුතු කරනු ලබන අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍රයන්ට ඇතුළත්ය.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම්

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේ ආයෝජන මණ්ඩලය සමඟ ඇතිකර ගෙන ඇති ගිවිසුම්වල දක්වා ඇති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන්වලට අනුකූලව ව්‍යාපෘති සඳහා සාර්ථක ලෙස පහසුකම් සැළසීම තහවුරු කිරීමයි. ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව ආයෝජකයින් සඳහා පහසුකම් සැළසීම මෙම අංශයේ මූලික කාර්යය වන අතර එම නිසා ව්‍යාපෘතිය සීඝ්‍රයෙන් වාණිජකරණ අවධියට පිවිසේ. ගිවිසුම අත්සන් කළ විට, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක සහ ශක්‍යතාව තහවුරු කිරීම සඳහා කලින් කලට ආයෝජකයින් විසින් ඉදිරිපත් කළ යුතු වාර්තා පිළිබඳව මූලික මාර්ගෝපදේශ නිකුත් කරයි.

තවද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් දෙපාර්තමේන්තුව අනෙකුත් රේඛීය ආයතන, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු/අවහිරතා හඳුනාගනු ලබන අතර එකී ගැටළු විසඳීම සඳහා ආයෝජකයින්ට සහය වේ, විමර්ශන සහ පරීක්ෂා කිරීම් මගින් ව්‍යපෘතියේ සත්‍යය තත්වය තහවුරු කරයි, නව ව්‍යාපෘති සඳහා සහ ව්‍යාපාර ආරම්භ කරන අයෝජකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාදේ, ව්‍යාපෘතිවල තත්වය පිළිබඳව ආයෝජන මණ්ඩලය විසින් පවත්වාගෙන යන කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) යාවත් කාලීන කරයි, ව්‍යාපෘතිවල වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම් හඳුනා ගනී, අසාර්ථක වූ හෝ අත්හිටුවන ලද ව්‍යාපෘති හඳුනාගනු ලබන අතර ගිවිසුම් අවසන් කිරීම සඳහා ඒවායේ ලිපි ගොනු ව්‍යාපෘති අධීක්ෂණ අංශයට මාරුකරයි.

නීති

ආයෝජන හා අදාළ නෛතික පාලනය පිළිබඳව ආයෝජකයින් සඳහා සේවා සැපයීම සහ ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති සඳහා ආයෝජන ගිවිසුම් සඳහා පහසුකම් සැළසීම නීති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරයවේ. මෙම අංශය ආයෝජන මණ්ඩලයට එදිරිව සිදුකරන නෛතික කාර්යයන්හිදී නීති කටයුතු සම්බන්ධ කටයුතු ක්‍රියාකරන අතර ආයතනයේ නෛතික අයිතිය ආරක්ෂා කිරීම සඳහා ආයෝජන මණ්ඩලය වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග සිදුකරයි.

ආයෝජකයින් සඳහා පහසුකම් සැළසීමේ නෛතික සේවාවන් උපදේශන ස්වභාවයක් ගනු ලබන අතර එයට, ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තියේ විධිවිධාන යටතේ, උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත සහ මුදල් පනත යටතේ, වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග යටතේ ව්‍යාපෘති ස්ථාපනය කිරීමට අදාළ වන ශ්‍රී ලංකාවේ නෛතික පාලනය සම්බන්ධයෙන් තොරතුරු බෙදාහැරීම සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති ස්ථාපනය කිරීම අවසර ගත් ව්‍යාපාර සංගම් ව්‍යවස්ථාවේ පරීක්ෂා කිරීම සහ අනුමැතිය ලබාදීම ද එයට අයත් වේ. ඊට අමතරව සිය කර්මාන්ත ඉදිකිරීම සඳහා ආයෝජකයින්ට ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම් ලබාදීම මගින් ආයෝජකයින් අදාල සේවා පුළුල් කිරීම සඳහා ද නීති දෙපාර්තමේන්තුව මැදිහත් වේ.

තාක්ෂණ සේවා

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් කළමනාකරණය කරනු ලබන අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යානවල යටිතල පහසුකම් සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණයෙන් පාලනය කිරීම සඳහා තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුව මූලිකව වගකිව යුතු වේ. මෙහි ප්‍රධාන කාර්යයන් වන්නේ නව ආයෝජන කලාප ස්ථාපනය කිරීම සඳහා ස්ථාන හඳුනා ගැනීම, නව ආයෝජන කලාප සැලසුම් කිරීම සහ වැඩිදියුණු කිරීම හා මූලික සංවර්ධන කාර්යයන් සිදු කිරීම, මෙහෙයුම් සඳහා තාක්ෂණ සහය සැපයීම, කලාපවල ජල සැපයුම, අපජල අපහරණ පද්ධති හා ඝන අපද්‍රව්‍ය අපහරණය වැනි සේවාවන් පවත්වා ගැනීම, හිස් ඉඩම් හඳුනා ගැනීම සහ ව්‍යවසායන්ගේ ඌණ ක්‍රියාකාරිත්වය හේතුවෙන් රජය විසින් අත්පත්කර ගත් ඉඩම්වල නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ අනෙකුත් මූලික වගකීම් වේ.

තවද, මෙම දෙපාර්තමේන්තුව මගින් මහජනයා සම්බන්ධයෙන් පාරිසරික ගැටළු සහ තත්වයන්ට මුහුණපා ඇති කාර්මික කලාප සඳහා කාක්ෂණ තත්වය පිළිබඳව පරීක්ෂා කිරීම සහ නිර්දේශ ලබාදීම සිදු කෙරේ.

ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති

ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව (EA & SP) ආයෝජකයින් සඳහා පහසුකම් සැළසීමේදී, ඉංජිනේරු අනුමත කිරීම සහ ඉඩම් හා අදාළ පහසුකම් සැලසීම යන ප්‍රධාන කාර්යයන් දෙකෙහි නිරත වේ.

ඉංජිනේරු අනුමත කිරීමේ අංශය, ඉදිකිරීම් ස්ථාන සඳහා වන ආයෝජන මණ්ඩලයේ නියාමන හස්තය ලෙස කටයුතු කරන අතර එමගින් පිහිටීම් අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, තීරු බදු නිදහස් පදනම මත ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ප්‍රමාණ සහතිකකරණය සහ 17 වන වගන්තිය අනුව ව්‍යාපෘතිවල අනුකූලතාවය සහතික කිරීම යන ප්‍රධාන සේවාවන් හතර ලබාදේ.

ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප ඉදිකිරීම සඳහා අවශ්‍ය විටක රජයේ ඉඩම්/පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම, ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබාගැනීමට ආයෝජකයන්ට සහයදීම, ආයෝජන මණ්ඩල අපනයන සැකසුම් කලාපවලට පිටතින් පිහිටා ඇති ඉඩම් පිළිබඳ ඉඩම් දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම, ඉඩම් සම්බන්ධ කරුණුවලදී නීති අංශය හා වෙනත් අංශ සඳහා සහය වීම සහ ඉඩම් හා අදාළ කරුණු සම්බන්ධයෙන් අදාළ රේඛීය ආයතන සහ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා ඉඩම් හා අදාළ පහසුකම් සැලසීමේ අංශය වගකිය යුතුය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැළසීම

රජයේ ප්‍රතිපත්තිමය තීරණයන්ට සහ රජයේ මග පෙන්වීම අනුව යෝජිත ආයෝජන කලාප ක්‍රියාත්මක කරනු ඇත. ඒ අනුව, ආයෝජන කලාප සඳහා සුදුසු ඉඩම් අත්පත් කර ගැනීමෙන් අනතුරුව, යෝජිත නව කලාප ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම ආයෝජන මණ්ඩලයේ ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති අංශය විසින් සිදුකරන තවත් මූලික කාර්යයක් වේ.

මීට අමතරව, නව ආයෝජන කලාප ස්ථාපනය කිරීමේදී යටිතල පහසුකම් සැපයීමේ සිට නව කලාපවල සීමාවන් වෙන් කිරීම දක්වා රේඛීය අමාත්‍යාංශ සහ ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය වැනි පාර්ශවකාර ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම ආදී කාර්යයන් ද ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති අංශය විසින් සිදුකරනු ලබයි.

පරිසර කළමනාකරණය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ වන ව්‍යාපෘති සම්බන්ධයෙන් පාරිසරික ආරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ කාර්යයන් පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. පාරිසරික ආරක්ෂාව සහතික කිරීම සහ ආයෝජන මණ්ඩලීය ව්‍යාපෘතීන්හි අනුකූලතාවය අරමුණු කරගත් විවිධ අත්‍යාවශ්‍ය කාර්යයන් මෙම අංශයේ වගකීමවලට අයත්ය.

මූලිකවම මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) සහයෝගිතාවය ඇතිව නව ව්‍යාපෘති සඳහා පාරිසරික නිශ්කාශන ලබාදීම, යෝජිත ව්‍යාපාර පාරිසරික ප්‍රමිතීන් අනුව කටයුතු කරන බව සහතික කිරීමේ කාර්යය මෙම අංශයට පැවරී ඇත. මීට අමතරව, පරිසරය ආරක්ෂා කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කර මෙහෙයුම් සිදුකරන ව්‍යාපෘති සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) නිකුත් කිරීම මෙම අංශයේ මැන්ඩේටයට අයත්ය. තවද, මෙම දෙපාර්තමේන්තුව මගින් දුරකථන සන්නිවේදන කුළුණු ඉදිකිරීම සඳහා දුරකථන සන්නිවේදන නියාමන කොමිසමට (TRC) පාරිසරික නිර්දේශ ලබාදේ.

පාරිසරික ගැටළු සඳහා විසඳුම් ලබාදීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම, පරිසර දූෂණය පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම, අවශ්‍ය පරිසර දූෂණ පාලන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම, අපනයන සැකසුම් කලාපවලින් කාර්මික අපද්‍රව්‍ය පිටවීම අධීක්ෂණය කිරීම සහ පිළිගත් ප්‍රමිතීන්ට අනුගතවීම තහවුරු කිරීම මගින් පාරිසරික හායනයට එරෙහිව ආරක්ෂාව සැපයීම මෙම දෙපාර්තමේන්තුවේ අනෙකුත් මූලික වගකීම් වේ.

මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව එකඟව සිටින ජාත්‍යන්තර පාරිසරික සම්මුතීන් සහ රසායනික නියෝගයන් සඳහා වන ජාතික කමිටු සඳහා ද දායක වේ. තවද, පාරිසරික කළමනාකරණ දෙපාර්තමේන්තුව අපජලය පවිත්‍ර කිරීම සහ ඝන අපද්‍රව්‍යය අපහරණය කිරීම සැලසුම් කිරීම සඳහා තාක්ෂණ සහය සැපයීම සඳහා සහ පාරිසරික බලපෑම ඇගයීම/ මූලික පාරිසරික පරීක්ෂා කිරීම් (EIA/IEE) සිදු කිරීමේදී ආයෝජන මණ්ඩලීය කර්මාන්ත/ ව්‍යාපෘති සඳහා සහය වීමට කැපවීමෙන් කටයුතු කරයි.

තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් සැලසුම් කිරීම, සකස් කිරීම, වැඩි දියුණු කිරීම, ඇගයීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ආයතනයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්පත් ප්‍රසම්පාදනය, ස්ථාපනය හා නඩත්තු කිරීම සිදු කෙරේ. මෙම දෙපාර්තමේන්තුව විසින් සන්නිවේදනය සඳහා අවශ්‍ය පරිගණක මෘදුකාංග සහ දෘඩකාංග සමඟින් සියළු තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම මගින් පරිශීලකයින් සඳහා අඛණ්ඩ සේවාවක් සැපයීමෙන් දවසේ පැය 24 පුරාම ආයතනයේ සංයුක්ත පරිගණක ජාලය පවත්වාගෙන යනු ලැබේ.

සියළු පරිශීලකයින් සඳහා ස්ථාවර තාක්ෂණික පරිසරයක් තහවුරු කිරීම සඳහා නිරන්තර ක්‍රියාවලි හරහා ආයෝජන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය කිරීම මෙම අංශයේ මූලික වගකීම වේ. ආයෝජන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය, ව්‍යවසායකයින් සඳහා මාර්ගගත අනුමත කිරීමේ තල, ගෙවීම් පද්ධති, කළමනාකරණ තොරතුරු පද්ධතිය, ස්වයංක්‍රීයකරණ මෙවලම්, ජංගම යෙදවුම් සහ බාහිර ආයතන සමඟ අතුරු මුහුණත් ඇතුළුව විවිධ පරිගණක පද්ධති නිර්මාණය කිරීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම මෙයට අයත්ය. ඊට අමතරව විද්‍යුත් තැපෑල කළමනාකරණය, අන්තර්ජාල ප්‍රවේශය, CCTV අවේක්ෂණය, වීඩියෝ තාක්ෂණය මගින් සම්මන්ත්‍රණ පැවැත්වීම, අභ්‍යන්තර සහ බාහිර පාර්ශවකරුවන් සඳහා පරිශීලක සහය, SMS ගෙට්වේ, සහ සම්පත් අධීක්ෂණය කිරීම අවරණය කරමින් ආයතනයට විස්තීර්ණ තොරතුරු සන්නිවේදන සේවාවක් සපයයි.

තවද, එමගින් ෆයර්වෝල්, ප්‍රතිවයිරස් මෘදුකාංග, OTP සහතික කිරීම, පරිශීලක ප්‍රවේශය පාලනය කිරීම, ප්‍රවේශය කළමනාකරණය කිරීම සහ සංවේදී තොරතුරු ආරක්ෂා කිරීම සඳහා SLCERT හරහා ආරක්ෂාව පිළිබඳ ඇගයීමක් සිදුකර පරිගණක ජාලයේ, පද්ධතිවල, ආයතනික දත්ත ගබඩාවල ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාව ලබාදේ.

මාධ්‍ය සහ ප්‍රචාරක

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන උපාය මාර්ගික සන්නිවේදන අරමුණු ක්‍රියාත්මක කිරීම මාධ්‍ය අංශයේ විෂය පථයට අයත් වේ. ශ්‍රී ලංකාව පිළිබඳව ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැගීම මූලික වගකීම වන අතර ශ්‍රී ලංකාවේ ඇති ආයෝජන අවස්ථා පිළිබඳව තොරතුරු බෙදාහැරීම සහ ශ්‍රී ලංකාව ආයෝජන සඳහා පළමු තේරීම ලෙස ප්‍රවර්ධනය කිරීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ආයෝජන මණ්ඩලයේ දැක්ම සහ මෙහෙවර පිළිබඳව සන්නිවේදනය කිරීම සහ ශ්‍රී ලංකා සන්නාමය ස්ථානගත කිරීම, ජාතික සන්නාමය ලෙස ආයෝජන මණ්ඩල සන්නාමය ස්ථාපනය කිරීම, අවශ්‍ය විටක අලෙවි ප්‍රවර්ධන සැලසුම් මත පදනම්ව මාධ්‍ය උපාය මාර්ගික සැලසුමක් සහ උපායමාර්ග සකස් කිරීම, අභ්‍යන්තර සන්නිවේදන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආයෝජන මණ්ඩලයේ නිල මාධ්‍ය සන්නිවේදක ලෙස කටයුතු කරමින් සියළු මාධ්‍ය සන්නිවේදන කටයුතු සිදු කිරීම මෙම අංශයේ කාර්යයන්ට ඇතුළත් වේ.

කලාප කළමනාකරණ

ආයෝජකයින් සඳහා වඩා හොඳින් පහසුකම් සැළසීමේ අරමුණින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දිවයින පුරා අපනයන සැකසුම් කලාප/ කාර්මික උද්‍යාන 15 ක් ස්ථාපනය කර ඇති අතර කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඒවා පාලනය කරනු ලබයි.

ආයෝජන හිතකර පරිසරයක් ඇති කිරීම සඳහා කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්, විශ්වාසනීය යටිතල පහසුකම් (විදුලිය, ජලය පවිත්‍ර කිරීම, අපජලය පවිත්‍ර කිරීම, ප්‍රවේශ මාර්ග ආදිය) සැපයීම, ඉංජිනේරු අනුමත කිරීම් සහ මාර්ගෝපදේශ ලබාදීම, අපනයන/ ආනයන ලේඛන සකස් කිරීම සහ භාණ්ඩ සත්‍යෝක්ෂණය, උපදේශන සේවා සහ මනා කාර්මික සබඳතාවක් පවත්වා ගැනීම පිළිබඳ මාර්ගෝපදේශ ලබාදීම, සතියේ දින හතේම පැය 24 පුරා ගිනි නිවීම් ඇතුළුව ගිනි ආරක්ෂණයක් සහ සමස්ත ආරක්ෂාවක් සැපයීම, අධීක්ෂණය සහ උපදේශන සේවා, පාරිසරික ආරක්ෂාව අධීක්ෂණය කිරීම, පර්යේෂණාගාර සේවා, සත්‍යෝක්ෂණය සමඟින් ආනයන සහ අපනයන නිෂ්කාෂණය ආදී විවිධ සේවාවන් සපයයි.

සමාගම් සඳහා සේවා සැපයීමට අමතරව, කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ජාතික ප්‍රතිපත්තිය සහ තිරසර සංවර්ධන උපාය මාර්ගයන්ට අනුව ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප හරිත කලාප බවට පරිවර්තනය කිරීම සඳහා සැලසුම් කර ඇත. අපනයන සැකසුම් කලාප හරිත තත්වයට පත්කිරීම මගින් ඒවායේ ආකර්ෂණීයත්වය ඉහල නැංවීම, වැඩි ඇණවුම් ප්‍රමාණයක් ලබාගැනීම සඳහා අනුකූලතාවය වැඩිදියුණු කිරීම, සහ තිරසර බලශක්තිය ප්‍රවර්ධනය කිරීම ආයෝජන මණ්ඩලයේ අරමුණ වේ. පාරිසරක තිරසරබව සඳහා ඇති කැපවීම පෙන්නුම් කරමින් මෙකී ආරම්භයන් ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන්ට (NDC) සහ තිරසර සංවර්ධන ඉලක්කයන්ට සමගාමී වන අතර සංවර්ධනයට දායක වේ.

කාර්මික සබඳතා

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලීය ව්‍යවසායයන් තුළ ඉහළ කාර්යක්මතාවය සහ ඵලදායිතාවය සඳහා සහෝපකාරී මනාව සංවිධානය වූ කාර්මික සබඳතා වාතාවරණයක් පවත්වා ගැනීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම ඉලක්ක කරා ළඟාවීමේදී කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් කාර්යයන් ගණනාවන් ඉටු කරයි.

ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්ගේ කම්කරු කළමනාකරණ සහයෝගිතාවය, කාර්මික සාමය හා සංහිදියාව හා ඉහළ ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීමත ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි කළමනාකරණය හා සේවකයින් සඳහා අවශ්‍ය විට කම්කරු නීති/නියෝග හා කාර්මික සබඳතා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපදේශන සේවා සැපයීම; අපනයන සැකසුම් කලාපවල ක්‍රියාත්මක වන ආයෝජන මණ්ඩල රැකියා සේවා ඒකක, මාර්ගගත රැකියා බැංකු පෝටලය හා බඳවා ගැනීමේ සහය වැඩසටහන් හරහා ආයෝජකයන්ට ඔවුන්ගේ ශ්‍රමබලකා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සහයදීම; කම්කරු කළමනාකරණ සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීම මගින් ඵලදායි ශ්‍රම බලකායක් පවත්වා ගැනීමට පහසුකම් සැළසීම; සහ මූලිකවම සංහිදියාව සහ සේවක සංගම්වල මැදිහත්වීම මගින් සමාජ සංවාද ප්‍රවර්ධනය කිරීම.

අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණන අංශය ක්‍රමාණුකූල, විනයානුකූල ඇගයීම් මගින් අගය එකතු කිරීම සහ ආයතනයේ මෙහෙයුම් වැඩිදියුණු කරන අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යයන් සඳහා උපදෙස් ලබාදෙමින් ස්වාධීන අංශයක් ලෙස ක්‍රියාකරයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමස්ත පාලන පද්ධතියේ කොටසක් වන විගණන අංශය, අනුකූලතාවයන් ඇගයීම සඳහා මෙහෙයුම් සහ නිවාරණ පාලන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාකරමින් වැදගත් පාලන කාර්යයන් ලබාදෙන අතර විගණනයේ ප්‍රතිඵල මත පදනම්ව සිදු කළ හැකි වැඩිදියුණු කිරීම් යෝජනා කරයි.

වත්කම්වල පැවැත්ම සහ එම වත්කම් සඳහා නිසි ආරක්ෂාවක් තිබේ දැයි සත්‍යාපේක්ෂණය කිරීම, මෙහෙයුම්වල අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව ඇගයීම, මෙහෙයුම්වල අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම, නීති රීති, රෙගුලාසි, ප්‍රතිපත්ති, ක්‍රමවේද, ගිවිසුම්ගත බැඳීම් තක්සේරු කිරීම ආදිය ඇතුළත් විවිධ කාර්යයන් සිදු කරන අතර වාර්තා වූ වංචා, අයුතු අත්පත්කර ගැනීම්, නාස්තිය, විෂමාචාර ආදිය පිළිබඳව විමර්ශනය කරයි.

තවද, මූල්‍ය සහ කළමනාකරණ වාර්තා කිරීම්වල විශ්වාසනීයත්වය සහතික කිරීම, විගණන කමිටුව වෙත වාර්තා කිරීම සහ විගණකාධිපතිවරයා සමඟ අඛණ්ඩව සම්බන්ධීකරණය වෙමින් විගණන කමිටු රැස්වීම් කැඳවීම සහ නියමිත වේලාවට ව්‍යවස්ථාපිත වාර්තා කිරීම් (විගණකාධිපතිවරයා, COPE, භාණ්ඩාගාරය සහ රේඛීය අමාත්‍යාංශය ආදී) වැනි අනෙකුත් කාර්යයන් ද මෙම අංශය මගින් සිදුකරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, තත්ත්වාගණනය කරන ලද මතයට තුඩුදෙන, විගණකාධිපතිවරයා විසින් වාර්තා කරන ලද වැදගත් ගැටළු විසඳීමේදී සම්බන්ධ වන අතර තත්ත්වා ගණනය නොකරන ලද මතයක් ලබාගැනීම සඳහා සාර්ථකව සහය වී ඇත.

ඉහත කාර්යයන්වලට අමතරව, විගණන අංශය කළමනාකරණය නියම කරන පරිදි සහ සුදුසු විනයානුකූල සහ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම මගින් පොදු අයිතිය/දේපළ සුරකීමේ දැක්ම ඇතිව ප්‍රමාදයන්/දෝෂ පිළිබඳ වාර්තා කිරීම් සම්බන්ධයෙන් විශේෂ විමර්ශන/පරීක්ෂණ සිදු කිරීම සඳහා වගකියනු ලැබේ. ඉහත ක්‍රියාකාරකම් සිදුකරන අතර සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සෘජුවම වාර්තා කිරීම සහ එහි ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා විගණන කමිටුව සමඟ අඛණ්ඩව සම්බන්ධීකරණය කිරීම මගින් සිය ස්වාධීනත්වය පවත්වා ගනී.

මානව සම්පත්

මානව සම්පත් දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වන්නේ සේවකයින් අභියෝගාත්මක ආර්ථික සහ සමාජ තත්වයන් ඔස්සේ ඉදිරියට යාමේදී ඔවුන්ගේ උපරිම සහය ලබා ගැනීමයි. තවද, මානව සම්පත් අංශය වඩාත් සවිබල ගන්වන ආයතනික ව්‍යුහයක් ඇති කිරීම සහ සේවකයින්ට සහයවන ආකාරයේ සහ සේවකයින් ප්‍රශස්ත පුද්ගලයන් බවට පත්කිරීමට ඉවහල් වන අයුරින් විශේෂයෙන්ම තාක්ෂණය අනුගතකර ගැනීම, ක්‍රියාශීලි වැඩ පරිසරයක් ඇති කිරීම යන ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ ධාරිතාවන් ඉහළ නැංවීමේ කාර්යභාරය අඛණ්ඩව ගවේෂණය කරයි.

පරිපාලන

පරිපාලන අංශය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වැදගත් කාර්යභාරයක් ඉටුකරන අතර ආයතනික ඉලක්ක සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා අංශවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා සංවිධාන සහය ලබාදෙයි. පරිපාලන අංශය යටතේ ගබඩා හා සැපයුම් ඒකකය, ප්‍රවාහන ඒකකය, නඩත්තු ඒකකය, තැපැල් ඒකකය, සාමාන්‍ය පරිපාලනයයන උප ඒකක පහ ක්‍රියාත්මක වේ.

උප ඒකක මගින් සිදුකරන මූලික කාර්යයන් වන්නේ: ආයෝජන මණ්ඩලය තුළ සහ ඉන් පිටත සම්බන්ධතාවය ඉක්මන් කරන අභ්‍යන්තර සහ බාහිර ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම; ප්‍රධාන කාර්යාලයේ කාර්යාල යටිතල පහසුකම් සැපයීම සඳහා බාධා රහිත ක්‍රියාවලියක් පවත්වා ගැනීම, පිළිසකර කිරීම් සහ නඩත්තු කිරීම් සිදුකිරීම, ප්‍රධාන කාර්යාලයේ ආයෝජන මණ්ඩලය පිහිටි මහල් නඩත්තු කිරීම, ස්ථාවර වත්කම්, කුලියට දුන්/ගත් කාර්යාල සඳහා රක්ෂණාවරණ ලබාගැනීම; විදුලිය, ජලය, දුරකථන සන්නිවේදනය, ප්‍රවාහන සහ අනෙකුත් සේවා සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කිරීම සඳහා ලේඛන සකස් කිරීම, වාහන මිලදී ගැනීම සහ අපහරණය, වාහන සමූහය කළමනාකරණය කිරීම, ව්‍යාපෘති අධීක්ෂණ කාර්යයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම, වාහන නඩත්තු කිරීම සඳහා කලාපවලට සහයවීම; ආයතනය අවශ්‍ය භාණ්ඩ සහ සේවා (ලිපි ද්‍රව්‍ය, කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ, සහය සේවා ආදිය) මිලදී ගැනීම සහ ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍ය ගබඩා නඩත්තු කිරීම.

ආරක්ෂක සේවා

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ගිනි හා ආරක්ෂක සේවා අංශය, ආයෝජන කලාපයන්හි පිහිටා ඇති ව්‍යවසායයන් ඇතුළුව ඒවායේ දේපළ සහ මිනිස් ජීවිත ආරක්ෂා කිරීමේ මූලික කාර්යභාරය ඉටුකරයි. එමගින් ආරක්ෂක හා ගිනි නිවීමේ කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම, අවශ්‍ය පරිදි ඔවුන් ශක්තිමත් කිරීම මගින් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් සඳහා පහසුකම් සළසයි.

පරීක්ෂා කිරීමේ ස්ථාන පිහිටුවීම මගින් සහ ව්‍යවසායන්හි ආරක්ෂක නිලධාරීන් සමඟ සම්බන්ධ වෙමින්, සොරකමක්, ගින්නක්, විෂමාචාරයක් වැනි සිදුවීමකදී අවශ්‍යතාවයක් ඇති වන්නේ නම් පොලීසිය සහ අනෙකුත් නීති බලාත්මක කිරීමේ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් දවසේ පැය 24 පුරා ආයෝජන කලාපයන්ට ආරක්ෂාව සැපයීම, ආයෝජන කලාපයන් තුළ සහ ඉන් පිටත ගින්නක් හෝ හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම, ව්‍යවසායයන්හි ගිනි වැළැක්වීම්, පරීක්ෂා කිරීම් සහ ගිනි අවදානම් ඇගයීම් සිදු කිරීම, ආරක්ෂාව පිළිබඳ උපදෙස් ලබාදීම සහ ව්‍යවසායයන්හි ගිනි අවදානම් ඇගයීම, ව්‍යවසායයන්හි කාර්ය මණ්ඩලය සහ සේවකයින් සඳහා ගිනි උපකරණ භාවිතය සහ ප්‍රථමාධාර පිළිබඳ පුහුණු පැවැත්වීම සහ ව්‍යවසායයන් සඳහා ගිනි අනුකූලතා, පුහුණු සහ ඉවත්වීමේ සහතික නිකුත් කිරීම මෙම අංශය විසින් ඉටුකරන සේවාවන්ට අයත් වේ.


මූල්‍ය සමාලෝචනය - 2023

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා මූල්‍ය කාර්යසාධනය	2023 (රු. මිලි)	2022 (රු. මිලි)	Change (%)
ආදායම	8,171	5,973	37
මුළු මෙහෙයුම් වියදම්	4,385	4,075	7
මෙහෙයුම් ලාභය	3,786	1,898	99
මූල්‍ය අදායම	2,693	1,402	92
මූල්‍ය වියදම්	4	7	(43)
බදුකරණයට පෙර අතිරික්තය	6,475	3,293	97
බදු වියදම්	808	372	117
බදුකරණයට පසු අතිරික්තය	5,667	2,921	94
වසර අවසානයේ මූල්‍ය තත්ත්වය (රු. මිලි)			
වත්කම්	73,911	68,362	8
සමකොටස්	55,250	50,698	9

අතිරික්තය

සමාලෝචිත වර්ෂයේදී ආදායම් බදු පෙර ලාභය රු. මිලි. 6.475ක් විය. 2022 වසරේ රු. මිලි. 2.922ක් වූ මෙම අගය පසුගිය වසරේ දී රු. මිලි. 5.667 දක්වා වැඩි වී ඇත. මෙය පසුගිය වසර හා සැසඳීමේදී 94%ක වැඩිවීමකි.


රු. මිලි.



ආදායම

2022 වසරේ දී රු.මිලි. 5,973 දී වූ මුළු මෙහෙයුම් ආදායම 37%ක වැඩිවීමක් වාර්තා කරමින් රු. මිලි. 8,171 දක්වා වැඩි වී ඇත. ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණ වීම මෙම වැඩිවීමට මූලිකව හේතුවී තිබේ. දළ ආදායමේ සංරචක "මෙහෙයුම් පදනම්" සහ "මෙහෙයුම් නොවන පදනම්" අයිතමවලින් සමන්විත වේ. මෙහෙයුම් පදනම් ආදායම බිම් කුලිය, වාර්ෂික ගාස්තු, ආනයන/අපනයන සේවා ගාස්තු, ජල ආදායම, බලපත්‍ර ගාස්තු, ගිවිසුම් සැකසුම් ගාස්තු සහ විවිධ ආදායම්වලින් සමන්විත වේ. මෙහෙයුම් නොවන පදනම් ආදායම ප්‍රධාන වශයෙන්ම පොලී ආදායම මගින් ලැබී ඇත. කාලසීමාව සඳහා පොලී ආදායම රු. මිලි. 1,292 දක්වා වැඩි වී ඇති අතර 2022 වසර හා සැසඳීමේදී එම අගය 92% වැඩිවීමකි. ආයෝජන සංයුතියට එදිරිව රජයේ සුරකුම්පත් වල පොලී අනුපාත වැඩිවීම මීට හේතු වී ඇත. කාල සීමාව සඳහා වන පොලී ආදායම රු. මිලි. 2,694කි.


රු. මිලි.



වියදම

මුළු මෙහෙයුම් වියදම 2022 වසරේ අගය වූ රු. මිලි. 4,075 සිට 2023 වසරේදී රු.මිලි. 4,386 දක්වා 8%කින් වැඩි වී ඇත. පසුගිය වසර හා සැසඳීමේදී පරිපාලන වියදම 2%කින් අඩු වී ඇත. ගොඩනැගිලි නඩත්තු කිරීම, කාර්යමණ්ඩල සුභසාධනය සහ ප්‍රවාහනය හා අදාල වියදම්වල වැඩි වීමක් සිදු වුවද, මෙසේ පරිපාලන වියදමෙහි අඩුවීම වාර්තා වී ඇත.


රු. මිලි.



රජයේ බදු

2022 වසරේදී රු.මිලි. 551 ක් වූ රජයේ බදු 2023 වසරේ දී රු.මිලි. 1,289 දක්වා 168%ක ප්‍රතිශතයකින් වැඩි විය. ආයතනික ආදායම් බදු අනුපාතය 24% සිට 30% දක්වා සංශෝධනය කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. එයට අමතරව පොලී ආදායම වැඩිවීම ද මණ්ඩලයේ ආදායම් බදු වැඩිවීමට සෘජුවම බලපා ඇත.

රු.මිලි.



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2014 සිට 2023 දක්වා ආදායම් ප්‍රකාශ පිළිබඳ විශ්ලේෂණය

මූල්‍ය වර්ෂය	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
ආදායම	**3,100,162,918.00**	**3,213,557,727.00**	**3,605,145,347.00**	**3,711,862,608.00**	**3,889,614,384.00**	**4,646,091,668.00**	**4,251,299,069.00**	**4,911,181,363.00**	**5,973,226,716.00**	**8,171,423,461.00**
අඩු කළා, විදයම										
මෙහෙයුම් විදයම්	299,383,652.00	276,739,350.00	265,978,777.00	265,378,860.00	267,056,012.00	322,000,510.00	273,552,379.00	286,687,112.00	327,676,479.00	420,429,286.00
පරිපාලන විදයම්	2,301,683,057.00	2,488,716,775.00	2,639,675,029.00	2,724,737,397.00	2,846,961,666.00	3,165,507,063.00	3,192,487,029.00	3,344,826,022.00	3,536,143,256.00	3,451,664,100.00
රජයේ බදු	161,676,718.00	121,148,196.00	116,511,263.00	190,599,853.00	230,591,904.00	254,568,577.00	88,787,598.00	98,955,130.00	179,015,723.00	480,738,154.00
අනෙකුත් වියදම්	25,419,143.00	26,390,038.00	26,528,404.00	29,943,193.00	30,301,326.00	31,290,987.00	36,038,612.00	57,713,652.00	31,799,404.00	32,930,685.00
මුළු වියදම්	2,788,162,570.00	2,912,994,359.00	3,048,693,473.00	3,210,659,303.00	3,374,910,907.00	3,773,367,137.00	3,590,865,618.00	3,788,181,916.00	4,074,634,862.00	4,385,762,225.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ප්‍රතිඵල	312,000,348.00	300,563,368.00	556,451,874.00	501,203,305.00	514,703,477.00	872,724,531.00	660,433,450.00	1,122,999,447.00	1,898,591,854.00	3,785,661,236.00
මූල්‍ය ආදායම	135,105,411.00	118,628,543.00	222,265,759.00	336,920,319.00	344,450,042.00	411,444,914.00	321,579,138.00	329,766,108.00	1,402,022,856.00	2,693,563,207.00
මූල්‍ය විදයම	14,534,281.00	12,025,173.00	10,588,937.00	10,940,559.00	7,737,398.00	10,657,560.00	13,873,362.00	10,216,636.00	6,900,963.00	4,562,509.00
ශුද්ධ මූල්‍ය ආදායම	120,571,130.00	106,603,370.00	211,676,822.00	325,979,760.00	336,712,644.00	400,787,354.00	307,705,775.00	319,549,472.00	1,395,121,893.00	2,689,000,698.00
බදුකරණයට පෙර අතිරික්තය	432,571,478.00	407,166,738.00	768,128,696.00	827,183,067.00	851,416,121.00	1,273,511,885.00	968,139,226.00	1,442,548,919.00	3,293,713,748.00	6,474,661,936.00
බදු වියදම	30,786,759.00	26,031,646.00	47,342,329.00	70,759,017.00	92,323,030.00	115,204,576.00	81,246,467.00	79,143,866.00	372,056,361.00	808,068,962.00
වසර සඳහා අතිරික්තය	401,784,719.00	381,135,092.00	720,786,367.00	756,424,050.00	759,093,091.00	1,158,307,309.00	886,892,759.00	1,363,405,053.00	2,921,657,387.00	5,666,592,974.00
අනෙකුත් විස්තීර්ණ ආදායම										
බැඳීම මත ආයුගණක (ලාභ)/(පාඩු)	28,339,987.00	(29,335,586.00)	(14,247,556.00)	25,054,316.00	10,973,058.00	51,499,585.00	75,380,123.00	(81,555,310.00)	(5,809,848.00)	(127,437,109.00)
මුළු විස්තීර්ණ ආදායම	**373,444,732.00**	**410,470,678.00**	**735,033,923.00**	**731,369,734.00**	**748,120,033.00**	**1,106,807,724.00**	**811,512,636.00**	**1,444,960,363.00**	**2,915,847,539.00**	**5,539,155,865.00**

ආයතනික පාලන වාර්තාව

1978 අංක 04 දරන පනත යටතේ මූලිකව ස්ථාපනය කරන ලද මහ කොළඹ ආර්ථික කොමිසමට (GCEC) අනුප්‍රාප්තික වශයෙන්, 1992 අංක 49 දරන පාර්ලිමේන්තු පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයන් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) ස්ථාපනය කරනු ලැබූ අතර එහි මූලික අරමුණු පහත දැක්වේ.

අ) රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම සහ දිරිමත් කිරීම

ආ) රටේ ආර්ථිකයේ පදනම පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම

ඇ) රට තුළ විදේශ ආයෝජන දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

ඈ) විදේශ විනිමය ඉපයීමේ ප්‍රභවයන් විවිධාංගිකරණය කිරීම සහ මෙරට අපනයන ඉපයීම් වැඩිකිරීම

ඉ) රට තුළ කාර්මික සහ වාණිජ ව්‍යවසායන් ස්ථාපනය කිරීම දිරිමත් කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීම

ඊ) 4 වන වගන්තියේ දැක්වෙන අධිකාරි බලය ඇති ක්ෂේත්‍රය තුළ කටයුතු පරිපාලනය කිරීම; සහ

උ) ඉහත අරමුණු වලින් එකක් හෝ සියල්ලම ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය හෝ සහෝපකාරී වියහැකි අනෙකුත් සියලු කාර්යයන් ඉටුකිරීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙරටට සෘජු විදේශ ආයෝජන (FDI) ආකර්ෂණය කරගැනීම සඳහා මූලිකව කටයුතු කරන රාජ්‍ය ආයතනය වන අතර ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ආයෝජන සඳහා පහසුකම් සැලසීම, කාර්මික සංවර්ධනය ඇති කිරීම සහ සහය සේවාවන් සඳහා ප්‍රවේශය ක්‍රමවත් කිරීමේ වගකීම එයට පැවරී ඇත.


පාලන ව්‍යුහය

ආයතනික පාලනය යනු ඵලදායී අයුරින් සම්පත් භාවිතා කිරීම සඳහා, ආයතනයේ පාර්ශවකරුවන්ට වඩාත් හිතකර අයුරින් වැඩි විනිවිදභාවයකින් යුතුව වඩා හොඳ සහ කාලීන මූල්‍ය වාර්තාකරණය තහවුරු කරමින් ආයතනය සඳහා මගපෙන්වීම සහ පාලනය කිරීමේ ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම මගින් ඇතිවන සමස්ත පද්ධතියයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යහපාලනය පිළිබඳ මූලික වගකීම සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇත.

පාලන රාමුව අළුතින් පනවන නියෝගයන්ට සහ යහ පැවතුම් වලට අනුව ක්‍රියාත්මක වන බවටත්, එමගින් ආයතනයේ වටිනාකම් ආරක්ෂා කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ උපායමාර්ගික අරමුණු ළඟාකර ගැනීම සඳහා සහයවීම පිළිබඳවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කෙරේ.

පාලන රාමුව සහ ව්‍යුහය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය මෙහෙයුම් සිදුකරන සෑම ක්ෂේත්‍රයකම පාලන රාමුවක් පවත්වා ගනු ලැබේ.



අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය කරන, ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. ආයතනයේ කාර්යසාධනය සමාලෝචනය කිරීම, උපායමාර්ගික මාර්ගෝපදේශ සකස් කිරීම සහ කලමනාකරණය සඳහා මාර්ගෝපදේශ ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිරන්තරයෙන් පැවැත්වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුවම රජයට වගකියනු ලැබේ. ආයෝජන මණ්ඩලය අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ කලමනාකරණය කිරීම රජයට සහ රාජ්‍ය නිලධාරීන්ට පැවරී ඇති අතර ආයෝජන මණ්ඩලය පාර්ශවකරුවන් සඳහා වඩාත් හිතකර අයුරින් සහ නියාමන රාමුව තුළ එයට සම්පූර්ණයෙන්ම අනුකූලව ක්‍රියාත්මක වන බව තහවුරු කිරීමේ කාර්යය ද එයට අයත්ය.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ මූලික වගකීම් වන්නේ:

- ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා, ප්‍රතිපත්ති, අරමුණු හා ඉලක්කයන්ට අනුව උපායාමාර්ගික මෙහෙයුම් දියත් කිරීම
- මාර්ගෝපදේශ සකස් කිරීම සහ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඒවායේ ඵලදායිතාවය තහවුරු කිරීම.
- අරමුණු සහ ඉලක්කයන්ට එරෙහිව කාර්ය සාධනය අධීක්ෂණය කිරීම
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සහ ඉහළම මට්ටමේ ආචාර ධර්ම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බව සහතික කිරීම.

- ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍ර සියල්ලම කේන්ද්‍රගතවූ, ඒ සඳහා ඉක්මනින් කටයුතු කිරීම සඳහා සුදුසු සහ ප්‍රමාණවත් පාලනයක් සහ අධීක්ෂණය කිරීමේ මෙන්ම වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් - 2023

අධ්‍යක්ෂ මණ්ඩලයට මෙන්ම කළමනාකාරිත්වයට රැස්වීම් වලදී සාකච්ඡා කිරීමට අවශ්‍ය කරන සියලු වැදගත් සහ උපායමාර්ගික තොරතුරු පිළියෙල කරගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් කාලසීමාවක් සහිතව දැනුම්දීම සිදුකිරීම මගින් රැස්වීම් සඳහා දින නියම කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයට ඒවායේ අන්තර්ගත කරුණු අධ්‍යයනය කිරීම සඳහා සෑහෙන කාලයක් ලබාදෙමින් සෑම රැස්වීමකදීම අවම වශයෙන් දින හතකට පෙර ඔවුන්ට න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ලබාදෙනු ලැබේ. අමතර තොරතුරු ඉදිරිපත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට තවදුරටත් පැහැදිලි කිරීම් සිදුකිරීමට අවශ්‍ය වන්නේ නම් එවන් අවස්ථාවන්හිදී අංශ ප්‍රධානීන්ට රැස්වීම් සඳහා සහභාගි වන ලෙස ආරාධනා කරනු ලැබේ. සමාලෝචනයට ලක්වූ වසර තුළ සාමාන්‍ය සහ විශේෂ රැස්වීම් ඇතුළුව අවස්ථා දොළහක දී (12) අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය.

2023 වසරේ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය මෙසේය.

අධ්‍යක්ෂවරයාගේ නම	තනතුර	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
දිනේෂ් වීරක්කොඩි මහතා	සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	12
ජයමින් පැල්පොල මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	08
ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	11
එරාජ් ද සිල්වා මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	11
එච්. මනිල් ජයසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	04
චාන්දනී විජයවර්ධන මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	07

කළමනාකාරිත්වය

සියළු මෙහෙයුම් කළමනාකරණය කිරීමේ සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉටුකරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී (CEO) වශයෙන් කටයුතු කරයි. තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහය වෙමින් සහ පහසුකම් සළසමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව, ව්‍යාපෘති අවසන් කිරීමේ කමිටුව, දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව II සහ ප්‍රතිආයෝජන කණ්ඩායම වැනි දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් සමන්විත අභ්‍යන්තර රැස්වීම් කීපයක සභාපතිත්වය දරයි. ආයෝජන මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් සඳහා සහයවීමේ දී අභ්‍යන්තර කමිටු විසින් වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. මෙම කමිටු මගින් උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී මෙන්ම ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී සහය වන අතර අවශ්‍ය විටෙක සිය නිර්දේශ ද ලබාදෙන බැවින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සළසනු ලැබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකරණ කණ්ඩායම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ සහ ආයතනයේ මෙහෙයුම් ඵලදායී, කාර්යක්ෂම මෙන්ම විනිවිදභාවයෙන් කළමනාකරණය කිරීමේ වගකීම දරයි. මෙම කණ්ඩායම ආයතනයේ කාර්ය සාධනයට සහ තිරසාර වර්ධනය ඇතිකිරීම සඳහා වගකියනු ඇත.

තොරතුරු ගලනය

තීරණ ගැනීම සඳහා අධාර වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට විස්තරාත්මක තොරතුරු ලබාදෙනු ලැබේ. කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය අවශ්‍ය අවස්ථාවන්හිදී රැස්වීම් සඳහා සහභාගි වේ. නිසි පරිදි ක්‍රියාමාර්ග ගනු ලබන බව තහවුරු කිරීම සහ ආයතනික පාලන ගැටලු පිළිබඳව උපදෙස් දීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. කාලීන ප්‍රවේශය සහ පාරිසරික ක්ෂමතාවය සළකා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සුරක්ෂිත විද්‍යුත් වේදිකාවක් ඔස්සේ හුවමාරු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ක්‍රමානුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

විගණන කමිටුව

2021 වසරේ නිකුත් කරණ ලද "රජයට අයත් ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ" හි (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021) දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව විගණන කමිටුව සංස්ථාපනය කරනු ලැබීය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව පත්කරන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විතවේ. විගණන කමිටුව මූල්‍ය වාර්තාකරණය මගින් අභ්‍යන්තර පාලනය සඳහා වන ආයතනයේ සමස්ත රාමුව සමාලෝචනය කරන අතර බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය වගකීම් ඉටුකිරීමේදී විගණන කමිටුව සහය ලබාදෙන අතර ආයෝජන මණ්ඩලයේ ක්‍රියාකාරකම් ස්වාධීනව පරීක්ෂා කිරීම සහ ඇගයීම සිදුකරයි. විගණන කමිටුව විසින් අනුමත කරන ලද "අභ්‍යන්තර විගණන සැලැස්ම"ට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලැබේ. සිය නිශ්චිත විෂය පථය, වගකීම් සහ සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට අනුකූලවීම සහතික කරමින් විගණන කමිටුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කරනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද චක්‍ර ලේඛයේ සඳහන් මාර්ගෝපදේශයන්ට අනුකූල වෙමින් 2023 වසරේදී විගණන කමිටු රැස්වීම් පහක් (05) පවත්වනු ලැබීය.

විගණන කමිටු රැස්වීම් වල ප්‍රගතිය

පවත්වන ලද කමිටු සංඛ්‍යාව	15.02.2023	21.06.2023	16.11.2023	21.11.2023	28.11.2023
විගණන කමිටුවේ සංයුතිය					
ජයමින් පැල්පොල මහතා (හිටපු සභාපති)	සහභාගි වී ඇත	සහභාගි වී ඇත	අදාල නොවේ		
මානිල් ජයසිංහ මහතා (නව සභාපති)	අදාල නොවේ		සහභාගි වී ඇත	සහභාගි වී ඇත	සහභාගි වී ඇත
ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය (සාමාජික)	සහභාගි වී ඇත	නොපැමිණෙන බව දන්වා ඇත	නොපැමිණෙන බව දන්වා ඇත	නොපැමිණෙන බව දන්වා ඇත	සහභාගි වී ඇත
චාන්දනී විජයවර්ධන මහත්මිය (සාමාජික)	සහභාගි වී ඇත	සහභාගි වී ඇත	සහභාගි වී ඇත	සහභාගි වී ඇත	සහභාගි වී ඇත
ආචාර්ය එම්.කේ.සී.සේනානායක මහතා (හිටපු නිරීක්ෂක/ භාණ්ඩාගාර නියෝජිත)	සහභාගි වී ඇත	සහභාගි වී නැත	අදාල නොවේ		
කේ.ඒ. විමලේන්තිරරාජා මහතා (නව නිරීක්ෂක / භාණ්ඩාගාර නියෝජිත)	අදාල නොවේ		සහභාගි වී නැත	සහභාගි වී නැත	සහභාගි වී නැත
රුවන් පෙරේරා මහතා (විගණන කමිටුව සඳහා ICASL ස්වේච්ඡා උපදේශක)	සහභාගි වී ඇත	සහභාගි වී ඇත	නව කමිටුව සඳහා පත්කර නොමැත		

අභ්‍යන්තර පාලනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදුකරන ලද සියළු ගනුදෙනු නිසි ආකාරයෙන් බලය ලැබූ බව, වාර්තා වූ සහ වාර්තා කරනු ලැබූ බවට සැලකිය යුතු සහතිකයක් ලබාදීම සඳහා සකස් වූ අභ්‍යන්තර පාලනයක් පවත්වා ගෙන යනු ලබන බව සහතික කිරීමේ වගකීම ආයෝජන මණ්ඩලය සතුය. සංවිධාන ව්‍යුහය ප්‍රධාන කාර්යාලය සහ කලාප වශයෙන් ක්‍රියාත්මකවේ. සෑම දෙපාර්තමේන්තුවකම සහ ආයෝජන කලාපයක ප්‍රධානියා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයාට සෘජුවම වාර්තා කරයි. අභ්‍යන්තර විගණකවරයා සෘජුවම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාකරන බැවින් අභ්‍යන්තර විගණකවරයාගේ ස්වාධීනත්වය ශක්තිමත් කෙරේ. ගනුදෙනු වල විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරන අතර එමගින් ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ට එක හා සමාන අවස්ථාවන් ලබාදේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රාග්ධන අයවැය, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රගති වාර්තා ඇතුළත් වාර්ෂික අයවැය මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

වගවීම සහ විගණනය

රජය විසින් මහජනයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසායන් ස්ථාපනය කිරීම, හිමිකාරිත්වය පවත්වා ගැනීම සහ මෙහෙයුම් කිරීම සිදු කරයි. එමනිසා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය, රේඛීය අමාත්‍යාංශය ලෙස මුදල් අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමේ වගකීම දරයි. ඉහත වගකීම් ඉටුකරමින්, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වත්මන් ප්‍රගතිය ඇතුළත් වාර්ෂික වාර්තාව, වාර්ෂික අයවැය, කාර්තුමය කාර්ය සාධන වාර්තා එම අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතින්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතට අනුකූලව, විගණකාධිපතිවරයා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවස්ථාපිත විගණකවරයා වශයෙන් සේවය කරයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්ය සාධනය, මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව මන්ත්‍රීවරුන්ගේ සමාලෝචනය සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කෙරේ. රාජ්‍ය ව්‍යවසායක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පාර්ලිමේන්තුවේ "පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව" (COPE) සඳහා ද වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන - 2023

(2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා)

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා	සටහන	2023 රු.	2022 රු.
ආදායම	**4**	**8,171,423,461**	**5,973,226,716**
අඩුකලා : වියදම්			
මෙහෙයුම් වියදම්	**6**	420,429,286	327,676,479
පරිපාලන වියදම්	**7**	3,451,664,100	3,536,143,256
රජයේ තීරුබදු	**8**	480,738,154	179,015,723
වෙනත් වියදම්	**9**	32,930,685	31,799,404
මෙහෙයුම් වියදම් එකතුව		4,385,762,224	4,074,634,862
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් අතිරික්තය		**3,785,661,237**	**1,898,591,854**
මූල්‍ය ආදායම		2,693,563,207	1,402,022,856
මූල්‍ය වියදම්		4,562,509	6,900,963
ශුද්ධ මූල්‍ය ආදායම	**10**	**2,689,000,698**	**1,395,121,893**
ආදායම් බදු ආදායමට පෙර අතිරික්තය		**6,474,661,936**	**3,293,713,748**
බදු වියදම්		808,068,962	372,056,361
වසර සඳහා අතිරික්තය		**5,666,592,974**	**2,921,657,387**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා	සටහන	2023 රු.	2022 රු.
වසර සඳහා අතිරික්තය		**5,666,592,974**	**2,921,657,387**
වෙනත් විස්තීර්ණ ආදායම්			
අඩුකලා: නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභ/(පාඩු)	**21.2**	(127,437,109)	(5,809,848)
වසර සඳහා විස්තීර්ණ ආදායමේ එකතුව		**5,539,155,865**	**2,915,847,539**

පිටු අංක 56 සිට 78 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	**2023** **රු.**	**2022** **රු.** (නැවත ප්‍රකාශිත)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	11.1	16,288,025,757	16,531,843,296
කල් බදු ගත් දේපළ භාවිතා කිරීමේ අයිතිය	11.2	22,677,164	58,990,148
ආයෝජන දේපළ	12	39,485,378,579	39,509,893,878
අස්පෘශ්‍ය වත්කම්-මෘදුකාංග		1,137,500	1,202,500
සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්	13	1,020,617,559	663,949,641
මූල්‍යමය වත්කම්	14	1,296,871,768	1,384,805,836
ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වත්කම්	21	47,964,636	151,364,473
ජංගම නොවන වත්කම් එකතුව		**58,162,672,964**	**58,302,049,772**
ජංගම වත්කම්			
භාණ්ඩ වට්ටෝරු		27,806,717	19,624,040
මූල්‍ය වත්කම්	15	5,244,577,206	6,642,855,587
ව්‍යවසායන් මගින් ලැබිය යුතු දෑ	16	1,050,808,582	514,554,207
අත්තිකාරම් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ	17	664,827,531	713,888,827
මුදල් හා මුදලට සමාන දෑ	18	8,760,852,396	2,169,387,636
ජංගම වත්කම් එකතුව		**15,748,872,432**	**10,060,310,297**
වත්කම් එකතුව		**73,911,545,397**	**68,362,360,070**
සම කොටස් හා වගකීම්			
සම කොටස්			
සමුච්චිත අරමුදල		39,909,170,216	35,357,128,174
සංචිත		15,340,693,234	15,340,693,234
		55,249,863,450	**50,697,821,408**
විලම්බිත ආදායම	20	16,917,566,079	16,281,302,053
විලම්බිත වියදම්	19	(450,308,755)	(485,280,787)
		16,467,257,324	**15,796,021,266**
සම කොටස් එකතුව		**71,717,120,774**	**66,493,842,674**
ජංගම නොවන වගකීම්			
ජංගම නොවන මූල්‍යමය කල්බදු වගකීම්	22	372,679	13,375,247
ජංගම නොවන වගකීම් එකතුව		**372,679**	**13,375,247**
ජංගම වගකීම්			
ජංගම නොවන මූල්‍යමය කල්බදු වගකීම්	22	13,002,568	21,137,648
සමුච්චිත වියදම් හා වෙනත් ගෙවිය යුතු දෑ	23	2,005,221,657	1,647,784,849
ගෙවිය යුතු බදු		175,827,720	186,219,651
ජංගම වගකීම් එකතුව		**2,194,051,945**	**1,855,142,149**
සම කොටස් හා වගකීම් එකතුව		**73,911,545,397**	**68,362,360,070**

පිටු අංක 56 සිට 78 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ
ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කිරීම හා අත්සන් කිරීම කරනු ලබන්නේ,

දිනේෂ් වීරක්කොඩි සභාපති	මානිල් ජයසිංහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	රේණුකා එම්. වීරකෝන් අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)	සී.පී. පානඳුර අධ්‍යක්ෂ - මුදල්

06/09/2024

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
සම කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 දිනට

	සමුච්චිත අරමුදල රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	සම කොටස් වල එකතුව රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය	**32,050,723,378**	**15,340,693,234**	**47,391,416,612**
වසර සඳහා විස්තීර්ණ ආදායමේ එකතුව	2,915,847,539	-	2,915,847,539
ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය/ ගෙවිය යුතු ලාභාංශ	(500,000,000)	-	(500,000,000)
සමකොටස් හරහා සෘජුවම වත්කම් පොත් වලට ඇතුළත් කර ගැනීම	599,057,567	-	599,057,567
සමකොටස් හරහා සෘජුවම වත්කම් පොත් වලින් ඉවත් කිරීම	(486,100)	-	(486,100)
අවලංගු වූ ඉඩම් වාරිකය සම කොටස් හරහා ආදායමක් ලෙස පොත් වලට ඇතුළත් කර ගැනීම	156,751,776	-	156,751,776
සම කොටස් හරහා සෘජුවම හඳුනා ගනු ලැබූ බිම් කුලිය ආදායමක් ලෙස පොත් වලට ඇතුළත් කර ගැනීම	23,684,671		23,684,671
සම කොටස් හරහා සෘජුවම පොත් වලට ඇතුළත් කරගනු ලැබූ ඉඩම් වෙන්කිරීමේ ගාස්තු	105,014,515	-	105,014,515
2015 වසර සඳහා වියදම සම කොටස් හරහා සෘජුවම පොත් වලට ඇතුළත් කර ගැනීම.	(155,947)	-	(155,947)
පෙර හඳුනාගත් වියදම සෘජුවම සම කොටස් මත බලපෑම	162,916	-	162,916
පොලී ආදායම ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට හඳුනා ගැනීම	6,527,860		6,527,860
2022 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රකාශිත ශේෂය	**35,357,128,174**	**15,340,693,234**	**50,697,821,408**
2023 ජනවාරි 01 දිනට නැවත ප්‍රකාශිත ශේෂය	**35,357,128,174**	**15,340,693,234**	**50,697,821,408**
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	5,539,155,865	-	5,539,155,865
සම කොටස් හරහා සෘජුව හඳුනාගත් ආදායම ගැලපීම1	(388,197)		(388,197)
හිමිකම් නොකියන ලද ETF/FPF ආපසු පොත් වලට ගැනීම [2]	86,613		86,613
සම කොටස් හරහා සෘජුවම බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ කලාප කාර්යාල ගොඩනැගිල්ල සඳහා ගැලපීම [3]	5,805,011	-	5,805,011
සම කොටස් හරහා හඳුනාගත් ඉඩමේ වටිනාකම සඳහා ගැලපීම [4]	(2,000,000)		(2,000,000)
අවලංගු වූ ව්‍යාපෘතිවල ඉඩම් වාරිකය සම කොටස් හරහා ආදායමක් ලෙස හඳුනා ගැනීම [5]	2,995,105		2,995,105
ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය/ ගෙවිය යුතු ලාභාංශ [6]	(1,000,000,000)		(1,000,000,000)
සම කොටස් හරහා වත්කම් සෘජුවම හඳුනා ගැනීම [7]	6,387,645		6,387,645
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**39,909,170,216**	**15,340,693,234**	**55,249,863,450**

පිටු අංක 56 සිට 78 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

1. 2022 වසර සඳහා වාර්ෂික ගාස්තු අවලංගු කිරීම මගින් ඇති වන ආදායම් බලපෑම සෘජුවම සම කොටස් හරහා හඳුනා ගනී.
2. හිමිකම් නොකියන ලද EPF/ETF පසුගිය වසර සඳහා ආපසු පොත් වලට ගැනීම - ආයෝජන මණ්ඩලයේ පෙර සභාපතිවරයා
3. බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ කලාපීය කාර්යාල ගොඩනැගිල්ලේ නිවැරදි වටිනාකම හඳුනා ගැනීමේ බලපෑම.
4. රඹුක්කන පිහිටි ඉඩමේ නිවැරදි වටිනාකම හඳුනා ගැනීමේ බලපෑම.
5. අවලංගු කරන ලද ව්‍යාපෘති වල ඉඩම් වාරිකය හඳුනා ගැනීම මත ආදායම සඳහා බලපෑම.
6. මණ්ඩලය විසින් ලාභාංශ ලෙස භාණ්ඩාගාරයට රු.මිලි. 1,000 ක් වෙන්කර ඇත.
7. ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කර නොමැති වත්කම් සම කොටස් හරහා සෘජුවම හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා	2023 රු. (මිලි)	2022 රු. (මිලි)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ		
මෙහෙයුම් මගින් උත්පාදනය වූ මුදල් (24 සටහන)	3,066.97	2,454.24
ආදායම් බදු ගෙවීම්	(818.46)	(210.12)
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගෙවීම	(58.16)	(69.41)
ලැබූ විලම්භිත ආදායම	919.20	945.06
මුදල් ආපසු ගෙවීම්	-	(29.68)
ලැබූ ඉඩම් වෙන්කිරීම	49.75	-
ETF ආපසු ගෙවීම්	0.09	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මූල්‍ය ඇතුළට ගැලීම් / (පිටතට ගැලීම්)	**3,159.38**	**3,090.09**
ආයෝජන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ		
ලැබූ ආයෝජන ආදායම	2,717.79	1,131.72
රජයේ සුරක්ෂණයන්හි ආයෝජනය කිරීම්	1,458.36	(7,141.42)
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(71.86)	(35.64)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල්	9.96	2.20
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්	(655.87)	(376.24)
විලම්භිත වියදම්	(1.88)	(3.17)
ආයෝජන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මූල්‍ය ඇතුළට ගැලීම් / (පිටතට ගැලීම්)	**3,456.50**	**(6,422.55)**
මූල්‍යයන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ		
ගෙවූ කල්බදු වාරික	(24.42)	(30.53)
භාණ්ඩාගාරය වෙත අරමුදල් මාරුකිරීම්	-	(415.95)
මූල්‍යන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මූල්‍ය ඇතුළට ගැලීම් / (පිටතට ගැලීම්)	**(24.42)**	**(446.47)**
මුදල් හා මුදලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	6,591.46	(3,778.93)
වසර ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ	2,169.39	5,948.32
වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ	**8,760.85**	**2,169.39**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. වාර්තා කරනු ලබන ආයතනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය යටතේ ස්ථාපනය කරනු ලැබීය. එහි ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එවෙලොන් චතුරශ්‍රය, කොළඹ 01 යන ස්ථානයේ පිහිටා තිබේ.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සම කොටස් වෙනස්වීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් හා සටහන් සමග මණ්ඩලයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති නියෝජනය කරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/ LKAS) අනුකූලව පිළියෙල කර ඇත.

2.2 *ඇස්තමේන්තු, විනිශ්චයන්, හා උපකල්පනයන් භාවිතා කිරීම*

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම්වල වාර්තාගත ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන සිදුකිරීම හා වාර්තා කරන දිනට අවිනිශ්චිත වගකීම් අනාවරණය කිරීම අවශ්‍ය කෙරේ. ඇස්තමේන්තු හා මූලික උපකල්පන සිදුකෙරෙමින් පවතින පදනම මත සමාලෝචනය කෙරේ. කෙසේවුවද, මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිතභාවය මගින් අනාගතයේදී වත්කම් හෝ වගකීම්වල ඉදිරියට ගෙන එන අගයට බලපාන ප්‍රමාණාත්මක ගැලපීම් අවශ්‍යය වියහැකි ප්‍රතිඵල ඇතිකළ හැකි වේ.

2.*3 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම*

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2024 සැප්තැම්බර් 06 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සටහන් වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමට සහ නිකුත් කිරීමට බලය ලබාදී ඇත.

2.4 තුලනාත්මක තොරතුරු

වත්මන් කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම සහ අන්තර් කාලසීමාවේ අනුකූලතාවය වැඩිදියුණු කිරීම සඳහා පෙර වර්ෂය හා සම්බන්ධ තුලනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණයකර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් ලබාදීම සඳහා වත්මන් වසරේ වර්ගීකරණය සමග අනුකූලවීම අවශ්‍යවන විටක තුලනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.

2.5 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය, 2024 ආගෝස්තු 09 වන දින ගරු කථානායකවරයා විසින් සහතික කරන ලද 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනතේ 193 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් අවලංගු වනු ඇත.

කෙසේවුවද, 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනතේ 193 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව II වන කොටසේ III වන කොටසේ සහ 193 වන වගන්තියේ ඇතුළත් විධිවිධාන හැර අනෙකුත් විධිවිධාන මෙම පනත සම්බන්ධයෙන් ගරු කථානායකවරයා විසින් සහතික කරන ලද දින සිට ක්‍රියාත්මක වනු ඇති අතර, 1 වන වගන්තියේ (3) වන උපවගන්තිය අනුකූලව, 1 වන වගන්තියේ (2) වන උප වගන්තියේ දක්වා ඇති පරිදි කථානායකවරයා විසින් සහතික කරන ලද දිනයක සිට මාස තුනක කාලයක් තුළ වන දිනකදී ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන දිනකට පසුව පමණක් II වන කොටසේ III වන කොටසේ සහ 193 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වනු ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් මණ්ඩලයේ අඛණ්ඩව ඉදිරියට පැවතීමේ හැකියාව තක්සේරු කර ඇති අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනට එය සතු සම්පත් භාවිතා කරමින් ශක්‍ය අනාගතයක සිය මෙහෙයුම් අඛණ්ඩව ඉදිරියට ගෙනයාම පිළිබඳ කළමනාකරණයට සාධාරණ අපේක්ෂාවක් පවතී.

ඒ අනුව, 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය අවලංගු කිරීමේ අපේක්ෂාව නොතකා ශ්‍රී ලංකා ආර්ථික කොමිසම (ECSL) විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම් අන්තර්ග්‍රහණය කරනු ඇත.

එබැවින්, ඉදිරියේ පෙනෙන්නට ඇති අනාගතය පිළිබඳව පවතින සියලු තොරතුරු සැළකීමේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම් ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවක් දක්නට නොමැත. මේ නිසා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය දිගින් දිගටම අඛණ්ඩ පැවැත්ම පදනම අනුගත කරගෙන ඇත.

2.6 ව්‍යවහාර හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මණ්ඩලයේ ව්‍යවහාර කරනු ලබන මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වන අතර මූල්‍ය ප්‍රකාශන ද ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1 මූල්‍ය වත්කම්

මණ්ඩලය මගින් එහි මූල්‍ය වත්කම්, ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කරනු ලබන අතර මූල්‍ය වත්කම් ආයෝජනය කිරීමේ සාධාරණ අගයට මනිනු ලැබේ. මුලික හඳුනා ගැනීමේදීම කළමනාකරණය විසින් වර්ගීකරණය තීරණය කරනු ලබන අතර ආයෝජනය කරන හා අත්පත් කරගනු ලබන අරමුණ සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත රඳා පවතී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(අ) වර්ගීකරණය

(i) *ණය හා ලැබිය යුතු දෑ*

ණය හා ලැබිය යුතු දෑ යනු ක්‍රියාකාරී වෙළඳපලෙහි මිළ ගණන් දක්වා නොමැති ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. සාමාන්‍ය ගනුදෙනු මගින් ජනිත වන ලැබිය යුතු දෑ ද මෙම කාණ්ඩය යටතේ වර්ගීකරණය කරනු ලබන අතර හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ.

(ii) *සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් - (කල්පිරෙන තෙක් තබාගනු ලබන මූල්‍ය වත්කම්)*

ස්ථාවර හෝ තීරණය කළහැකි ගෙවීම් හා ස්ථාවර කල්පිරීමක් සහිත මණ්ඩලයේ කළමනාකාරිත්වයට ධනාත්මක ආකල්පයක් හා කල්පිරීම සඳහා රඳවා තැබීමේ හැකියාව ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරෙන තෙක් තබාගනු ලබන මූල්‍ය වත්කම් වේ. මෙම මූල්‍ය වත්කම් හඳුනාගෙන මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සාධාරණ අගයට වර්ගීකරණය කරනු ලැබේ.

(ආ) ***හානිකරණය***

යම් අපේක්ෂිත ණය පාඩුවක් ඇතිදැයි තීරණය කිරීම සඳහා මූල්‍ය වත්කම් සෑම මූල්‍ය තත්ව ප්‍රකාශය දිනයට සමාලෝචනය කෙරේ. එවන් සඳහනක් ඇති නම්, වත්කම් යථා තත්වයට පත්කර ගැනීමේ ප්‍රමාණය ඇස්තමේන්තුගත කෙරේ. මණ්ඩලය විසින් සෑම විටම මූල්‍ය මෙවලම් කාණ්ඩයක් හරහාම ඇගයීමක් පදනම් කරගෙන අපේක්ෂිත ණය පාඩුව මනිනු ලැබේ. මුදලේ කාලීන වටිනාකම, ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීම, ගනුදෙනුකරුගේ තත්වය විශ්ලේෂණය, ලැබිය යුතු දෑ උප කණ්ඩායම, ණයකරුවන්ගේ ගෙවීම් පිළිබඳ විස්තර, සමාන්තර අගයන්, ණය අවදානමේ කැපී පෙනෙන වැඩිවීමක් ඇගයීම, ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අපහසුතා, නෛතික ගැටළු, සාධාරණ හා අනුග්‍රාහක තොරතුරු සහ අනාගත ආර්ථික තත්වයන් පුරෝකථනය වැනි කරුණු ගණනාවක් මගින් මෙම ඇස්තමේන්තු කිරීම් සිදු කෙරේ.

වත්කමක ඉදිරියට ගෙනයන ප්‍රමාණය හෝ එහි මූල්‍ය උත්පාදන ඒකක එහි ආපසු අයකර ගැනීමේ ප්‍රමාණය ඉක්මවා යනවිට හානිකරණ පාඩුව හඳුනා ගැනේ. හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

(ඇ) ***වත්කම් හා බැරකම් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම.***

පූර්ව කාලීනව හඳුනාගනු ලැබූ හානිකරණ පාඩු, ඒවා අඩුවී තිබේද හෝ තවදුරටත් පවතින්නේ දැයි යම්කිසි සඳහන් කිරීමක් සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ලැබේ. ආපසු අයකර ගත හැකි ප්‍රමාණය තීරණය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තුවල වෙනසක් වී ඇතිනම් හානිකරණ පාඩු ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ.

3.2 ***දේපළ, පිරියත හා උපකරණ***

(අ) ***හඳුනා ගැනීම සහ මැනීම***

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය කිරීම හා යම් සමුච්චිත හානිකරණ පාඩු අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. වත්කම අත්පත් කර ගැනීම සඳහා සෘජුවම දායකවන වියදම් පිරිවැයට අතුලත්වේ. ආයතනය විසින් ඉදිකරන ලද වත්කම්වල පිරිවැයට, ද්‍රව්‍ය සඳහා වන පිරිවැය, සෘජු කම්කරු ශ්‍රමය. වත්කම එමගින් අපේක්ෂිත භාවිතය සඳහා කාර්ය තත්වයට ගෙන ඒමට සෘජුවම දායකවන වෙනත් යම් පිරිවැය, අයිතමය කොටස් කිරීම හා ඉවත් කිරීමේ පිරිවැය සහ ඒවා පිහිටි ස්ථානයේ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුලත්වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

ප්‍රත්‍යාගණන වත්කම් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (SLFRS 1) අනුව, දේපළ, පිරියත හා උපකරණවල අගය තක්සේරු කිරීමේදී 2011 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂයවීම් අඩුකර 2011 ජනවාරි 01 දිනට ඇති පිරිවැය ලෙස සලකා බලනු ලැබේ.

(ආ) ***ක්ෂය කිරීම***

දේපළ, පිරියත හා උපකරණයන්හි සියලු අයිතමයන්හි ක්ෂය කිරීම පිරිවැය/තක්සේරුව අනුව සෘජු රේඛා පදනම මත ගණනය කරනු ලබන අතර එය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් භාවිතයට ගත හැකි විට ඒවා මිලට ගත් වර්ෂයේදී ඒ මත ක්ෂය කිරීම් අයකරනු ලැබේ. දේපළ පිරියත හා උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය අනුව වාර්ෂිකව ක්ෂය කර ඇත. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්කම් කාණ්ඩය	*වසරක් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිශතය*	*කාල සීමාව (වසර)*
ගොඩනැගිලි හා ව්‍යුහයන්	5 - 10	10 - 20
පිරියත හා යන්ත්‍ර	10	10
සවිකිරීම් හා උපාංග	10	10
කාර්යාලීය ලී බඩු හා උපකරණ	10	10
පරිගණක	33.33	3
මෝටර් රථ	20	5

(ඇ) ***හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කමක් හෝ වගකීමක් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම***

දේපළ හා උපකරණ අයිතම අපහරණය කිරීම මත හෝ ඒවා භාවිතයෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට ඒවායේ ඉදිරියට ගෙන එනු ලබන ප්‍රමාණය ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. එසේ දේපළ, පිරියත හා උපකරණ අයිතම ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම නිසා ඇති වන ලාභ හෝ පාඩු, විකිණීමෙන් ලැබෙන මුදල් හා දේපළ වල ඉදිරියට ගෙන එන අගය අතර වෙනස ලෙස තීරණය කරනු ලබන අතර එය ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. (අනෙකුක් මෙහෙයුම් (විවිධ)/ ආදායම්/වියදම් තුළ)

(ඈ) ***තදනන්තර වියදම්***

දේපළ, පිරියත හා උපකරණයක අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය, සංවර්ධනය, ඉදිකිරීමේ පිරිවැය, එම කොටස මගින් ආයෝජන මණ්ඩලයට අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අන්තර්ගතවීමේ ප්‍රවනතාවයක් ඇතිනම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැකිනම් අයිතමයේ ඉදිරියට ගෙන එන අගයට හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරීමේ පිරිවැය එම වියදම් දරන පරිදි ආදායම් සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

(ඉ) **දේපළ, පිරියත හා උපකරණ විකිණීම මගින් ලාභ/පාඩු**

දේපළ, පිරියත හා උපකරණ විශ්‍රාම ගැනීම හෝ අපහරණය මත යම් ලාභ හෝ පාඩු විකිණීම සිදුවන කාල සීමාවේදී හඳුනාගනු ලබන අතර අනෙකුත් මෙහෙයුම් ආදායම් හා වියදම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

(ඊ) ***සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්***

මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනයට නිම නොකරන ලද ව්‍යාපෘති සඳහා වසර තුල දරනු ලැබූ ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වනු ලැබේ. ඒවා යම් සමුච්චිත හානිකරන පාඩුවක් අඩුකර පිරිවැයට දක්වනු ලැබේ. සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් කළමනාකරණය අපේක්ෂා කරන පරිදි මෙහෙයුම් කිරීමට සුදුසු ස්ථානයේ හා තත්වයේ ඇතිවිට දේපළ, පිරියත හා උපකරණ, විලම්භීත වියදම් සහ මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දරන ලද වියදම් යන අදාල වත්කම් කාණ්ඩයට මාරුකරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(උ) ***කල්බදු වත්කම් (කල්බදු වත්කම් භාවිතා කිරීමේ අයිතිය)***

මූල්‍ය වගකීම් යටතේ අත්පත් කර ගනු ලබන වත්කම් අදාල මූල්‍යමය වගකීම හඳුනා ගැනීමත් සමග කල්බදු ගත් මෝටර් වාහන කාණ්ඩය යටතේ ප්‍රාග්ධනීකරණය හා ඇතුලත් කිරීම සිදුකෙරේ. මූල්‍ය කල්බදු යටතේ තබාගනු ලබන වත්කම් ඒවා භාවිතා කරණ කාල සීමාව අනුව ක්ෂය කරනු ලැබේ. කල්බදු ගත් වත්කම් දේපළ, පිරියත සහ උපකරණ යන ශීර්ෂය යටතේ ඇතුළත් කරනු ලබන අතර කල්බදු වගකීම් ජංගම සහ ජංගම නොවන මූල්‍ය වත්කම් වගකීම් යන ශීර්ෂය යටතේ ඇතුළත් කරනු ලැබේ

(උ) ව්‍යුහයන්

ව්‍යුහයන්ගේ සාධාරණ අගය මූලික උප කාණ්ඩ හතක් යටතේ තක්සේරුකර තිබේ. එක් ප්‍රධාන උප කාණ්ඩයක් හා සම්බන්ධ සියලු අයිතම හා උපාංග එක් කොටසක ඒකකයක් සාදන ලෙස සලකනු ලැබේ.

3.3

(අ) ***ආයෝජන දේපළ***

ආයෝජන දේපළ එකී වත්කම් ආයෝජන දේපළ යටතේ වර්ගීකරණය කරනු ලබන දිනයට පවතින පිරිවැයට (පිරිවැය මොඩලය) අනුව සඳහන් කරනු ලැබේ.

ආයෝජන දේපළ හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ හැකියාවක් පවතින්නේනම් හා ආයෝජන දේපළ වල පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ආයෝජන දේපළ හඳුනා ගනු ලැබේ. බදු කුලී ආදායම් ඉපයීමට ඇති දේපළ ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත. ආයෝජන දේපළ වල සාධාරණ අගය මනිනු නොලබන අතර දේපළ කීපයක් හැර ආයෝජන දේපළ පිළිබඳ වෘත්තීය සුදුසුකම් දරන, පිළිගත් ස්වාධීන තක්සේරුකරුවකු විසින් තක්සේරුවක් සිදුකර නොමැත.

ආයෝජන දේපළ අපහරණය කර ඇති විට හෝ ඒවා ස්ථීර වශයෙන්ම භාවිතයෙන් ඉවත්කල විට සහ ඒවායේ අපහරණය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරනවිට ආයෝජන දේපළ ශේෂ පත්‍රයෙන් කපාහරිනු ලැබේ.

(ආ) ***ක්ෂය කිරීම (ක්‍රමක්ෂය)***

ඉඩම් හැර ආයෝජන දේපළ වල පිරිවැය/තක්සේරු කිරීම මත ක්ෂය කිරීම සෘජු රේඛා පදනම මත ගණනය කරනු ලැබේ. ආයෝජන දේපළ, ප්‍රයෝජනවත් ආයු කාලය මත පහත පරිදි වාර්ෂිකව ක්ෂය කර ඇත.

වත්කම් කාණ්ඩය	**වසරක් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිශතය**	**කාල සීමාව (වසර)**
ගොඩනැගිලි	5	20

3.4 අස්පෘශ්‍ය වත්කම්

(අ) හඳුනා ගැනීම හා මැනීම

ආයෝජන මණ්ඩලය විසින් අත්පත් කරගනු ලැබූ සීමිත ප්‍රයෝජනවත් ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගනු ලබන අතර පිරිවැය අඩු කර සමුච්චිත ක්‍රමක්ෂය හා හානිකරණ පාඩුව ගණනය කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(ආ) ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කම් ඒවා භාවිතයට ගනු ලබන දින සිට ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අනුව සෘජු රේඛා පදනමින් ආදායම් ප්‍රකාශයේ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ක්‍රමක්ෂය හඳුනා ගැනේ.

වත්කම් කාණ්ඩය	වසරක් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිශතය	කාල සීමාව (වසර)
මෘදුකාංග බලපත්‍ර - Kiosk	5	20

(ඇ) තදනන්තර වියදම්

එය අදාල වන විශේෂ වත්කමකට ඇතුලත් අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිකරන විට පමණක් තදනන්තර වියදම් ප්‍රාග්ධනීකරණය කෙරේ. අනෙක් සියලු වියදම් ඒවා වියදම් දරන පරිදි ආදායම් සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

(ඈ) විශ්‍රාමයාම සහ අපහරණය

අස්පෘශ්‍ය වත්කම් අපහරණය හෝ ඒවායේ භාවිතය හා තදනන්තර අපහරණය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරණ විට ශේෂ පත්‍රයෙන් කපා හැරේ. අස්පෘශ්‍ය වත්කමක අයිතමයක් අපහරණය මත ලාභ හෝ පාඩු අපහරණය මගින් ලැබෙන මුදල් ඉදිරියට ගෙනඑන ප්‍රමාණය සමග සන්සන්දන කිරීම මගින් තීරණය කරන අතර ආදායම් හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "අනෙකුත් මෙහෙයුම් ආදායම් / (වියදම්)" තුල ශුද්ධ පදනම මත හඳුනා ගැනේ.

3.5 භාණ්ඩ වට්ටෝරු

සියළු භාණ්ඩ වට්ටෝරු අඩු පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි කල හැකි අගයට ගණනය කරනු ලැබේ. පළමුව ලැබූ සහ පළමුව පිටකළ පදනම (FIFO) මත පිරිවැය තීරණය කෙරේ.

3.6 *අනෙකුත් වත්කම්*

වෙනත් වත්කම් වලට අනෙකුත් ණය ගැතියන්, ලැබිය යුතු දෑ, අත්තිකාරම්, තැන්පතු හා පූර්ව ගෙවීම් ඇතුලත් වේ.

(අ) අත්තිකාරම්, තැන්පතු, පෙර ගෙවූ වියදම්

එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩියෙන් ප්‍රතිලාභ හෝ සම්බන්ධතාවයක් ඇති ලෙස සලකනු ලබන වියදම් අත්තිකාරම්, තැන්පතු හා පෙර ගෙවුම්, වියදම් ලෙස වර්ගීකරණය කෙරේ. කාලසීමාව අවසානයේදී එකී වියදම් ඊට අදාල කරුණ අනුව කාල සමානුපාතික පදනම මත කපා හරිනු ලැබේ.

(ආ) අනෙකුත් ණයකරුවන්

අනෙකුත් ණයකරුවන් හානිපූරණ පාඩු අඩුකල පිරිවැයට හඳුනාගනු ලැබේ.

3.7 *මුදල් හා මුදලට සමාන දෑ*

මුදල් හා මුදලට සමානදෑ අත ඇති මුදල් හා දන්නා මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කල හැකි හා අගය වෙනස්වීමේ නොසලකා හැරිය හැකි අවදානමකට ලක්වන කෙටිකාලීන ඉහල ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වේ. මේවා කෙටිකාලීන මුදල් බැඳීම් ලබාගැනීමේ කාර්යය සඳහා රඳවා ගනු ලැබේ.

3.8 *මුදල් ප්‍රවාහ ප්‍රකාශය*

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 7 (LKAS) අනුකූලව වක්‍ර ක්‍රමය යොදා ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

3.9 *සේවක ප්‍රතිලාභ*

(අ) නිර්වචිත දායකත්ව සැලසුම්

අදාල ප්‍රඥාප්ති හා නියෝගයන්ට අනුකූලව සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) හා සේවක භාරකාර අරමුදලේ (ETF) දායකත්වය සඳහා සුදුසුකම් ලබයි. මණ්ඩලය විසින් සේවකයින්ගේ දළ වැටුපට අනුව, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ස්ථාවර දායකත්වයන් ගෙවනු ලබන අතර ගෙවිය යුතු තවත් නෛතික හෝ ගිවිසුම්ගත බැඳීම් නොමැත.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායකත්ව සැලසුම් වලට අමතර පශ්චාද්-සේවය කිරීමේ සැලසුම්වේ. මණ්ඩලය විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව පාරිතෝෂික ගෙවීම සඳහා බැඳී සිටී. ආයුගණක ගනණය කිරිමක් පදනම් කරගෙන පනත යටතේ විධිවිධාන සලසා ඇති පරිදි බැඳීම් තිරණය කෙරේ. ස්වාධීන ආයුගණක ආයතනයක් මගින් "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය" භාවිත කරමින් වාර්ෂිකව ගණනය කිරීම් සිදුකරනු ඇත.

3.10 *වගකීම් හා ප්‍රතිපාදන*

පසුගිය සිද්ධියක් නිරාකරණය කිරීමේදී හා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් වන සම්පත් පිටතට ගලායාමක ප්‍රතිඵලයක් ලෙස ඇතිවේ යයි අපේක්ෂිත වත්මන් නෛතික/සම්මුතික බැඳීම් ඇති විටෙක එය මූල්‍ය තත්ව ප්‍රකාශයේ බැඳීම් හා ප්‍රතිපාදන ලෙස හඳුනාගනු ලැබේ.

ණයදීමනාකරුගේ ඉල්ලීම අනුව හෝ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනයට වසරක් තුල ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස සැලකේ. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට වසරකට පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සැලකේ.

අනෙකුත් වගකීම්

සමුච්චිත වියදම් ඇතුළු අනෙකුත් ණයකරුවන් අනෙකුත් වගකීම් වලට ඇතුලත් වේ. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස සැලකෙන ඓතිහාසික අගයට දක්වනු ලැබේ.

3.11 ආදායම හඳුනා ගැනීම

සේවා/ගාස්තු මගින් ලැබූ හෝ ලැබිය යුතු සේ සලකන ලබන ආදායම සාධාරණ අගයට මනිනු ලැබේ. බලපත්‍ර ගාස්තු හා ගිවිසුම් සැකසුම් ගාස්තු මුදල් පදනම මත හඳුනා ගැනේ.

- **බිම් කුලිය**
  ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම් වසර 30 සිට 99 ක් දක්වා කාලසීමාවකට බදු දීම සඳහා ආයෝජකයින් සමග බදු ගිවිසුම් අත්සන් කරනු ලැබේ. බදු ගිවිසුම්වල සඳහන් විධිවිධාන අනුව පවරන ලද පරිශ්‍රයක් සඳහා කල්බදු කාලසීමාව වෙනුවෙන් හෝ ගිවිසුම අවසන් වන තෙක් වාර්ෂිකව බිම් කුලිය ගෙවීමට ආයෝජකයින් බැඳී සිටී.

- **වාර්ෂික ගාස්තු**

  ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ වන සියලු ආයෝජන මණ්ඩල ව්‍යවසායන් ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුලත් විය යුතු අතර ආයෝජන මණ්ඩලයට අයත් ආයෝජන කලාපයන්ගෙන් පිටත ක්‍රියාත්මක ව්‍යවසායන් ඒවා වසා දමන, මෙහෙයුම් අත්හිටුවන හෝ ගිවිසුම් අවලංගු කරන තෙක් ගිවිසුම ප්‍රකාරව වාර්ෂික දායක මුදලක් ගෙවීමට බැඳී සිටී.

- **ඉඩම් වාරිකය**

  ආයෝජන මණ්ඩලයේ ඉඩම් බදු ගැනීම සඳහා බදු ගිවිසුම් වලට ඇතුලත්ව ඇති සියලු ආයෝජකයින්, ගිවිසුම් අත්සන් කරන අවස්ථාවේදී ඉඩම් වාරිකය ලෙස අත්තිකාරම් ගෙවීමක් සිදු කිරීම අවශ්‍යය කෙරේ. ඉහත ආදායම ගිවිසුමේ දක්වා ඇති බදු කාලසීමාව තුළ හඳුනා ගැනේ.

(ආ) පොලී ආදායම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය මෙවලම් ඇතුළු පොලියක් සහිත සියලු මූල්‍ය මෙවලම් සඳහා වන පොලී ආදායම, ආදායම් ප්‍රකාශයේ "මූල්‍ය ආදායම" තුල හඳුනා ගනු ලැබේ.

(ආ) අනෙකුත් ආදායම් / විවිධ ආදායම්

(i) *<u>අනෙකුත් ආදායම්</u>*

අනෙකුත් ආදායම් සම්චිචිත පදනමක් මත හඳුනා ගැනේ.

(ii) *<u>දේපල, පිරියත සහ උපකරණ විකිණීම මගින් ලාභ/ (පාඩු)</u>*

දේපල, පිරියත හෝ උපකරණ භාවිතයෙන් ඉවත් කිරීම හෝ අපහරණය මත යම් ලාභ හෝ පාඩු විකිණීම සිදුවූ කාලසීමාව තුළ හඳුනා ගනු ලබන අතර විවිධ ආදායම් හා වියදම් යටතේ හඳුනාගනු ලැබේ.

3.12 වියදම්

වියදම් හඳුනා ගැනීම.

(අ) ආදායම් වියදම

සියලු වියදම් සලකා බලන ලද සාධාරණ අගයට මනිනු ලබන අතර එම වියදම් අදාල වන කාලසීමාව අනුව හඳුනා ගැනේ. සියලු දන්නා වගකීම් සඳහා හා දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදීමෙන් පසු මණ්ඩලය උපයාගනු ලබන අතිරික්තය ආදායම් ප්‍රකාශයේ දන්වනු ලැබේ.

(ආ) ප්‍රාග්ධන වියදම්

ආයතනය සඳහා හෝ ආයතනයේ සේවා/නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීමේ අරමුණින් ස්ථීර ආකාරයෙන් වත්කම් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරනු ලැබූ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

(ඇ) මූල්‍ය ආදායම සහ මූල්‍ය වියදම්

ශුද්ධ මූල්‍ය ආදායම, ආදායම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලබන ආයෝජනය/තැන්පත් කර ඇති අරමුදල් මත පොලිය, කාර්ය මණ්ඩල ණය සහ මූල්‍යමය බැඳීම් මත පොලියෙන් සමන්විතවේ.

ණය ගැනීම්/මූල්‍ය කල්බදු හා සම්බන්ධ සියලු පොලී සහ දරන ලද වෙනත් පිරිවැය, ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසු වන ප්‍රමාණයට හැර ශුද්ධ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස වියදම් දරන පරිදි වියදම් කෙරේ.

3.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන (LKAS 7) අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතාකර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

3.14 අදාල පාර්ශව ගනුදෙනු

අදාල තොරතුරු ඊට අදාල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල අනාවරණය කර ඇත.

3.15 බදුකරණය.

ආදායම් බදු මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන ආකාරයට පොලී ආදායමේ මූලිකාංග මත පදනම්ව ඇති අතර 2107 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා ඒ සඳහා වන සංශෝධනයන්ගේ විධිවිධානයන්ට අනුකූලව ගණනය කරනු ලැබේ.

3.16 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමණාකාරීත්වය විසින් දේපළ, පිරියත හා උපකරණ හා අදාල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 (LKAS 16) අනුකූලව ක්ෂයවීම සහ ගෙවීයාම සහ වත්කමෙහි ප්‍රයෝජනවත් ආයුකාලය සළකමින් වසර 10 සිට 20 දක්වා කාල සීමාවකදී ගොඩනැගිලි සහ ව්‍යුහ ක්ෂය කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා		2023 රු.	2022 රු.
4	**ආදායම**		
	බිම් කුලිය	2,978,282,884	1,628,251,344
	වාර්ෂික ගාස්තු	1,593,856,352	950,325,686
	ආනයන/අපනයන සේවා ගාස්තු	1,367,900,974	1,537,532,580
	ජල සැපයුම මගින් ලද ශුද්ධ ආදායම (සටහන 4.1)	1,006,971,158	585,207,683
	ඉඩම් වාරිකය	308,720,994	263,356,926
	කුලී ආදායම	166,388,011	148,095,314
	බලපත්‍ර ගාස්තු - 16 අංශ ව්‍යවසායන්	63,736,930	43,612,860
	පිවිසුම් අවසර පත්‍ර විකිණීම	334,593,127	306,679,471
	ගිවිසුම් සැකසුම් ගාස්තු	129,433,379	118,988,413
	නිවාස හා වෙනත් ව්‍යාපෘති වලින් ලද ආදායම	19,525,504	41,415,774
	විවිධ ආදායම්	202,014,149	349,760,665
		8,171,423,461	**5,973,226,716**
4.1	**ව්‍යවසායන් සඳහා ජලය සැපයීම මගින් ලද ශුද්ධ ආදායම**		
	ජල සැපයුම මගින් ආදායම	2,970,814,691	1,911,708,384
	ජල සැපයුම හා අදාල වියදම්	(1,963,843,533)	(1,326,500,701)
	ජල සැපයුම මගින් ලද ශුද්ධ ආදායම	**1,006,971,158**	**585,207,683**
5	**ආදායම් බදු වියදමට පෙර අතිරික්තය**		
	ආදායම් බදු වියදමට පෙර අතිරික්තය පහත සඳහන් වියදම් ඇතුළුව සියලු වියදම් අයකර ගැනීමෙන් /(බැර කිරීමෙන්) පසුව ප්‍රකාශ කරයි.		
	මෙහෙයුම් වියදම් (සටහන 6)	420,429,286	327,676,479
	පරිපාලන වියදම් (සටහන 7)	3,451,664,100	3,536,143,256
	රජයේ තීරු බදු (සටහන 8)	480,738,154	179,015,723
	වෙනත් වියදම් (සටහන 9)	32,930,685	31,799,404
6	**මෙහෙයුම් වියදම්**		
	ආයෝජන ප්‍රවර්ධන වියදම්	18,732,832	791,993
	කලාප නඩත්තු කිරීම	233,249,150	199,481,814
	විදුලිය සහ බලශක්තිය	77,592,060	44,673,249
	ආරක්ෂක සේවා	90,855,244	82,028,560
	කලාපයේ සේවකයන් සඳහා සුභසාධක වියදම්	-	700,862
		420,429,286	**327,676,479**

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා		2023 රු.	2022 රු.
7	**පරිපාලන වියදම්**		
	සේවක මණ්ඩල පිරිවැය (සටහන 7.1)	1,660,655,636	1,873,669,471
	කාර්ය මණ්ඩලයේ සුභසාධක වියදම්	429,702,715	346,472,764
	මුද්‍රණ කටයුතු හා ලිපි ද්‍රව්‍ය	45,250,527	43,032,085
	P/M පරිගණක හා කාර්යාල උපකරණ නඩත්තු කිරීම	77,589,866	67,769,992
	ගොඩනැගිලි නඩත්තු කිරීම	110,618,059	87,977,506
	ප්‍රවාහනය හා අදාල වියදම්	179,670,197	167,821,694
	කාර්යාල කුලී හා සත්‍යාපන ඒකක කුලිය	78,135,981	72,656,804
	ප්‍රවෘත්ති දැන්වීම්	6,030,720	4,769,949
	ජල පරිභෝජනය	13,169,324	6,886,277
	සන්නිවේදන වියදම්	39,244,870	34,887,320
	නගර සභාවේ වරිපනම් බදු	19,921,817	15,907,708
	කාර්ය මණ්ඩල පුහුණු	15,316,595	6,755,427
	නෛතික හා වෘත්තීය ගාස්තු	18,117,844	75,270,656
	නෛතික බැඳීම් සඳහා වන්දි ගෙවීම්	-	894,245
	ගමන් වියදම් හා යැපීම් දීමනා	4,127,525	3,944,317
	විගණන ගාස්තු	2,832,000	3,000,000
	ණයකරුවන් අපවය කිරීම	90,400,907	58,196,711
	ක්ෂයකිරීම්	660,879,516	666,230,331
		3,451,664,100	**3,536,143,256**
7.1	**සේවක මණ්ඩල පිරිවැය**		
	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා ගාස්තු	90,000	130,000
	සභාපති/අධ්‍යක්ෂ ජනරාල්	855,000	3,882,258
	වැටුප් හා වේතන - විධායක කාර්ය මණ්ඩලය	568,273,307	632,360,638
	වැටුප් හා වේතන - ලිපිකරු ඒහා සමාන කාර්ය මණ්ඩලය	105,487,569	116,276,046
	වැටුප් හා වේතන - ආරක්ෂක කාර්ය මණ්ඩලය	77,923,880	81,320,722
	වැටුප් හා වේතන - සුළු සේවක	132,754,802	144,112,204
	අතිකාල වියදම්	93,705,374	82,913,486
	ඉතිරි නිවාඩු සඳහා ගෙවීම් ප්‍රතිපාදන	72,048,797	81,800,635
	ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදන	52,633,287	68,039,960
	විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	(9,576,449)	47,222,351
	සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය	114,037,778	126,036,651
	සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය	22,807,557	25,207,332
	ප්‍රධාන කාර්යසාධන ගෙවීම් දීමනාව	407,248,977	445,363,083
	වෘත්තීය දීමනාව	17,104,450	17,100,105
	අනෙකුත් කාර්යමණ්ඩල වියදම්	5,261,307	1,904,000
		1,660,655,636	**1,873,669,471**

දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා		2023 රු.	2022 රු.
8	**රජයේ තීරු බදු**		
	මුද්දර ගාස්තු	489,276	392,900
	සමාජ ආරක්ෂණ දායකත්ව බදු	197,001,934	17,597,147
	එකතු කළ අගය මත බදු - ආපසු නොගෙවන VAT බදු යෙදවුම්	283,246,944	161,025,676
		480,738,154	**179,015,723**
9	**වෙනත් වියදම්**		
	හැඳුනුම්පත් නිකුත් කිරීමේ වියදම්	2,848,088	3,469,762
	විවිධ වියදම්	14,786,619	20,790,295
	දේපළ, පිරියත හා උපකරණ අපහරණය මත පාඩුව	4,395,962	-
	බහාලුම් යතුරු අඟුළු	2,679,900	3,110,930
	රක්ෂණ	2,772,202	2,880,229
	පරිසර පාලන වියදම්	793,564	313,358
	ආයතනික සමාජ වගකීම් වියදම්	3,000,000	-
	සංග්‍රහ වියදම්	1,654,350	1,234,830
		32,930,685	**31,799,404**
10	**ශුද්ධ මූල්‍ය ආදායම**		
	මූල්‍ය ආදායම		
	ඇමතුම් තැන්පතු මත පොලී ආදායම/වෙනත්	2,661,150,973	1,369,905,342
	කාර්ය මණ්ඩල ණය මත පොලී ආදායම	32,412,234	32,117,515
	මූල්‍ය ආදායමේ එකතුව	2,693,563,207	1,402,022,856
	මූල්‍ය වියදම්		
	කල්බදු වගකීම් මත පොලී වගකීම්	3,283,061	6,069,768
	බැංකු ගාස්තු	1,279,448	831,195
	මූල්‍ය වියදම් එකතුව	4,562,509	6,900,963
	ශුද්ධ මූල්‍ය ආදායම	**2,689,000,698**	**1,395,121,893**
11	දේපළ, පිරියත සහ උපකරණ/ කල් බදු ගත් දේපළ භාවිතා කිරීමේ අයිතිය		
	අයත් දේපළ, පිරියත සහ උපකරණ (සටහන 11.1)	16,288,025,757	16,531,843,296
	කල් බදු ගත් දේපළ භාවිතා කිරීමේ අයිතිය (සටහන 11.2)	22,677,164	58,990,148
	දේපළ, පිරියත සහ උපකරණවල පොත් වලට ගනු ලැබූ අගය	16,310,702,921	16,590,833,444

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් 31 දිනට

11.1 දේපල, පිරියත හා උපකරණ

සින්නක්කර වත්කම් පිරිවැය	ඉඩම්	ගොඩනැගිලි	වියුහ	පිරියත හා යන්ත්‍ර	වෑද්දුම් හා සවිකිරීම්	ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	පරිගණක	මෝටර් රථ	එකතුව 31.12.2023	එකතුව 31.12.2022
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ජනවාරි 01 දිනට ශේෂය	11,333,047,295	1,958,034,127	8,290,640,711	120,982,513	1,249,820	223,318,136	296,862,081	460,068,553	22,684,203,236	21,719,304,872
වසර තුල එකතු කිරීම්	-	5,805,011	8,485,992	1,856,778	172,830	14,107,343	47,201,024	2,034,160	79,663,138	35,866,506
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් මගින් මාරුකිරීම්	-	9,344,717	257,839,084	378,000		10,410,260	-	-	277,972,061	810,638,274
කල්බදු ගත් දේපළ එකී කාලසීමාව තුළ භාවිතා කිරීමේ අයිතිය මගින් මාරුකරන ලද								51,720,000	51,720,000	212,256,071
වසර තුල අපහරණයන්	-	2,193,000	-	-	-	2,013,080	2,442,604	-	6,648,684	21,870,639
ආයෝජන දේපළ වලට මාරුකරන ලද	-	2,753,268	-	-	-	-	-	-	2,753,268	71,991,849
ආයෝජන දේපළ වලින් මාරුකරන ලද		977,000							977,000	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	11,333,047,295	1,969,214,587	8,556,965,787	123,217,291	1,422,650	245,822,659	341,620,501	513,822,713	23,085,133,482	22,684,203,233
ක්ෂය කිරීම										
ජනවාරි 01 දිනට ශේෂය	-	1,241,244,878	4,012,863,552	56,526,399	724,050	144,822,581	261,058,134	435,120,344	6,152,359,938	5,384,046,849
අපහරණය කරන ලද වායු සම්කරණ යන්ත්‍ර 2020 දී වැරදි ලෙස ක්ෂය කිරීම	-								-	-
වසර සඳහා ගාස්තු	-	97,884,432	440,914,959	9,670,915	89,563	14,403,339	25,892,284	11,767,744	600,623,236	588,955,446
කල්බදු ගත් දේපළ එකී කාලසීමාව තුළ භාවිතා කිරීමේ අයිතිය මගින් මාරුකරන ලද								51,183,016	51,183,016	212,256,071
අපහරණයන් මත	-	1,644,750				1,852,932	2,442,604		5,940,286	21,286,191
ක්ෂය කිරීම් ආයෝජන දේපළ වෙත මාරු කිරීම	-	1,850,930	-	-	-	-	-	-	1,850,930	11,612,237
ආයෝජන දේපළ මගින් මාරුකරන ලද ක්ෂය කිරීම්		732,750							732,750	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	1,336,366,380	4,453,778,511	66,197,314	813,613	157,372,988	284,507,815	498,071,104	6,797,107,724	6,152,359,938
වත්කම්වල ලියා තබන ලද අගය										
දෙසැම්බර් 31 දිනට	11,333,047,295	632,848,207	4,103,187,276	57,019,977	609,037	88,449,671	57,112,687	15,751,609	16,288,025,757	16,531,843,296

තවමත් භාවිතායේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් වලට ඇතුළත් දේපළ පිරියත සහ උපකරණ වල වාර්තා කරන ලද දිනට පිරිවැය රු. 781,164,937.00 (සටහන් අංක 11.3)

11.2 කල්බදු වත්කම් භාවිතා කිරීමේ අයිතිය - මෝටර් වාහන	**2023**	**2022**
	රු.	රු.
ජනවාරි 1 දිනට ශේෂය - පිරිවැය	178,880,000	391,136,071
දේපළ, පිරියත සහ උපකරණ වලට මාරුකරන ලද	(51,720,000)	(212,256,071)
දෙසැම්බර් 31 දිනට ශේෂය	127,160,000	178,880,000
ක්ෂය කිරීම		
ජනවාරි 01 දිනට ශේෂය	119,889,852	278,436,923
වසර සඳහා ගාස්තු	35,776,000	53,709,000
දේපළ, පිරියත සහ උපකරණ වලට මාරුකරන ලද	(51,183,016)	(212,256,071)
දෙසැම්බර් 31 දිනට ශේෂය	104,482,836	119,889,852
කල් බදු ගත් දේපළ එකී කාලසීමාව තුළ භාවිතා කිරීමේ අයිතිය පොත් වලට ගනු ලැබූ අගය දෙසැම්බර් 31 දිනට	22,677,164	58,990,148

කල් බදු ගත් වාහන ප්‍රධාන වශයෙන් පරිපාලන කාර්යයන් හා අදාල වේ. මෙම වත්කම් වලට අදාල වගකීම් "ජංගම නොවන මූල්‍ය වගකීම්" හි සටහන 22 යටතේ දක්වා ඇත.

11.3 දේපළ, පිරියත හා උපකරණ (ඉතිරි කොටස)

දැනට භාවිතයට ගැනෙන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත හා උපකරණවල දෙසැම්බර් 31 දිනට ආරම්භක පිරිවැය පහත පරිදිවේ:

දෙසැම්බර් 31 දිනට	අයිතම සංඛ්‍යාව	2023 රු.	2022 රු.
පිරියත හා යන්ත්‍ර	180	28,266,464	25,139,879
වෑද්දුම් හා සවිකිරීම්	94	418,599	366,099
ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ	11,719	95,540,777	85,221,403
පරිගණක	4,799	248,780,946	253,567,818
මෝටර් රථ	126	408,158,151	401,465,278
සම්පූර්ණයෙන් ක්ෂයකරන ලද දේපළ, පිරියත හා උපකරණ එකතුව	16,918	**781,164,937**	**765,760,477**

12 ආයෝජන දේපළ

ජනවාරි 01 දිනට ශේෂය	39,736,425,003	39,066,087,887
දේපළ, පිරියත හා උපකරණ මගින් මාරුකරන ලද - ඉඩම සහ ගොඩනැගිල්ල	2,753,268	60,379,611
වසර තුල එක්කිරීම්	6,387,645	598,831,267
දේපළ, පිරියත හා උපකරණ මගින් මාරුකරන ලද - ඉඩම	977,000	-
ඉඩමේ වටිනාකමට ගැලපීම	(2,000,000)	-
වසර තුල අපහරණය කිරීම්	20,583,000	486,000
අඩුකළා - දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය	236,627,336	214,918,887
දෙසැම්බර් 31 දිනට ශේෂය	**39,485,378,579**	**39,509,893,878**

13 සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

සාමාන්‍ය ව්‍යාපෘති		
ජනවාරි 01 දිනට ශේෂය	414,951,849	892,466,954
වසර තුල එක්කිරීම්	678,179,341	436,701,068
වසර තුළ ප්‍රාග්ධනීකරණය කරනලද	(299,197,506)	(925,460,023)
ආපසු ගෙවීම් හා ගැලපීම්	(22,441,339)	11,243,850
දෙසැම්බර් 31 දිනට ශේෂය	**771,492,346**	**414,951,850**
විශේෂ ව්‍යාපෘති		
ජනවාරි 01 දිනට ශේෂය	228,956,908	251,628,207
වසර තුල එක්කිරීම්	127,422	7,288,509
සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් යටතේ සාමාන්‍ය ව්‍යාපෘති වලට මාරුකරන ලද	-	(29,959,807)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**229,084,330**	**228,956,909**
මෘදුකාංග වත්කම් - IT හැකියාවන් ලබාදීමේ ව්‍යාපෘතිය	20,040,883	20,040,883
සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් එකතුව	**1,020,617,559**	**663,949,641**

ආරම්භයේදී හෝ ශේෂපත්‍රයේ දිනයට ඇස්තමේන්තුගත හෝ වර්ගීකරණය කළ නොහැකි විශේෂ ව්‍යාපෘතිවල මූලික සහ සංවර්ධන වියදම් සඳහා අත්තිකාරම් ගෙවීම්, එම ව්‍යාපෘති සම්පූර්ණ කරන තෙක් සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් (CWIP) යටතේ දක්වා ඇත. සිදුකරමින් පවතින මෘදුකාංග විසඳුම් CWIP යටතේ දැක්වේ.

දෙසැම්බර් 31 දිනට		2023	2022 (නැවත ප්‍රකාශිත)
		රු.	රු.
14	**ජංගම නොවන මූල්‍ය වත්කම්**		
	කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් (සටහන 14.1) 1	541,723,558	647,631,930
	ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් (සටහන 14.2)		
	රජයේ සුරකුම්පත්වල ආයෝජනය-භාණ්ඩාගාර බැඳුම්කර [2]	755,148,210	737,173,906
	ජංගම නොවන මූල්‍ය වත්කම් එකතුව (සටහන 14.3)	**1,296,871,768**	**1,384,805,836**

1. අනෙකුත් ජංගම නොවන මූල්‍යය වත්කම්වල එක් වසරකට අඩු කොටසක් වන රු. 226,220,840.52 ක් අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් යටතේ ඇතුළත් කර ඇත.

2. මණ්ඩලය විසින් කාලයකට 9% ක කුපන් පොලී අනුපාතිකයක් යටතේ රු. 730,646,046 ක මුදලක් වසර 3 ක සහ මාස 3ක කල් පිරීමේ කාලයක් සඳහාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කර ඇත. මෙය කල් පිරීමේ දිනය 2025.05.01.

		2023	2022
		රු.	රු.
14.1	**කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්**		
	කාර්යමණ්ඩල ණය සහ අත්තිකාරම් - කල්පිරීමේ කොටස වසර එකකට වැඩි (සටහන 14.3)	541,723,558	647,631,930
	කාර්යමණ්ඩල ණය සහ අත්තිකාරම් - කල්පිරීමේ කොටස වසර එකකට අඩු (සටහන 15)	226,220,841	234,728,053
	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	**767,944,399**	**882,359,983**

		(නැවත ප්‍රකාශිත) 2022
		රු.
14.2	**ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්**	
	නැවත ප්‍රකාශ කිරීමට පෙර 2022.12.31 දිනට රජයේ සුරකුම් පත් වල ආයෝජනය කිරීම්	730,646,046
	නව ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගත කර ගැනීමේ බලපෑම (ක්‍රමක්ෂය කරණ ලද පිරිවැයට මනින ලද)	6,527,860
	රජයේ සුරකුම් පත් වල ආයෝජනය කිරීම් 2022.12.31 දිනට ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට - නැවත ප්‍රකාශිත	**737,173,906**

14.3 ජංගම නොවන මූල්‍ය වත්කම්

කල්පිරීමේ දිනයට ක්‍රමක්ෂය කරන ලද පිරිවැය වෙන්කිරීම අනුව මනින ලද මූල්‍ය වත්කම් (ණය හා ලැබිය යුතුදෑ) පහත පරිදිවේ.

		කල් පිරීම	
	31.12.2023	වසර 1 හා	වසර 05 කට
	රු.	05 අතර	පසු
කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්	541,723,558	418,223,351	123,500,207
ජංගම නොවන මූල්‍ය වත්කම් එකතුව	**541,723,558**	**418,223,351**	**123,500,207**

		කල් පිරීම	
	31.12.2022	වසර 1 හා	වසර 05 කට
	රු.	05 අතර	පසු
කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්	647,631,930	501,301,622	146,330,307
ජංගම නොවන මූල්‍ය වත්කම් එකතුව	**647,631,930**	**501,301,622**	**146,330,307**

දෙසැම්බර් 31 දිනට	**2023**	**2022**
	රු.	**රු.**
15 ජංගම මූල්‍ය වත්කම්		
කල් පිරීමේ කාලය වසරකට අඩු කාලයක් සඳහා ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කරන ලද		
කාර්ය මණ්ඩල ණය	213,439,803	220,946,242
කාර්ය මණ්ඩල අත්තිකාරම්	12,781,038	13,781,812
දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් වල එකතුව	226,220,841	234,728,053
අඩුකළා - කාර්යමණ්ඩල ණය මත හානිකරණය සඳහා ප්‍රතිපාදන (සටහන 15.1)	(3,441,657)	(2,660,506)
	222,779,183	**232,067,548**
සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්		
රජයේ සුරකුම්පත්වල ආයෝජනය - භාණ්ඩාගාර බිල්පත්	5,021,778,023	6,410,768,039
ස්ථාවර තැන්පතු - සුරක්ෂිත භාරකාර තැන්පතු	20,000	20,000
ජංගම මූල්‍ය වත්කම් එකතුව	**5,244,577,206**	**6,642,855,587**

15.1 ලැබියයුතු දෑ මත හානිකරණය සඳහා ප්‍රතිපාදන - කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්

ජනවාරි 1 දිනට ශේෂය	2,660,506	2,944,099
වසර තුළ ලබාදෙන ලද ප්‍රතිපාදන	781,151	(283,593)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,441,657**	**2,660,506**

දෙසැම්බර් 31 දිනට		2023 රු.
16	**ව්‍යවසායයන්ගෙන් ලැබීය යුතු දෑ**	
	ව්‍යවසායයන්ගෙන් ලැබිය යුතු දෑ	1,480,032,535
	අඩුකළා-ලැබිය යුතුදෑ මත හානිකරණය සඳහා ප්‍රතිපාදන (සටහන 16.1)	(429,223,953)
		1,050,808,582
16.1	**ලැබිය යුතු දෑ මත හානිකරණය සඳහා ප්‍රතිපාදන**	
	ජනවාරි 01 දිනට ශේෂය	359,321,925
	වසර තුල ලබා දෙන ලද ප්‍රතිපාදන	69,902,028
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**429,223,953**
17	**අත්තිකාරම් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ**	
	අත්තිකාරම් ගෙවීම්	702,608
	විදේශ සංචාර සඳහා අත්තිකාරම් ගෙවීම්	569,999
	විදේශ රටවල ශ්‍රී ලංකා දූත කණ්ඩායම්	554,964
	සංචලීකරණ අත්තිකාරම්	239,365,623
	පෙර ගෙවූ වියදම්	26,072,822
	පොලී ආදායම - ලැබිය යුතු දෑ	298,205,036
	ලැබියයුතු තැන්පතු	14,070,966
	කටයුතු කළ යුතුව ඇති නෛතික ක්‍රියාවන්ට එදිරිව තැන්පතු	106,119,518
	වෙනත් ලැබිය යුතු දෑ	40,563,952
	අඩුකළා - ලැබිය යුතු දෑ මත හානිකරණය සඳහා ප්‍රතිපාදන (17.1)	(61,397,957)
		664,827,531
17.1	**අනෙකුත් ලැබිය යුතු දෑ මත හානිකරණය සඳහා ප්‍රතිපාදන**	
	ජනවාරි 01 දිනට ශේෂය	83,775,009
	වසර තුල ලබා දෙන ලද ප්‍රතිපාදන	(22,377,052)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**61,397,958**

දෙසැම්බර් 31 දිනට		2023	2022
		රු.	රු.
18	**වාසිදායක මුදල් හා මුදලට සමාන දෑ**		
	ලංකා බැංකුව - පුද්ගල ශාඛාව	1,152,240,658	265,848,217
	ලංකා බැංකුව - පුද්ගල ශාඛාව	3,058,504	2,109,419
	ලංකා බැංකුව - කටුනායක	35,469,234	28,688,529
	ලංකා බැංකුව - බියගම	225,835,646	119,783,174
	ලංකා බැංකුව - කොග්ගල	6,917,224	3,683,897
	ලංකා බැංකුව - දිගන	21,157,605	16,793,989
	ලංකා බැංකුව - අවිස්සාවේල්ල	40,134,742	51,472,691
	ලංකා බැංකුව - ඉංගිරිය	17,840,071	49,315,151
	ලංකා බැංකුව - මීරිගම	155,624	148,694
	ලංකා බැංකුව - නිට්ටඹුව	28,331,633	15,843,419
	ලංකා බැංකුව - කුරුණෑගල	8,575,318	27,250,694
	රන් පවුම්	44,800	44,800
	ප්‍රාංකන යන්ත්‍රයේ ශේෂය	55,841	650,264
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව - කාර්ය මණ්ඩල ඇප තැන්පතු	216,925	201,511
	මිලදී ගැනීමේ ගිවිසුම්	7,220,818,571	1,587,553,188
	මුදල් හා මුදලට සමාන දෑ වල එකතුව	**8,760,852,396**	**2,169,387,636**

19 විලම්භිත වියදම්

අභ්‍යන්තර අලංකරණය, කාපට් ඇතිරීම හා පරිශ්‍රයේ කාමර වෙන්කිරීම සඳහා දරන ලද වියදම් වසර 10ක ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය මත සෘජුරේඛා පදනමින් ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. කලාප සංවර්ධනය කිරීමේ පිරිවැය ක්‍රමක්ෂය වසර 20 ක් සඳහා හඳුනාගනු ලැබේ.

	2023	2022
	රු.	රු.
ජනවාරි 01 දිනට ශේෂය	485,280,787	428,295,356
වසර තුල විලම්භනය කරන ලද වියදම්	23,104,445	116,528,346
අඩුකළා - ප්‍රවර්තන වසරේ වියදම්	(58,076,477)	(59,542,915)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**450,308,755**	**485,280,787**

දෙසැම්බර් 31 දිනට		2023	2022
		රු.	රු.
20 විලම්භිත ආදායම			
ඉඩම් වාරිකය	**20.1**	16,875,110,312	16,234,430,556
ප්‍රදානය	**20.2**	6,391,045	9,450,108
කුලියට ගත් ගොඩනැගිලි සඳහා අත්තිකාරම් ගෙවීම්	**20.3**	36,064,722	37,421,389
		16,917,566,079	**16,281,302,053**

20.1 විලම්භිත ආදායම - ඉඩම් වාරිකය

ජනවාරි 01 දිනට ශේෂය	16,234,430,556	15,771,364,881
වසර තුල ලැබීම්	919,195,452	944,165,309
වෙන් කිරීමේ ගිණුමෙන් මාරුකිරීම	33,200,403	17,896,016
ආදායම් ප්‍රකාශ මගින් හඳුනාගත් ආදායම	(292,570,573)	(261,612,689)
ගාස්තු - අවලංගුවූ ව්‍යාපෘති	(16,150,421)	(178,432,237)
පෙර වසරේ අවලංගු කිරීම් - සමුච්චිත අරමුදල සංශෝධනය කිරීම	(2,995,105)	-
ඉඩම් වාරිකය ආපසු ගෙවීම	-	(29,677,790)
අයකර ගත යුතු	-	(29,272,935)
දෙසැම්බර් 31 දිනට ශේෂය (සටහන 20.1.1)	**16,875,110,312**	**16,234,430,556**

20.1.1 විලම්භිත ආදායම

		කල්පිරීම		
	31.12.2023	වසර 01	වසර 01 හා 05	වසර 05 කට
	රු.	තුල	අතර	පසු
ඉඩම් වාරිකය	16,875,110,313	292,717,077	1,463,585,385	15,118,807,851
	16,875,110,313	**292,717,077**	**1,463,585,385**	**15,118,807,851**

		කල්පිරීම		
	31.12.2022	වසර 01	වසර 01 හා 05	වසර 05 කට
	රු.	තුල	අතර	පසු
ඉඩම් වාරිකය	16,234,430,557	263,356,926	1,316,784,628	14,654,289,003
	16,234,430,557	**263,356,926**	**1,316,784,628**	**14,654,289,003**

ගිවිසුම් කාලසීමාව පුරා කාලසීමාව සඳහා හඳුනාගනු ලබන, ව්‍යවසායයන් මගින් ලැබූ ඉඩම් වාරික ආදායම මූලිකව විලම්භිත ආදායම් වගකීම් හා අදාලවේ. ගිවිසුමේ ඇති ආදායම හඳුනා ගැනීම එක් එක් ගිවිසුම සඳහා වෙන් වශයෙන් අදාල කරන අතර එම අගය කාලසීමාව සඳහා ආදායම ලෙස හඳුනා ගැනේ.

දෙසැම්බර් 31 දිනට	2023	2022
20.2 විලම්භිත ආදායම-ප්‍රදානය	රු.	රු.
ජනවාරි 01 දිනට ශේෂය	9,450,108	11,594,181
වසර තුළ එක්කිරීම්		
ව්‍යවසාය ප්‍රදානය	-	895,511
ආදායම් ප්‍රකාශ හරහා හඳුනාගත් ආදායම	(3,059,064)	(3,039,584)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,391,045**	**9,450,108**

ජපාන රජය මගින් ලද ප්‍රදානය, ජංගම නොවන වත්කම් ලෙස එහි සාධාරණ අගයට හඳුනාගනු ලැබේ. මෙම වත්කම් මත ක්ෂය කිරීමේ වියදම් සමග ගැලපීම සඳහා ප්‍රදානය කාලසීමාව සඳහා ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

20.3 කුලියට ගත් ගොඩනැගිලි සඳහා අත්තිකාරම් ගෙවීම්

ආයෝජන මණ්ඩලය විසින් කර්මාන්ත ශාලා ගොඩනැගිලි දීර්ඝ කාලීන පදනම මත කුලියට ගෙන ඇති අතර අත්තිකාරම් ලෙස එකතුකළ ගොඩනැගිලි වටිනාකම විලම්භිත ආදායම යටතේ දක්වා ඇත. ගිවිසුමෙහි ආදායම හඳුනා ගැනීම එක් එක් ගිවිසුම සඳහා වෙන් වෙන්ව අදාල වන අතර එම ප්‍රමාණය කුලී කාලසීමාව සඳහා කුලී ආදායම ලෙස හඳුනා ගැනේ.

21 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	2023 රු.	2022 රු.
සැලසුම් වත්කම් වල සාධාරණ වටිනාකමේ එකතුව (සටහන 21.2)	457,935,021	457,935,021
නිර්වචිත ප්‍රතිලාභ වගකීම් වල වත්මන් වටිනාකමේ එකතුව (සටහන 21.1)	409,970,385	306,570,548
නිර්වචිත ප්‍රතිලාභ වගකීම් මත අතිරේක (බැඳීම්)/ වත්කම්	47,964,636	151,364,473
21.1 නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් වල වත්මන් වටිනාකමේ සංචලනය		
ජනවාරි 01 දිනට නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය	306,570,548	278,808,543
පොලී වියදම	45,985,582	32,341,791
වත්මන් සේවා වියදම	13,128,222	13,800,878
අතීත සේවා වියදම	-	54,640,409
බැඳීම් මත ආයුගණක (ලාභ)/පාඩු	102,447,555	(3,609,915)
අඩුකළා - වසර තුළ ගෙවන ලද/ගෙවිය යුතු ගෙවීම්	(58,161,522)	(69,411,158)
නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන වටිනාකමේ එකතුව	409,970,385	306,570,548
21.2 සැලසුම් වත්කම්වල වර්තමාන අගයේ සංචලනය		
සැලසුම් වත්කම්වල සාධාරණ අගය	457,935,021	457,935,021
කාලසීමාව සඳහා සැලසුම් වත්කම් මත අපේක්ෂිත ලැබීම්	68,690,253	53,120,462
සැලසුම් වත්කම් මගින් ගෙවනලද/ගෙවිය යුතු ප්‍රතිලාභ	(43,700,699)	(43,700,699)
සැලසුම් වත්කම් මත ආයුගණක පාඩු	(24,989,554)	(9,419,763)
සැලසුම් වත්කම්වල සාධාරණ අගය	457,935,021	457,935,021
සැලසුම් වත්කම් පහත සඳහන් පරිදි සමන්විතවේ		
භාණ්ඩාගාර බැඳුම්කර	457,935,021	457,935,021
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් වත්කම්වල එකතුව	457,935,021	457,935,021
21.3 ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබූ වියදම්		
පොලී පිරිවැය	45,985,582	32,341,791
සැලසුම් වත්කම් මත අපේක්ෂිත ලාභ ලැබීම්	(68,690,253)	(53,120,462)
වත්මන් සේවා පිරිවැය	13,128,222	13,800,878
අතීත සේවා වියදම	-	54,640,409
අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබූ ආයුගණක පාඩු	(127,437,109)	(5,809,848)
ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අගයේ එකතුව	117,860,660	53,472,464

වෘත්තීය ආයුගණක ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් පිළිබඳ ස්වාධීන ආයුගණක තක්සේරුවක් කරනු ලැබීය. ආයුගණක විසින් විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම සඳහා "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය" යන තක්සේරු කිරීමේ ක්‍රමය යොදා ගනු ලැබීය. මණ්ඩලය විසින් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම ඇතුලත් වෙනම සැලසුම් වත්කම් පවත්වාගෙන යනු ලැබේ. සැලසුම් වත්කම් සඳහා මණ්ඩලයේ දායකත්වය ආයුගණක තක්සේරුව මත පදනම්වේ.

ආයුගණක විසින් යොදා ගනු ලැබූ මූලික උපකල්පනයන්ට පහත කරුණු ඇතුලත් වේ.

	2023	2022
(i) පිරිවැටුම් අනුපාතය	12%	15%
(ii) වැටුප් වර්ධක අනුපාතය	වසරකට 3	වසරකට 1.5
(iii) අනාගත මරණ අනුපාතය පිළිබඳ උපකල්පන	A1967/70	A1967/70
(iv) විශ්‍රාමයාමේ වයස	අවුරුදු 60	අවුරුදු 60

(v) වැටුප් වැඩිවීමේ අනුපාතය : 2024 සහ 2025 දී 3% සහ ඉන් පසුව වසරකට 7%.

		2023 රු.	2022 රු.
22	**ජංගම නොවන මූල්‍යමය වගකීම් - කල්බදු වගකීම්**		
	ජනවාරි 01 දිනට ශේෂය	38,654,241	69,180,322
	කල්බදු වගකීම් සඳහා ගැලපුම් කිරීම	32,782	-
	වසර තුල ආපසු ගෙවීම්/පොලී වියදම් ඇතුලුව	(24,420,709)	(30,526,081)
	දෙසැම්බර් 31 දිනට වට්ටම් නොකළ කල්බදු වගකීම් එකතුව	14,266,314	38,654,241
	මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඇතුලත්කර ඇති වට්ටම් කළ ගිවිසුම්ගත කල්බදු වගකීම්		
	ජංගම මූල්‍යමය කල්බදු වගකීම් (එක් වසරකට වඩා අඩු)	13,002,568	21,137,648
	ජංගම නොවන මූල්‍යමය කල්බදු වගකීම් (එක් වසරකට වඩා වැඩි)	372,679	13,375,247
	ගෙවිය යුතු මූල්‍යමය වගකීම් එකතුව - කල්බදු	**13,375,247**	**34,512,895**
	ආදායම් ප්‍රකාශයන්හි හඳුනාගනු ලැබූ ප්‍රමාණය - කල්බදු වගකීම් මත පොලිය		
	කල්බදු වගකීම් මත පොලිය	3,283,061	6,069,768
	කල්බදු වගකීම් මත පොලී එකතුව	3,283,061	6,069,768
23			
	සම්චිත වියදම් සහ වෙනත් ගෙවිය යුතු දෑ		
	විවිධ ණයකරුවන්	141,922,258	77,832,007
	සමුච්චිත වියදම්	310,683,228	302,599,728
	භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ	1,000,000,000	500,000,000
	ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික	536,792	53,446,952
	පොදු රාජ්‍ය මණ්ඩලීය සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා ලද අරමුදල්	917,160	917,160
	ඩයලොග් - සහනාධාර	642,849	47,849
	අත්තිකාරම් ලැබීම්	190,730,001	384,856,075
	ආපසු ගෙවනු ලබන තැන්පතු	150,927,762	135,771,104
	ඉඩම් වෙන්කිරීමේ ගාස්තු	73,153,404	56,605,771
	ගෙවියයුතු තැන්පතු	135,708,204	135,708,204
	මෙහෙයුම් හා වෙනත් ගෙවියයුතු දෑ වල එකතුව	**2,005,221,657**	**1,647,784,849**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා

	2023 රු. (මිලි)	2022 රු. (මිලි)
24 මෙහෙයුම් මගින් උත්පාදනයවූ මුදල්		
ආදායම් බදු වලින් පසු අතිරික්තය	5,539.16	2,915.85
ක්ෂයකිරීම්	660.81	666.17
ස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය	0.07	0.07
ආදායම් බදු වියදම්	808.07	372.06
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන	59.11	100.78
වගකීම් මත ආයුගණක (ලැබීම්)/පාඩු	102.45	(3.61)
ණයකරුවන්ගේ හානිපූරණය සඳහා ප්‍රතිපාදන	48.31	(123.49)
විලම්භිත ආදායම - ඉඩම් වාරිකය	(292.72)	(261.61)
විලම්භිත ආදායම - ප්‍රදාන	(3.06)	(3.04)
විලම්භිත ආදායම - ගොඩනැගිලි වාරිකය	(1.36)	(1.36)
සමකොටස්වල හඳුනාගනු ලැබූ ආදායම	-	23.68
ස්ථාවර වත්කම් විකිණීම මත (ලාභය)/පාඩුව	(4.11)	(1.61)
ආයෝජන ආදායම	(2,684.06)	(1,402.02)
බදුකුලිය මත පොලිය	3.28	6.07
අවලංගු වූ ව්‍යාපෘති	(19.00)	-
භාණ්ඩාගාරයට අරමුදල් මාරුකිරීම සඳහා ප්‍රතිපාදන	(1,000.00)	-
ආදායම ගැලපීම	2.61	-
වැඩියෙන් තක්සේරු කිරීම නිවැරදි කිරීම	(2.00)	-
විලම්භිත ආදායම ක්‍රමක්ෂය	58.08	59.54
පොලී ආදායම ක්‍රමක්ෂය	(87.34)	-
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය	**3,188.30**	**2,347.49**
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම		
තොග	(8.18)	(3.12)
ව්‍යවසායන් මගින් ලැබිය යුතු දෑ	(606.16)	(187.52)
අත්තිකාරම් ගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ	37.71	128.99
මූල්‍ය වත්කම් (කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්)	114.42	(105.56)
සමුච්චිත වියදම් සහ අනෙකුත් ගෙවියයුතු දෑ	340.89	273.97
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පසු මෙහෙයුම් අතිරික්තය	**3,066.97**	**2,454.26**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

25. අදාල පාර්ශව අනාවරණයන්

අධ්‍යක්ෂ මණ්ඩලය

1. දිනේෂ් වීරක්කොඩි මහතා, සභාපති - ඔහු 2023 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ව්‍යාපාරික ගනු දෙනු වලට ඇතුළත්ව ඇති ලංකා ඇළුමිනියම් ඉන්ඩස්ට්‍රීස් පීඑල්සී හි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ගනු දෙනු අනාවරණය කර තිබේ.

2. මානිල් ජයසිංහ මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - ඔහු 2023 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ව්‍යාපාරික ගනු දෙනු වලට ඇතුළත්ව ඇති ලංකා හෝස්පිටල් කෝපරේෂන් පීඑල්සී හි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ගනු දෙනු අනාවරණය කර තිබේ.

3. ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2023 වසරේදී ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපාරික ගනු දෙනු සිදුකර නොමැත.

4. එරාජ් ඩි සිල්වා මහතා, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2023 වසරේදී ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපාරික ගනු දෙනු සිදුකර නොමැත.

5. චාන්දනී විජයවර්ධන මහත්මිය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - 2023 වසරේදී ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපාරික ගනු දෙනු සිදුකර නොමැත.

26. අසම්භාව්‍ය වගකීම්

26.1. දැනට නෛතික කටයුතු සිදුකරමින් පවතින නඩු ලයිස්තුව (ඇමුණුම I) අමුණා ඇති අතර එකී නඩු වල සත්‍ය වගකීම නිවරදි ලෙස තහවුරු කිරීම හෝ විශ්වාසනීයත්වය මැනීම සිදුකළ නොහැකිවේ. එබැවින් අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගෙන නොමැති නමුත් එමගින් අනාවරණය කර ඇත.

26.2 මිලියන් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට එදිරිව ගොනු කරන ලද නඩුව සම්බන්ධයෙන් 2015.01.01 දින උසාවිය මගින් රු. 102,135,350.00 ක මුදලක් රඳවාගෙන ඇත. ආයෝජන මණ්ඩලය විසින් මෙම රඳවාගනු ලැබූ තැන්පතුව සඳහා හානිපූරණය තක්සේරු කර ඇති අතර අදාල විනිශ්චය පදනම් කර ගනිමින් හානිපූරණය සිදුකර ඇත.

27. 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනත

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායකවරයා විසින් 2024 අංක 45 දරන ආර්ථික පරිවර්තන පනත සහතික කරනු ලැබිය. එකී පනතේ 193 වන වගන්තිය මගින් 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය අවලංගු වනු ඇත. ඉහත සඳහන් කරන ලද පරිදි කථානායකවරයා විසින් සහතික කරන ලද දින සිට මාස තුනක කාලයක් ඇතුළත දිනකදී ගැසට් නිවේදනක් මගින් පළ කරනු ලැබූ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද දිනක දී 193 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතුය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2023 දෙසැම්බර් 31 දිනට කටයුතු කළ යුතුව තිබූ නඩු

අනු අංක	නඩු අංකය	උසාවිය	පාර්ශවයන්	නඩුවේ විස්තරය	හිමිකම් විස්තරය	හිමිකම් ප්‍රමාණය (රු)
1	S.C. Appeal 104/2020 - S.C. (H.C) L.A. 24/18	ශ්‍රේෂ්ඨාධිකරණය	හයිකාවා ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා තවත් 06 දෙනෙකුට එදිරිව ආයෝජන මණ්ඩලය	පෝපැක් ශ්‍රිනර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව හයිකාවා ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට් ලිමිටඩ්) අවසන් කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කරන ලදි. එකී හයිකාවා ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට් ලිමිටඩ්) අවසන් කිරීම සඳහා 2013/04/05 දින අවසන් කිරීමේ නියෝගයක් නිකුත් කරන ලද අතර උසාවිය විසින් ඇවරකරු පත්කරනු ලැබීය. මහාධිකරණ විනිසුරු විසින් ඔහුගේ 2018.02.14 දිනැති නියෝගය මගින් ඇවරකරු විසින් ඉන්දීය රාජ්‍ය බැංකුවට හා ඉන්දියන් ඕවර්සීස් බැංකුවට ගෙවිය යුතු මුදල් ගෙවීමට පෙර ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු ගෙවීම්, සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට හා වෙනත් ව්‍යාස්ථාපිත ගෙවීම් සිදුකිරීමට ප්‍රමුඛතාවය ලබාදීම අවශ්‍ය නොවන බව තීරණය කර ඇත. වාණිජ මහාධිකරණය විසින් ලබාදුන් ඉහත නියෝගයට එරෙහිව ආයෝජන මණ්ඩලය විසින් මෙම අයදුම්පත ගොනුකර ඇත.	ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු මුදල ගෙවීම.	9,071,282.83
2	S.C. (SPL) LA 118/2018	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 03 දෙනෙකුට එදිරිව ලොජිවිස් ලිමිටඩ්	රජය හා පෙත්සම්කරු යන දෙපාර්ශවයම විසින් අයිතිය ඉල්ලා සිටින ඉඩම් කොටසක් සම්බන්ධයෙන් රජයේ ඉඩම් (සන්තකය නැවත ලබාගැනීම) පනත යටතේ ඩීඑස්/කටාන විසින් ලොගිවිස් වෙත නිකුත් කළ ඉවත්වීමේ දන්වීමට එරෙහිව මෙම අයදුම්පත ගොනුකර ඇත. අභියාචනාධිකරණය විසින් මෙම නඩුව ඉවතලනු ලැබූ අතර දැන් ඉහත නියෝගය අවලංගු කිරීම සඳහා පෙත්සම්කරු විසින් මෙම අයදුම්පත ගොනුකර ඇත.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
3	S.C. Appeal 111/2020 [S.C. (SPL) LA 126/2019]	ශ්‍රේෂ්ඨාධිකරණය	මණ්ඩලය හා තවත් 01 අයෙකුට එදිරිව වන සංරක්ෂක ජනරාල්වරයා හා තවත් 04 දෙනෙක්	CA/Writ/49/2016 දරන අභියාචනාධිකරණ තීරණයට එරෙහිව වන සංරක්ෂක ජනරාල්වරයා විසින් ගොනු කරන ලද අභියාචනයකි.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
4	S.C. (SPL) L.A. 232/2019	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 06 දෙනෙකුට එදිරිව උපාලි ආනන්ද ගුණසිංහ.	ටෙන්ඩර කැඳවීමක් සිදු නොකර කොග්ගල අපනයන සැකසුම් කලාපයේ ආපන ශාලාවක් ඉදිකිරීම සඳහා ලබාදුන් අනුමැතිය ඉවත්කර ගැනීමට එරෙහිව නඩු අංක CA/WRIT/455/2015 සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් 2019.05.22 දින ලබාදුන් විනිශ්චය අවලංගු කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද අභියාචනයකි.	කොග්ගල සේවා ප්‍රදේශයේ පිහිටි ප්‍රමාණය පර්චස් 20 ක් වන ඉඩම් කට්ටි අංක 7 සම්බන්ධයෙන් බදු ගිවිසුම ක්‍රියාත්මක කිරීම.	___

5	S.C. (SPL) L.A. 297/2019	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 08 දෙනෙකුට එදිරිව එච්.වී.ඒ. ෆාම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	නඩු අංක CA (Writ) 469/2015 සම්බන්ධයෙන් 2019.07.02 දිනැති අභියාචනාධිකරණය තීන්දුව අවලංගු කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණට අභියාචනා කිරීමට විශේෂ නිවාඩු සහ අභියාචනාධිකරණයේ ගොනු කළ CA (Writ) 469/2015 සංශෝධිත පෙත්සමෙහි දක්වා ඇති කරුණු සඳහා Writ of Mandamus, Writ of Certiorari, Writ of Prohibition සහ අන්තර්වාර නියෝගයක් නිකුත් කිරීම.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
6	S.C. (Writ) 06/2021 (Connected with S.C. Writ 07-2021)	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 14 දෙනෙකුට එදිරිව ඒ.එම්.එස්. ප්‍රනාන්දු සහ තවත් 13 දෙනෙක්	අංක 2248/44 දරන ගැසට් නිවේදනයේ ඇතුළත් තීරණය සහ එහි ඇතුළත් අනෙකුත් සහන නිශ්ප්‍රභා කිරීම සඳහා රිට් අංඥාවක්. මෙහිදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පාර්ශවයක් ලෙස නම් කර ඇත්තේ ඒසියන් ලොජිස්ටික්ස් පාක් (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ ගිවිසුමකට එළඹ ඇති බැවින් පමණි.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
7	S.C. (FRA) 346/2021 (Connected with S.C. Writ 07-2021)	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 14 දෙනෙකුට එදිරිව ඒ.එම්.එස්. ප්‍රනාන්දු සහ තවත් 13 දෙනෙක්	අංක 2248/44 දරන ගැසට් නිවේදනයේ ඇතුලත් තීරණය සහ එහි ඇතුලත් අනෙකුත් සහන අවලංගු කිරීම සඳහා වන රිට් පෙත්සමකි. ආයෝජන මණ්ඩලය පාර්ශවකරුවෙකු ලෙස නම්කර ඇත්තේ එය ලොජිස්ටික්ස් පාක් (ප්‍රයිවට්) ලිමිටඩ් සමග ගිවිසුමකට ඇතුලත්ව ඇති බැවින් පමණී.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
8	S.C. (FRA) 71/2022	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 03 දෙනෙකුට එදිරිව බී.ඒ. මනිලාල්	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1) (උ) වගන්තිය යටතේ මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇතැයි පවසමින් ව්‍යවස්ථාවේ 126(2) වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලයේ පෙර සේවකයකු විසින් ගොනුකරන ලද මූලික අයිතිවාසිකම් නඩුව.	ආයෝජන මණ්ඩලයේ සේවකයෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන) ලෙස නැවත සේවයේ පිහිටුවීම සහ සාධාරණ වන්දියක්	සාධාරණ වන්දියක් ලබාගැනීම
9	SC (FRA) No. 236/2022	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 05 දෙනෙකුට එදිරිව තුෂාර සිසිර කුමාර	ගිනි නිවීමේ නිලධාරීන් ඊළඟ මට්ටමට උසස් කිරීමේදී අසාධාරණ ලෙස සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2), සහ 14(1) (උ) වගන්ති යටතේ පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ලෙස එස උසස්වීම් සිදුකරන ලද බවට චෝදනා කරමින් ආයෝජන මණ්ඩලයේ ගිනි නිවීමේ සේවකයෙකු වන (II ශ්‍රේණිය) ටී.එස්. කුමාර (පෙත්සම්කරු) විසින් ආයෝජන මණ්ඩලයට සහ එහි සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ විධායක අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) ඇතුළුව 5 දෙනෙකුට එරෙහිව ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් නඩුවකි.	පෙත්සම්කරු විසින් වගඋත්තරකරුවන්ට එදිරිව පහත සඳහන් සහන අපේක්ෂා කෙරේ. 1. මූලික අයිතිවාසිකම් අයදුම්පත සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පෙත්සමකරුට නිවාඩු ලබාදීම. 2. පෙත්සම්කරු 2022/06/04 දින සිට බලපැවැත්වෙන පරිදි ගිනි නිවීමේ නිලධාරි JM 1 II ශ්‍රේණියට උසස් කරන ලෙස සියළු වගඋත්තරකරුවන්ට උපදෙස් දෙමින් නියෝගයක් නිකුත් කිරීම. 3. 2022/06/04 දින සිට බලපැවැත්වෙන පරිදි ගිනි නිවීමේ නිලධාරි JM 1 II ශ්‍රේණියට අදාල වැටුප ගෙවීමට වගඋත්තරකරුවන්ට උපදෙස් දෙමින් නියෝගයක් නිකුත් කිරීම.	පසුගිය වැටුප් ලබාගැනීම
10	S.C. (CHC) No. 20/2021	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 02 දෙනෙකුට එදිරිව ස්ටාර් ක්ලෝදින් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්	අංක CHC 36/2012 හා 2020/09/18 දිනැති වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුවට එරෙහිව ස්ටාර් ක්ලෝදින් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකරන ලද අභියාචනයකි.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___

11	SC (SPL) LA No. 146/2023	ශ්‍රේෂ්ඨාධිකරණය	මිලියන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්ට එදිරිව ආයෝජන මණ්ඩලය	අපරාධ අභියාචනයේ අවසන් තීරණය බලා නොසිට එකී RII නඩුව විමසිය හැකි බව දක්වා 2023.05.18 දිනැති අංක RII 08/2016 දරන අභියාචනාධිකරණයේ නියෝගයට එදිරිව ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අභියාචනයකි.	අයිතම අංක 27 යටතේ සහනයක් අපේක්ෂා කරනු ලැබීය.	අයිතම අංක 27 යටතේ සහනයක් අපේක්ෂා කරනු ලැබීය.
12	SC Appeal 59/2017	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 04 දෙනෙකුට එදිරිව සිංහරාජ ප්ලාන්ටේෂන් ඕගනික් (ප්‍රයිවට්) ලිමිටඩ්	මෙම අයදුම්පත සඳහා පාදක වූ කරුණ වන ඉඩම පවරා ගැනීම සඳහා පෙත්සම්කරුගෙන් ලබාගත් අත්තිකාරම් මුදල් ආපසු ගෙවන ලෙස 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් නියම කළ තීරණය/ හෝ නියමය නිශ්ප්‍රභා කිරීම සඳහා Writs of Certiorari මගින් ඉහත නම සඳහන් පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියේ අදාල විධිවිධාන සහ අදාල චක්‍රලේඛ වලට පටහැනිව එකී ඉඩම පවරා ගැනීමේ පෙත්සම්කරුගේ නෛතික අපේක්ෂාව උල්ලංඝනය කිරීම සහ එකී ඉඩමේ තවත් කොටසක් ශ්‍රී බෝධිරාජ පදනමට ලබාදුන් හිමිකම් සහතිකය නිශ්ප්‍රභා කිරීම සඳහා පෙත්සම්කරු විසින් ගොනු කරන ලද අභියාචනයකි.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
13	S.C. (SPL) LA 188/2023	ශ්‍රේෂ්ඨාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 07 දෙනෙකුට එදිරිව ඒස් හෙල්ත්කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්	2023.05.30 දිනැති අංක WRT 171/2022 දරන අභියාචනාධිකරණ නඩුවේ තීරණයට එදිරිව ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අභියාචනයකි.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
14	C.A. (RII) 08/2016	අභියාචනාධිකරණය	මිලියන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්ට එදිරිව ආයෝජන මණ්ඩලය	ආයෝජන මණ්ඩල ගිණුම් මගින් එයට අයත් රු.මිලි. 102 පමණ වන මුදල් ආපසු ලබාගැනීම සඳහා HC/ARB/1254/02 නඩු තීන්දුව මගින් ප්‍රකාශයට පත්කිරීමට පෙර තිබූ තත්වය ආපසු ලබාගැනීම සඳහා (Restitutio-in-Integrum)	ආයෝජන මණ්ඩලය විසින් මෙම නඩුව ගොනු කරන ලද අතර ආයෝජන මණ්ඩලයට එදිරිව කුට බේරුම්කරය බලාත්මක කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ ගිණුම මගින් වාණිජ මහාධිකරණය විසින් රඳවා ගනු ලැබූ රු. 102,138,350 ක මුදල නැවත ලබාගැනීම ආයෝජන මණ්ඩලයේ අපේක්ෂාවයි.	අයිතම අංක 27 යටතේ සහනයක් අපේක්ෂා කරනු ලැබීය.
15	C.A (Writ) 465/2015	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 02 නෙකුට එදිරිව එඩ්නා කොකෝවා ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දේශීය වෙළඳපොලේ සිය භාණ්ඩ බෙදාහැරීම මගින් පැන නැගී ඇති ගැටළුව පිළිබඳව ශ්‍රී ලංකා රේගුවට එරෙහිව රිට් ආඥාවක් ලබාගැනීම.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
16	C.A. (Writ) 386/2016	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 02 දෙනෙකුට එදිරිව ආසිරි ශල්‍ය රෝහල පීඑල්සී	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (පළමු වගඋත්තරකරු) විසින් ගනු ලැබූ තීරණ කීපයකට එදිරිව සහන ලබාගැනීම සඳහා හා පෙත්සම්කරු විසින් 2005/2006 සිට 2013/2014 දක්වා ඇගයුම් වසරවල ආදායම් බදු ගෙවීම පැහැර හැර ඇති පදනමක පෙත්සම්කරුගෙන් යම් මුදලක් අයකර ගැනීම වළකාලමින් අන්තර්වාර නියෝගයක් සඳහා ආසිරි ශල්‍ය රෝහල පුද්ගලික සමාගම විසින් ආයෝජන මණ්ඩලය හා තවත් දෙදෙනෙකුට එදිරිව නඩුවක් ගොනුකරනු ලැබීය.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___

17	C.A. (Writ) 307/2008	අභියාචනාධිකරණය	රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හා තවත් 03 දෙනෙකුට එදිරිව එම්ටීවී නාලිකාව (පුද්) සමාගම	රේගු විමර්ශන අංක CIB/INV/25/2007/CIB/1523 සම්බන්ධයෙන් රිට් අයදුම්පතක්	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
18	C.A. (Writ) 95/2021	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 13 දෙනෙකුට එදිරිව සිමෙට් (ප්‍රයිවට්) ලිමිටඩ්	අගය එකතු කරන ලද තඹ වයර්, තඹ තහඩු අපනයනය සඳහා කර්මාන්ත අමාත්‍යාංශය හා වෙනත් වගඋත්තරකරුවන්ගෙන් අවසර පත්‍රයක් හෝ වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම සඳහා පෙත්සම්කරුවන් විසින් මූලිකව මෙම කරුණ ගොනු කෙරේ.	මේ වනවිට නිෂ්පාදනය කර ඇති ඉතිරි තඹ තහඩු ප්‍රමාණය අපනයනය කිරීම සඳහා පෙත්සම්කරුවන් විසින් කර්මාන්ත අමාත්‍යාංශයේ, ආයෝජන මණ්ඩලයේ හා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අවසරය අපේක්ෂා කෙරේ.	___
19	C.A. (Writ) 349/2020	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 07 දෙනෙකුට එදිරිව සෙන්ටර් ෆෝ එන්වයර්මන්ට් ජස්ටිස් (ගැරන්ටී ලිමිටඩ්)	1 සිට 7 වන වගඋත්තරකරුවන් විසින් ගනු ලැබූ තීරණයන්ට එරෙහිව writs mandamus, certiorari ලබාදීම සහ ආයෝජන මණ්ඩලය විසින් ටීපේ ලංකා පීඑල්සී ට නිකුත් කරන ලද අනුමැතිය අවලංගු කරමින් writ of certiorari ලබාදීම. ටීපේ ලංකා පීඑල්සී විසින් පෙත්සම සඳහා මැදිහත්වීම සඳහා අභියාචනාධිකරණයට අයදුම්පතක් යොමුකර ඇති අතර මෙම කරුණ මැදිහත් පෙත්සම්කරු විසින් සහයදීම සඳහා නියමකර ඇත.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
20	C.A. (Writ) 269/2021	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 03 දෙනෙකුට එදිරිව එකෝ හෝම්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	එකෝ හෝම්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පැවරුම්කරය අවලංගු කිරීම සහ නාරාහේන්පිට කිරිමණ්ඩල මාවතේ පිහිටි ඔවුන්ගේ ව්‍යාපෘති ස්ථානය සඳහා කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර නගර සභාව විසින් නිකුත් කළ සංවර්ධන බලපත්‍රය අවලංගු කිරීම අභියෝගයට ලක්කරමින් ආයෝජන මණ්ඩලයට හා තවත් 03 දෙනෙකුට එදිරිව රිට් අයදුම්පතක් ගොනුකර ඇත.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
21	C.A. (Writ) 274/2021	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 08 දෙනෙකුට එදිරිව සීටි කැළණි හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	පෙත්සම්කරු විසින් ෆෙරෙන්ටිනෝ ටයර් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ලබාදුන්/ ලබාදීමට උත්සහ කරන ලද සහනය සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලයට එදිරිව මෙම රිට් අයදුම්පත ගොනුකර ඇත.	ගිවිසුමෙහි සඳහන් පරිදි සමාගම අපනයනය කරන ප්‍රමාණයෙන් 20% ක් පමණක් දේශීය වෙළඳපලේ විකිණීමටත් එහි නිෂ්පාදනයෙන් 80% ක් අපනයනය කරන ලෙසටත් ආයෝජන මණ්ඩලය මගින් සමාගමට ලිඛිතව උපදෙස් ලබාදෙන ලෙසත් නියමකර Writ of Mandamus නිකුත් කරන ලෙස සහ ආයෝජන මණ්ඩලය විසින් මුළු අපනයනයෙන් 80% ක් අපනයනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය වෙනස් කිරීම හෝ ඉවත් කිරීම වළක්වමින් Writ of Prohibition නිකුත් කරන ලෙසත්, ඔවුන් එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, ලබාදී ඇති සියලු සහන ඉවත් කරන ලෙසත් පෙත්සම්කරු විසින් සිය රිට් අයදුම්පත මගින් ඉල්ලා සිටී.	___

22	C.A. (Writ) 642/2021	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය සහ තවත් 04 දෙනෙකුට එරෙහිව WMPH හෝල්ඩින්ග්ස් ඉන්කෝපරේෂන් සහ තවත් 02 දෙනෙක්	WMPH හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් රිට් අයදුම්පතක් ගොනුකර ඇති අතර ආයෝජන මණ්ඩලය ව්‍යාපෘතිය සඳහා අනුමත කිරීමේ ලිපිය නිකුත් කර ඇති බැවින් ආයෝජන මණ්ඩලය වගඋත්තරකරුවකු කර ඇත. ආයෝජන මණ්ඩලය සහ සමාගම අතර ගිවිසුමක් අත්සන් කර නොමැත.	වගඋත්තරකරුවන්ට එදිරිව Writs of certiorari සහ writ of mandamus	___
23	C.A. (Writ) 239/2022	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 07 දෙනෙකුට එදිරිව ඒස් හෙල්ත්කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්	රේගු දෙපාර්තමේන්තුව විසින් සිය භාණ්ඩ තොග රඳවාගෙන ඇති බැවින් ඒස් හෙල්ත්කෙයා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට, ආයෝජන මණ්ඩලයට හා තවත් 06 දෙනෙකුට එදිරිව අභියාචනාධිකරණයේ මෙම නඩුව ගොනුකරන ලදී.	ආයෝජන මණ්ඩලයෙන් හිමිකම් ඉල්ලීමක් නැත.	___
24	C.A. (Writ) 39/2023	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය සහ තවත් 12 දෙනෙකුට එරෙහිව ඩබ්.ටී.යූ. ප්‍රියන්ත	ටාරික් කුරෙයිෂි (5වන වගඋත්තරකරු) විසින් ඉඩමේ සත්‍ය හිමිකම නොපෙන්වා බීජ අර්තාපල් වගා කිරීම සඳහා අදාල ඉඩම ඔහුට නැවත බදු දුන් ඉඩමෙන් ඉවත් වන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා (පළමු වගඋත්තරකරු) විසින් නිකුත් කළ ඉවත් වීමේ දැන්වීමට සහ ෆොරස්ට් ග්ලෙන් හොටේල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එල්ක් ප්ලේන් ෆාම් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයෝජන මණ්ඩල ව්‍යාපෘති 2 (ආයෝජන මණ්ඩලය විසින් දැන් මෙම ගිවිසුම අවසන්කර ඇත) සඳහා රජය විසින් නිකුත් කරන ලද බලපත්‍රය යටතේ 5 වන වගඋත්තරකරු එම ඉඩමේ සන්තකය ලබාගෙන තිබූ බවට එරෙහිව අයදුම්කරු විසින් මෙම රිට් අයදුම්පත ගොනු කර ඇත.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	___
25	C.A. (Writ) 428/2022	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය සහ තවත් 03 දෙනෙකුට එරෙහිව හොරණ ප්ලාන්ටේෂන් පීඑල්සී	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියේ 27(1) වගන්තිය යටතේ පෙත්සම්කරුට හිමිව ඇති බලතල අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට එකී වත්ත සඳහා වන හිමිකාරිත්වය අහිමිවන බැවින් එවිට නියුවටෙල් වත්තේ යම් කොටසකට හිමිකම් කීමේ අයිතියක් නොමැති අතර එහි හිමිකම දැන් රාජ්‍ය වැවිලි සංස්ථාව දරන බැවින්, පෙත්සම්කරුට, පළමු වගඋත්තරකරු වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට (LRC), 2 වන වගඋත්තරකරු වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට නියුවටෙල් වත්තේ යම් කොටසක් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් තහනම් කරමින් හිමිකමක් සහ/හෝ, 2වන වගඋත්තරකරු වන ආයෝජන මණ්ඩලයට සහ/හෝ 3 වන වගඋත්තරකරු වන මිල්ලනිය ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පළමු වගඋත්තරකරු වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට යම් වන්දියක් ගෙවීම මඟින් නියුවටෙල් වත්තේ යම් කොටසක් අත්පත් කර ගැනීම තහනම් කරමින් Writ of Prohibition ලබාගැනීම සම්බන්ධයෙන් රිට් ආඥාවක් ආකාරයෙන් මැන්ඩේටයක් ලබාගැනීමේ නෛතික හිමිකම ඇත.	1. පළමු වගඋත්තරකරුට (LRC) සහ එහි සියළු නිලධාරීන්ට 2 වන වගඋත්තරකරුගෙන් (BOI) සහ/ හෝ 3 වන වගඋත්තරකරුගෙන් (මිල්ලනිය ප්‍රාදේශීය ලේකම්වරයා) නියුවටෙල් වත්තේ යම් කොටසක් අත්පත් කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු යම් වන්දියක් ඉල්ලා සිටීම සහ/හෝ ලබාගැනීම තහනම් කිරීමේ රිට් ආඥාවක් ආකාරයෙන් මැන්ඩේටයක් ප්‍රදානය කිරීම සහ නිකුත් කිරීම සඳහා. 2. 2 වන වගඋත්තරකරු (BOI) සහ 3 වන වගඋත්තරකරු (මිල්ලනිය ප්‍රාදේශීය ලේකම්වරයා) විසින් 1 වන වගඋත්තරකරුට (LRC) නියුවටෙල් වත්තේ යම් කොටසක් අත්පත් කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු යම් වන්දියක් ගෙවීම සම්බන්ධයෙන් තහනම් කිරීමේ රිට් ආඥාවක් ආකාරයෙන් මැන්ඩේටයක් ප්‍රදානය කිරීම සහ නිකුත් කිරීම සඳහා.	___

26	C.A. (Writ) 655/2023	අභියාචනාධිකරණය	ආයෝජන මණ්ඩලය සහ තවත් 08 දෙනෙකුට එරෙහිව කේ.ඩබ්. ගුණවර්ධන සහ තවත් 03 දෙනෙක්	ඉහත අයදුම්පත් සඳහා වන පෙත්සම්කරුවන් ආයෝජන කලාපවල පිහිටි කර්මාන්ත ඇතුළුව විවිධ සමාගම් සඳහා සේවාවන් සැපයීමේ නිරතවූවන් වන අතර 2023 ඔක්තෝබර් 30 දිනැති පෙත්සමට "P21", "P22" සහ "P23" ලෙස අමුණා ඇති ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ (6 වන වගඋත්තරකරු) පෞද්ගලික ලේකම්වරයා වන වයි.ඒ. නයන උදයප්‍රිය කුමාර විසින් නව යාන්ත්‍රණයක් යටතේ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2023.07.07, 2023.07.26 සහ 2023.09.27 චක්‍රලේඛ/ ලිපිවල නීත්‍යානුකූලභාවය පිළිබඳව චෝදනා ඉදිරිපත් කරමින් ඉහත රිට් අයදුම්පත ගොනුකර ඇත.	ආයෝජන මණ්ඩලයෙන් සහනයක් අපේක්ෂා නොකෙරේ.	____
27	H.C. (ARB) 1254/2002	වාණිජ මහාධිකරණය	ආයෝජන මණ්ඩලයට එදිරිව මිලියන් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	මිලියන් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් රු. 37,200,000 ක මුදලක් ගෙවීම සඳහා වන බෙරුම්කර නියෝගය බලාත්මක කිරීම සඳහා ආයෝජන මණ්ඩලයට එදිරිව බලාත්මක කිරීමේ ක්‍රියාවක් ගොනුකර ඇත.	රු.37,200,000 + පොලිය	102,138,350
28	HC Civil 54/2014 CO	වාණිජ මහාධිකරණය	රුසිරුමල් (ප්‍රයිවට්) ලිමිටඩ් (ඇවරකිරීම)	ඇවරකරු විසින් ඉදිරිපත් කරන ලද 2018.03.27 දිනැති හිමිකම් ඉල්ලීම අනුව ඇවරකරන සමාගම විසින් විසින් ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු මුදල වන රු. 3,115,865.32 ක් ගෙවා ඇත. ජල බිල් සඳහා තවත් රු. 6,101,702.00 ක මුදලක් තවමත් ගෙවිය යුතුව ඇත.	ජල බිල් සඳහා ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු මුදල	6,101,702
29	CHC 73/2021 CO	වාණිජ මහාධිකරණය	ආයෝජන මණ්ඩලය හා තවත් 06 දෙනෙකුට එදිරිව පෝල් ඇන්ඩ්‍රෑ ඩ්‍රෝයර්	සමාගමේ දෙවන අධ්‍යක්ෂවරයාට එදිරි නඩුව	හිමිකම් ඉල්ලීමක් නැත.	____
30	CHC 664/2019 MR	වාණිජ මහාධිකරණය	අයි.පී. සිරිතිලක	තමාට රු.මිලි 50ක පාඩුවක් සිදුව ඇතැයි පවසමින් වතුපිටිවල අපනයන සැකසුම කලාපයේ ප්‍රදිංචිව සිටි පුද්ගලයෙකු විසින් ඉන් ඉවත්වීමට පෙර මෙම නඩුව ගොනුකර ඇත.	එකී පාඩුව සඳහා වන්දි වශයෙන් රු.50,000,000/	50,000,000
31	D.C. Colombo DMR 02244/2015	දිස්ත්‍රික් උසාවිය	ස්ටාර්ලින් ගෘප් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	ආයෝජන මණ්ඩලය විසින් රඳවාගෙන ඇති රු. 18,285,800 ක මුදල නිදහස් කරන ලෙස සහ එකී මුදල කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරන ලද පරිදි සේවකයින් සඳහා ගෙවිය යුතු සේවක පර්යන්ත ප්‍රතිලාභ (වන්දි) මුදලක් බවට උපදෙස් දෙමින් ආයෝජන මණ්ඩලයට නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා ස්ටාර්ලින් ගෘප් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මෙම ක්‍රියාමාර්ගය ගෙන ඇත.	ආයෝජන මණ්ඩලය විසින් රඳවාගෙන ඇති රු. 18,285,800 ක මුදල නිදහස් කරන ලෙස සහ එකී මුදල කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරන ලද පරිදි සේවකයින් සඳහා ගෙවිය යුතු සේවක පර්යන්ත ප්‍රතිලාභ (වන්දි) මුදලක් බවට උපදෙස් දෙමින් නියෝගයක් නිකුත් කිරීම සඳහා	18,285,800
32	D.C. Gampaha 2165/L	දිස්ත්‍රික් උසාවිය	ආයෝජන මණ්ඩලයට එදිරිව එම්.එම්.එම්. සමයිල්	ආරවුලට ලක්වූ ඉඩමේ පැමිණිලිකරුගේ අයිතිය සහ රජය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ එකී ඉඩම අත්පත් කරගෙන නොමැති බව ප්‍රකාශ කිරීම සඳහා. ඉඩම රජය විසින් අත්පත් කරගෙන පසුව ආයෝජන මණ්ඩලයට ලබාදුන් බවට ආයෝජන මණ්ඩලය සිය විත්තිවාචකය කර ඇත.	බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටි අක්කර 11 රූඩ් 2ක් වන ආයෝජන මණ්ඩලයට අයත් ඉඩමේ හිමිකම	____
